# රණවිරුවන් දිවි පුදා රැක ගත් මව්බිමට ආර්ථික සමෘද්ධිය ගෙන ඒම සඳහා වන උපාය මාර්ගික ප්‍රවේශය

2009 ජූලි මස 08 වන දින
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී
එළිදක්වන ලදී.

*ප්‍රකාශනය*

**මව්බිම ලංකා පදනම**
අංක ඒ 4, පෙරහැර මාවත,
කොළඹ 03.
දුරකථනය : 011 5 758558
ෆැක්ස් : 011 2 402093
Website : www.gannaapede.lk / www.gannaapede.com
E-mail : info@gannaapede.com

< 2 >

# අධ්‍යක්ෂ මණ්ඩල පූර්විකාව

වසර 30කට අධික කාලයක් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට එරෙහිව දැවැන්ත නිෂේධනාත්මක බලපෑම් ඇතිකල සහ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජන කොටස් දුකට පත්කළ බෙදුම්වාදී යුද්ධය සහමුලින්ම පරාජය කිරීමට ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවෝ සමත් වී සිටිති. මිලේච්ඡ ත්‍රස්තවාදයේ පරාජය සියළු ශ්‍රී ලාංකිකයින් එක සිතින් අපේක්ෂා කළ අතර උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාව නිදහස් කර ගැනීම සමස්ත ජාතියේම ජයග්‍රහණයක් ලෙස පොදු ජනතාව ආශ්වාදයෙන් සමරනු දැකිය හැකිය. ත්‍රස්තවාදීන් විසින් ප්‍රාණ ඇපයට තබාගෙන සිටි අහිංසක දෙමළ ජනතාව මුදා ගැනීමේ මෙහෙයුම ''ශ්‍රී ලංකාවට හැකිය'' යන්න ලෝකයා ඉදිරියේ ප්‍රදර්ශනය කල ඉතිහාසයේ විශිෂ්ටතම අවස්ථාවකි.

මව්බිම ලංකා පදනම විසින් ඉතිහාසයේ මෙම වකවානුව විග්‍රහ කරනු ලබන්නේ ජාතිය නව පුනරුදයකින් නැගී සිටීමට විලිරුදාවෙන් පෙළෙන අවස්ථාවක් ලෙසය. එබැවින් මෙම ස්වර්ණමය අවස්ථාව භාවිතා කොට ශ්‍රී ලාංකික ජාතියට ආර්ථික සමෘද්ධිය ගෙන ඒමට සහ ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළින්ම ඔසවා තැබීමට සමස්ත ජාතියම එකාවන්ව ක්‍රියාත්මක විය යුතු බව අපගේ විශ්වාසයය. පසුගිය වසර කිහිපයක කාලය තුළ මව්බිම ලංකා පදනම විසින් විවිධ සමාජ ස්තර තුළ ගොඩනැගූ ජාතික අර්ථික කතිකාවට අදාලව විශාල මහජන අවධානයක් දිනාගත හැකි විය. නමුත් ජාත්‍යන්තර ණය දෙන ආයතන විසින් තෝරා දෙන උපාය මාර්ගවල සිරවී සිටින රාජ්‍ය නිලධාරී තන්ත්‍රය තුළින් අප වෙත නිරන්තරව ලැබුණේ ''වෙනස් කරන්න බැහැ'', ''අපිට බැහැ'', ''ජාත්‍යන්තර යථාර්ථය පිළිගත යුතුය'' වැනි බැරිකමට අදාළ නිෂේධනාත්මක පිළිතුරු පමණි.

එවැනි තත්වයක් තුළ ආරම්භයේදීම ''බැරි දේ කළ හැකිය'', එසේ නැතහොත්, ''ශ්‍රී ලංකාවට හැකිය'' යන මතය තහවුරු කිරීමේ අභියෝගය අප ඉදිරියේ තිබෙන බව ඉතා පැහැදිලිය. ඒ නිසාම බැරි බව කියමින්ම වෙනස් වීමට සිදු වූ හැටි සහ දැනටමත් වෙනස් වෙමින් පවතින බව පෙන්වා දිය යුතුව ඇත. එවැනි වෙනස්කම් සැබෑ ලෙසම උපාය මාර්ගික වෙනස්කම් ලෙසට හඳුනාගත නොහැකි වුවත් ඒවා උපාය මාර්ගික වෙනසක් සඳහා අවශ්‍ය සුභ නිමිති ලෙස දැකිය හැකිය.

## පාන් පිටි පරිභෝජනය

අද වන විට ශ්‍රී ලංකාවේ පාන් පිටි හෙවත් තිරිඟු පිටි පරිභෝජනය 55% කින් අඩු වී ඇත. මෙය සිදු වේ යයි අවුරුදු කිහිපයකට පෙර කිසිවකු හිතුවේ නැත. එපමණක් නොව බොහෝ නිලධාරීන් තර්ක කලේ එසේ කළ නොහැකි බව සහ එසේ කිරීමට උත්සාහ කළහොත් අහස කඩා වැටෙනු ඇති බවය. අප රටේ දළ සාමාන්‍යයක් ලෙස මෙ.ටො. ලක්ෂ 07ක් පමණ වූ තිරිඟු පිටි පරිභෝජනය පසුගිය කාලයේදී මිලියන 1.3 දක්වා ඉහළ ගියේය. නමුත් අද වන විට අප පරිභෝජනය කරන්නේ මෙ.ටො. ලක්ෂ 03ක් පමණ ප්‍රමාණයක් බවට සාක්ෂි ඇත. එසේ වුවද ණයවර ලිපි නිකුත් කිරීමේදී මෙ.ටො.

මිලියන 01ක් ආනයනය කළ හැකි මුදලට සමාන විදේශ විනිමය ප්‍රමාණයක් රටින් පිටතට රැගෙන යාමට ඉඩ සැලසීම මඟින් පාන් පිටි පරිභෝජනය අඩු කිරීමේ වාසිය යම් පමණකට රටට අහිමි කෙරේ. ඊට අමතරව තිරිඟු ආනයනයට අදාළව වැරදි වාර්තා ඉදිරිපත් කිරීම මඟින් සිදු කෙරෙන බදු වංචා පිළිබඳව විශාල සමාජ කතිකාවතක්ද ගොඩ නැඟී ඇත. කෙසේ වෙතත් පාන් පිටි පරිභෝජනය තව දුරටත් අඩු කිරීම ඉතා පහසු කටයුත්තකි. අවශ්‍ය නම් පාන් කන ගමන්ම පාන් පිටි පරිභෝජනය අඩු කිරීම සඳහා සහල් පිටි වැඩි වශයෙන් යොදා ගත් පාන් සෑදීම ප්‍රචලිත කිරීම එතරම් අමාරු කටයුත්තක් නොවේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ සහල් සහ පාන් පිටි අතර අවශ්‍ය මිල වෙනස පවත්වා ගැනීම සඳහා අමතර ආනයන බද්දක් පැනවීම පමණි. මෙහිදී කිව යුත්තේ අඩු කිරීමට නොහැකි යයි කියූ පාන් පිටි පරිභෝජනය අප දැනටමත් අඩු කොට ඇති බවය. තව දුරටත් අවශ්‍ය වන්නේ ණයවර ලිපි මඟින් විදේශ විනිමය වංචා සහගතව පිටරටට ඇදී යාම සහ බදු වංචා වළක්වාගන්නා අතරතුර පරිභෝජනය ක්‍රමයෙන් අඩු කර ගැනීමය.

## බඩඉරිඟු ආනයනය

අවුරුදු 20කට වඩා වැඩි කාලයක් වසරකට බඩඉරිඟු මෙ.ටො. ලක්ෂ 2.5ක් පමණ අප රටට ආනයනය කර ඇත. නමුත් අද වන විට ආනයනය කරන බඩඉරිඟුවලට බදු පැනවීම මඟින් පමණක් වසරක කාලයක් තුළදී අප රටට අවශ්‍ය බඩ ඉරිඟු ප්‍රමාණය අප රටේම නිපදවා ගැනීමට හැකි විය. වෙළඳපොල අකාර්යක්ෂමතාව නිසා ගොවියාට නිෂ්පාදනය විකුණා ගැනීමේ ගැටළු මතුවීම වෙනම කාරණයකි. කෙසේ වෙතත් මේ වන විට බඩඉරිඟු ආනයනය සඳහා වැයකළ විදේශ විනිමය රට තුළ ඉතිරි කර ගැනීමටත් කෘෂිකර්මාන්තය ආශ්‍රිතව නව ආදායම් ඉපැයීමේ අවස්ථා නිර්මාණය කිරීමටත් හැකි වී ඇත. ඉදිරියේදී අවශ්‍ය වන්නේ බඩඉරිඟු වගාව නිසා දීර්ඝකාලීනව පසට සිදුවන විනාශය වළක්වාගන්නා ආකාරයට ක්‍රමවේද හඳුන්වා දීම, දේශීයව බීජ නිෂ්පාදනය දියුණු කිරීම සහ වෙළඳපොල ගැටළුවලට පිළිතුරු සොයා ගැනීමේ අභියෝග ජය ගැනීමයි.

## කිරි නිෂ්පාදනය

ශ්‍රී ලංකාවට වසරකට පිටි කිරි මෙ.ටො. 60,000ක් පමණ ආනයනය කරන අතර ඒ සඳහා රු. මිලියන 30,000ක පමණ විදේශ විනිමයක් වැය කිරීමට සිදු වේ. නවසීලන්තයෙන් පමණක් මෙ.ටො. 40,000ක් ආනයනය කරන අතර ඒ සඳහා අපට එක් නවසීලන්ත ජාතිකයකුට ඩොලර් 200 බැගින් වන මුදලක් වැය කිරීමට සිදු වේ. නමුත්, අපට අවශ්‍ය කිරි ප්‍රමාණයෙන් 100%ක්ම අප රටේ නිපදවීමට අවශ්‍ය විභවය අප සතුව ඇත. 2007 වසරේදී ජාතික කිරි නිෂ්පාදනය 15%ක් පමණ වූ අතර එම කාලය තුළ කොතරම් අඩු පාඩු සහිතව වුවද රජය විසින් කරන ලද මැදිහත්වීම් නිසා සහ වෙළඳපොල තුළ සිදුවූ වෙනස්කම් නිසා 2008 වන විට ජාතික කිරි නිෂ්පාදනය 35% දක්වා වැඩි වී ඇත. එළදෙනුන් මැරීම වැළැක්වීම සඳහා ගන්නා ලද පියවර ඊට බෙහෙවින් හේතු වූ බවටද සැකයක් නැත.

අද අප රටේ සමස්ත ගවගහනය ලක්ෂ 15ක් පමණ වන අතර (එම ප්‍රමාණය පසුගිය වසර 15ක් පමණ කාලය තුළ වෙනස් නොවී පැවතීමේ ගැටළුව එසේම තිබියදීම) කිරි දොවා ගන්නේ එයින් දෙලක්ෂ පනස් දහසක් පමණ වන දෙනුන්ගෙනි. අපගේ ජාතික ගව රැළ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව ඉහළ දැමීම සඳහා අවශ්‍ය අභිජනන වැඩසටහනට රජය පැහැදිලිව මැදිහත් වන්නේ නම් සහ එළදෙනුන් මැරීම වැළැක්වීම සඳහා ස්ථිරසාර දැඩි ක්‍රියාමාර්ග ගන්නේ නම් වසර 5කින් අප රට කිරිවලින් ස්වයංපෝෂිත කිරීම සිහිනයක් නොවේ. ඒ සඳහා වෙළඳපොල තුළ පැහැදිලි තීරණාත්මක වෙනස්කම් ප්‍රමාණයක්ද සිදු කළ යුතුය.

එයින් පළමුවැන්න දැනට කරගෙන යන දියර කිරි ප්‍රචලිත කිරීමේ වැඩසටහන තවදුරටත් කාර්යක්ෂමව

ඉදිරියට ගෙන යාමය. දෙවැන්න පිටිකිරි අත්‍යවශ්‍ය ආහාර ලයිස්තුවෙන් ඉවත් කොට ආනයනය කරන පිටිකිරි වලට ලබා දෙන සියලු බදු සහන අහෝසි කිරීමය. තුන්වැන්න භූගෝලීය කලාප ආවරණය වන ලෙස රාජ්‍ය සහ පෞද්ගලික මැදිහත්වීම් යටතේ කිරි මිලදී ගැනීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සහ ප්‍රාදේශීයව කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත පද්ධතියක් ඇතිකිරීමය. (අනුරාධපුර සිට අඹේවෙලට කිරි ප්‍රවාහනය කරන අකාර්යක්ෂම වෙළඳපොල වෙනස් විය යුතු වේ.) ඉදිරියේදී සිදුවිය යුතු මහා වෙනස කිරීමට අවශ්‍ය මූලික පසුබිම අද ගොඩනැඟී ඇති බව ඉතා පැහැදිලිව පෙනෙන්නට ඇත. ඒ නිසා කිසිවෙකුට ''බැහැ'' කියන්නට හේතුවක් නැත.

## ටින් මාළු ආනයනය

ශ්‍රී ලංකාවට වසරකට ටින් මාළු මෙ.ටො. 60,000 ක් පමණ ආනයනය කරන නමුත් ඒ අතරතුරම අප රටට අයත් මුහුදු සීමාව මුහුදු සැතපුම් 200කින් වැඩි වී ඇත. මේ පරස්පරය තේරුම් ගන්නේ කෙසේද? ස්වාභාවිකව අපට උරුමව ඇති අති මහත් වූ සාගර සම්පතට අමතරව ලෝකයේ විශාලතම මිරිදිය ජලාශ ඝණත්වය සහිත රට ලෙස අප දිනාගෙන ඇති උරුමයටද ජාතියක් ලෙස අප සාධාරණය ඉටු නොකරන බව කුඩා දරුවකුට වුවද තේරුම්ගත හැක.

අප සතු මත්ස්‍ය සම්පත් විභවයෙන් උපරිම ප්‍රතිඵල නෙළා ගැනීමට අවශ්‍ය වන්නේ අවම වශයෙන් මාළු මෙ.ටො. 500ක් සඳහා ශීතාගාර පහසුකම් සහිත නැව් 10ක් පමණි. වසර 10කට අඩු කාලයක් භාවිතා කළ එවැනි නැවක් මිලදී ගැනීමට වැයවන්නේ බී.එම්.ඩබ්ලිව්. කාර් 3ක් මිලදී ගැනීමට වැයවන මුදලකි. එනම් දළ වශයෙන් රු. මිලියන 50-60 ක් අතර පමණ මුදලකි. අප විසින් කල යුතු දේ අප නොකරන බැවින් අපගේ මුහුදු තීරයේ විදේශීය නැව් 30-50ත් අතර ප්‍රමාණයක් වර්ෂය පුරා රටට අයත් මත්ස්‍ය සම්පත සූරා ගනී. මෙවැනි තත්වයක් තුළ තවදුරටත් ''අපට බැහැ'' කියමින් බලා සිටින්නට අයිතිය ඇත්තේ කාටද?

## හම්බන්තොට වරාය

දැනට ඉදිකරමින් පවතින හම්බන්තොට වරාය 1996 දී යෝජනා වුවද වසර 12කට පසුව හෝ එය ඉදි කිරීම ආරම්භ කිරීම පිළිබඳව අප ජාතියක් ලෙස ආඩම්බර විය යුතුය. මෙම වරාය ලෝකයේ නැව් බඩු ප්‍රවාහනයේ ආසියාවේ ප්‍රධානතම ස්ථානය බවට පත්වනු නොඅනුමානය. ඒ සඳහා අප රටේ දකුණු කලාපය සූදානම් කළ යුතුය. ලෝකයේ ඉදිරි කාලයේ නිපදවන ඕනෑම විශාල නැවක් ගෙන ඒමට හැකි විභවතාව මෙන්ම අනාගත සංවර්ධනය සඳහා වරාය ආශ්‍රිතව ගොඩබිමෙන් අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සහිත ලෝකයේ එකම වරාය බවට පත්වන්නේ මෙම වරායයි. එනිසාම මෙම වරාය සංවර්ධන සැලසුම අවම වශයෙන් වසර 50ක ඉදිරි කාලයක් ගැන සිතා සකස් කළ යුතුව ඇත. වරාය සංවර්ධනය පොදු ජාතික සංවර්ධනයෙන් වියුක්තව සැලසුම් කෙරෙන්නක් නොවිය යුතුය. මේවා පිළිබඳව අප රටේ විද්වත් සංවාදයක් ගොඩනැඟී නොමැති වීම කනගාටුදායකය. කෙසේ වෙතත්, කිව යුත්තේ අද අප කරන දේ වසර 12කට පෙර ආරම්භ කළා නම් මේ වන විට අපට ගෙවුම් ශේෂ හිඟය පියවීමට විදේශීය ණය දෙන ආයතනවලට පින්සෙන්ඩු වීමට සිදු නොවනු ඇති  බවය.

## උක්වගාව, එතනෝල් සහ කිරි ගොවිතැන

අප රටේ උක් වගාව පිළිබඳව මහජන විශ්වාසය බිඳ වැටී ඇත. එයට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ රටේ ආරම්භ කළ සීනි කර්මාන්ත වලින් වැඩි ප්‍රමාණය බිඳ වැටීම සහ නව කර්මාන්ත ඇති කිරීමේ යෝජනාවලදී වටිනා ස්වාභාවික වනාන්තර එළිපෙහෙළි කිරීමට යෝජනා කිරීමයි. නමුත්, දැනට හොඳින් ක්‍රියාත්මක වන පැලවත්ත සීනි සමාගම රටට වටිනා ආර්ථික මොඩලයක් හඳුන්වා දෙමින් ඇත.

එනම් සීනි නිපදවීම සහ එහි අතුරුඵල ලෙස එතනෝල්, විදුලිය නිපදවීම, සහ එම විදුලිය සහ අනෙකුත් අතුරු නිෂ්පාදන යොදාගනිමින් සත්ව ආහාර නිපදවීම තුළින් කිරි ගොවිතැන සංවර්ධනය කිරීම, ඒ සියල්ල උපයෝගී කොට ගනිමින් කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය (පිටි කිරි, යෝගට් සහ සකස් කළ දියර කිරි) දියුණු කිරීමය. අවසානයේ සමස්ත භූමිය තුළ පරිසර හිතවාදී බෝග වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම, සහ ඒ සමස්තයේ වාසිය ප්‍රයෝජනයට ගෙන පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීමද ඊට අයත් වේ. ඇත්ත වශයෙන්ම ඒ සියල්ලට අමතරව අප රටට අවශ්‍ය පෙට්‍රල් ප්‍රමාණයට සමාන එතනෝල් නිපදවීම සඳහා රටටම අවශ්‍ය වන්නේ හෙක්ටයාර 65,000ක භූමි භාගයක් සහ සීනි කර්මාන්ත ශාලා 5ක් හොඳින් ක්‍රියාත්මක වීම පමණි. ඒ සඳහා නැවුම් වනාන්තර විනාශ කිරීමේ අවශ්‍යතාවයක් නැත. එමෙන්ම පිටිකිරි ආනයනය කිරීමේදී එක් වර්ෂයකට රජය ලබා දෙන බදු සහනය අහෝසි කළහොත් එම මුදලින් නවීන සීනි කර්මාන්ත ශාලා 03ක් ආරම්භ කළ හැක.

## වී ගොවිතැන

වී ගොවිතැන හෙළා දකිමින් කුඹුරු ගොඩකර වෙළඳාම දියුණු කිරීම සඳහා නගර සංවර්ධනය කළ යුතු යයි කියූ යුගයක් මේ රටේ විය. නමුත් පසුගිය කාලයේදී වී වගාව බේරා ගැනීම සඳහා රජය දැනුවත්ව සහ නොදැනුවත්ව ගන්නා ලද බොහෝ ක්‍රියාමාර්ග හේතුවෙන් වී වගාවට යම් ගෞරවයක් සහ ප්‍රමුඛතාවක් හිමි වූ බව රහසක් නොවේ. ඒ නිසාම පසුගිය කාලයේදී පුරන් කුඹුරු විශාල වශයෙන් නැවත අස්වැද්දවීමේ ප්‍රමුඛතාවක් ඇති වූ බවද අප පිළිගත යුතුය. විවෘත ආර්ථිකය යටතේ සහල්වලට පාලන මිලක් ඉදිරිපත් කළ නොහැකි යයි සමහර ඊනියා විද්වතුන් ඉර හඳ යට ඇති සියලු තර්ක ඉදිරිපත් කළද අවසානයේ දේශපාලන හේතු මත එය කිරීමට රජයට සිදු විය. ඒ මඟින් අඩු වෙනවායයි කියූ ඊනියා වෙළඳපොල කාර්යක්ෂමතාව මැනීමේ නිර්ණායක වෙනස් කර ගැනීමටද දැන් ඔවුනට බල කෙරී ඇත. අවසානයේ පිළිගත යුතු යථාර්ථය වන්නේ වී වගාව සඳහා රාජ්‍ය මැදිහත්වීම ඉතා තීරණාත්මක සාධකයක් වන බව සහ එය ජාතියේ ප්‍රමුඛතම අවශ්‍යතාවක් බවය.

එම තත්වය තුල එදා ණය දෙන ආයතන වල බලපෑම මත ගන්නා ලද, රජය කෘෂිකර්මාන්තයට අදාල රාජ්‍ය වගකීමෙන් නිදහස් වීමේ ක්‍රියාමාර්ග අද නැවත ආපසු හැරවීමට කාලය පැමිණ ඇත. එනම්, කෘෂි ව්‍යාප්ති සේවය අඩපණ කිරීම, පර්යේෂණ ආයතන ක්‍රමයෙන් අභාවයට යාමට සැලසීම, රජයේ ගොවිපල පෞද්ගලික අංශයට විකිණීම සහ ඒ මඟින් දේශීය බීජ නිෂ්පාදනය පාලනය කිරීම සඳහා වූ රජයේ වගකීමෙන් නිදහස් වීම සහ කෘෂි ණය දෙන බැංකුව ඇදවැට්ටවීම ආදිය නිවැරදි කළ යුතු බව දැන්වත් පිළිගත යුතුව ඇත.

## ධාන්‍ය, පළතුරු සහ එළවළු වගාව

රටට අවශ්‍ය ධාන්‍ය රට තුළම වගා කිරීම සඳහා අවශ්‍ය භූමිය යෙදවීම සහ ගොවියා පෙළඹවීම ඉතා පහසුවෙන් සිදුකළ හැකි බව බඩඉරිඟුවලින් ස්වයංපෝෂිත වීමේ ආදර්ශය විසින් අපට කියා දී ඇත. ඒ පිළිබඳව ''බැරි බව'' කියන අයට යමක් කීමට අත්දැයි අපි නොදනිමු. එසේ තිබේ නම්, ඒ පිළිබඳව අපට තර්ක විතර්ක කළ හැක. එමෙන්ම පිටරට පළතුරු මිස ශ්‍රී ලංකාවේ පළතුරුවලට වෙළඳපොළ තුළ පුළුල් ඉඩක් ලබා ගත නොහැකි යයි පවතින මතය පරදවමින් අද ගස්ලබු, පේර සහ අඹවලට විදේශීය පළතුරු පරදවමින් ඉල්ලුමක් නිර්මාණය වී ඇත. එසේ වන්නේ දේශීය පළතුරු ප්‍රචලිත කිරීම සඳහා රජය මඟින් විධිමත් වැඩපිළිවෙළක් ඉදිරිපත් කර ඇති තත්වයක් යටතේ නොවේ. ඒ සඳහා දේශීය ගොවියාට විශේෂ සහන ලබා දී නැත. එපමණක් නොව රජයේ එකදු පර්යේෂණ හෝ සාමාන්‍ය ගොවිපොළක විශ්මිත ආදර්ශවත් වගාවක් හෝ කාර්යක්ෂම රෝපණ ද්‍රව්‍ය නිපදවීමේ හෝ බෙදාහැරීමේ ක්‍රියාවලියක් හෝ පළතුරුවලට අදාළව දක්නට නැත. දේශීය පළතුරු වලට යම්

පමණකට ඉදිරියට ඒමට හැකිවූයේ ආනයනික පළතුරුවලට බදු පැනවීමේ සරල ක්‍රියාමාර්ගය තුළ පමණි. සැපයුම පැත්තේ සැබෑ උපායමාර්ගික ප්‍රවේශයක් තිබේ නම් තත්වය කෙසේ වෙනස් වනු ඇත්ද?

වගා නොකළ සෑම බිම් අඟලකම වගා කිරීම සඳහා ගොවියා පොළඹවන සැබෑ උපායමාර්ගික ප්‍රවේශයක් දක්නට නොමැති වුවද, 'අපි වවමු - රට නඟමු' සටන් පාඨය මඟින් රජය කෘෂි කර්මාන්තයට වැඩි වටිනාකමක් ලබා දී අති බව පෙන්වීමට සමත් වී ඇත. ඒ මඟින් අද වන විට විශාල මහජන අවධානයක් දිනා ගැනීමටද රජය සමක් වී ඇත. එය හොඳින්ම පෙන්නුම් කරන්නේ මීට වසරකට පෙර ආහාර දේශීයව නිපදවීම මඟින් විදේශ විනිමය ඉතිරි කර ගත හැක්කේ 10%ක් පමණකැයි වැරදි සංඛ්‍යාලේඛන අර්ථ දැක්වීම් ඉදිරිපත් කළ දේශපාලන නායකයන්ට අද ආහාරයට ගත හැකි ශාක වැවීම ප්‍රචලිත කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති දියත් කිරීමට සිදුවීම තුළිනි.

## තේ ආර්ථිකය විනාශ කිරීම

අපේ රටේ අපනයන බෝගවලින් ප්‍රධාන ස්ථානය හිමිවී ඇත්තේ තේ වලට බැවින් ලෝක වෙළඳපොළෙහි චලනයන් අප රටේ ජංගම ගිණුමේ දැවැන්ත ලෙස පිළිඹිබු වීම වැළැක්විය නොහැක. නමුත් පසුගිය දිනවල අපගේ තේවලට අඩු මිලක් ලැබෙන විට ඉන්දියානු සහ කෙන්යා තේවල මිල වැටීමක් සිදුවූයේ නැත. ඇත්ත වශයෙන්ම පසුගිය කාලයේ අපගේ තේවල ගුණාත්මක භාවයේ යම් වැටීමක් සිදුවීම ලෝක වෙළඳපොළේ පොදු ඉල්ලුම අඩුවීමක් ලෙස හුවා දක්වා ඇඟ බේරා ගත හැකිද ? තේ පනත අනුව, ලංකාවට පිටින් තේ ආනයනය කළ හැක්කේ 3%ක උපරිමයකට යටත්වය. (එසේ 3% ක් ආනයනය කිරීමට ඉඩ දිය යුතුද යන්න වෙනම සාකච්ඡා කළ යුතුය.) නමුත්, පසුගිය කාලයේදී එම නීති උල්ලංඝනය කරමින් පිටරටින් ගෙන්වන බාල තේ මිශ්‍ර කර ''සිලෝන් ටී'' ලෙස අපනයනය කිරීම නිසා අපගේ තේ වලට ඇති ඉල්ලුම පහත වැටී ඇත. සත්‍ය එයයි. නිලධාරීන් කුමක් පැවසුවත් එය සැඟවිය නොහැක. මෙය රත්තරන් බිත්තර දමන කිකිළිය මරා කෑමකි. මෙම දුෂ්ට ක්‍රියාව ආර්ථික කුමන්ත්‍රණයක් සේ සලකා නිවැරදි නොකළහොත් ජාතික ආර්ථිකයට විශාල දීර්ඝකාලීන නිෂේධනාත්මක බලපෑමක් සිදුවනු ඇත.

## විදේශ ගමන්

අප රටට අයිති ගුවන් සමාගම් දෙකක් ඇති අතර දිනකට අපගේ ගුවන් තොට හරහා මඟීහු 4000ක් ඉහළ පහළ යති. මෙම මඟීන්ගෙන් අඩු වශයෙන් 80%ක් අපගේ ජාතික ගුවන් සමාගම හරහා ගුවන් ගමන් ප්‍රවේශපත්‍ර මිලදී ගැනීම සිදු කරන්නේ නම් කොපමණ විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළ ඉතිරි කර ගත හැකිද? මෑත කාලයේ ජාතිකත්වය පිළිබඳව, අපේ දේ පිළිබඳව, දේශීයත්වය සහ ජාතික කොඩිය පිළිබඳව ඇති වී ඇති උනන්දුව සහ අභිමානය භාවිතා කොට සෑම ශ්‍රී ලාංකිකයකුම ශ්‍රී ලංකා ගුවන් සේවය හරහා පමණක් ගුවන් ටිකට් මිලදී ගන්නා තැනට ගෙන ඒමට නොහැකිද? පැපුවා නිව් ගිනියාව එය නීති මඟින්ම තහවුරු කොට ඇත. එම රටෙන් පිටතට කුමන ගුවන් යානයකින් පියාසර කළත් ටිකට් පත් මිලදී ගත යුත්තේ ජාතික ගුවන් සේවය හරහා පමණි.

## ජංගම දුරකථන භාවිතය

දැනට ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන භාවිතය මිලියන 12.5ක් බව වාර්තා වී ඇත. නමුත් ඇත්ත වශයෙන්ම අප රටේ රාජ්‍ය සහ පෞද්ගලික සේවා නියුක්තිකය මිලියන 8.8ක් පමණ වේ. රටක ජංගම දුරකථන අත ඇති පිරිස වැඩි වන විට එය ජාතික සංවර්ධනයේ ඉහළ නිර්ණායකයක් ලෙස හැඳින්විය හැක. නමුත් මෙම නිර්ණායක සාදා දෙන්නේද අප වැනි රටවලට වැරදි උපදෙස් දෙන ජාත්‍යන්තර ආයතන විසින්මය. අද ජංගම දුරකථන මඟින් පොදු ජාතික ඵලදායීතාවයේ වැඩිවීමක්

සිදුවනවාද යන්න විවාද සහිතය. ජංගම දුරකථන අත ඇති බොහෝ දෙනෙකු ඒවායෙන් තම පෞද්ගලික ජීවිතයට හෝ රටට එක් කරන වටිනාකම ඉතා අල්ප බව ප්‍රසිද්ධ කරුණකි. ඊට අමතරව නව අංග සහිත නව දුරකථන වෙළඳපොළට ඉදිරිපත් වන නිසාම පැරණි දුරකථනය තිබියදීම නව දුරකථනයක් මිලදී ගන්නා විශාල පිරිසක් අප රටේ සිටිති. තවද ඉතා සුළු මුදලකට තමාට අවශ්‍ය අංග සහිත දුරකථනයක් මිලදී ගන්නට හැකිව තිබියදී තමාට අනවශ්‍ය අංග සහිත අධික මිල දුරකථන මිලදී ගන්නා පිරිස කොතෙක්ද? එසේම, වසරකට විදේශීය දුරකථන සේවා සමාගම්වල ලාභය ලෙස රටින් පිටතට රැගෙන යන විනිමය ප්‍රමාණය කොතෙක්ද?

යම් දෙන ලද අවස්ථාවක රටේ මහජනයා අත ඇති දුරකථන ප්‍රමාණයේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 2000කට වැඩි වේ. ඊට අමතරව වර්ෂයකට නව දුරකථන මිලදී ගැනීම සඳහා තව කොපමණ මුදලක් අප වැය කරන්නේද? මේවා සරල කාරණා ලෙස පෙනුනද ජාතික සංවර්ධනයට එසේ නැතහොත් විදේශ විනිමය සංචිතය රැක ගැනීමට අදාළ වැදගත් කාරණා නොවන්නේද? මෙවැනි තත්වයක් තුළ අද ජාතික පිස්සුවක් බවට පත්ව ඇති ජංගම දුරකථන භාවිතයට යම් ශික්ෂණයක් අවශ්‍ය නොවන්නේද? ඒ මඟින් විදේශ විනිමය සංචිතය මත ඇති කරන ධනාත්මක බලපෑම සුළුපටු නොවේ. ඒ අනුව, මිල අධික ජංගම දුරකථන භාවිතය අධෛර්යවත් කිරීම සඳහා සහ දුරකථන සේවා ආයතනවල අසාධාරණ ලාභ ඉපැයීම සහ එම ලාභය රටින් පිට කිරීම පාලනය කිරීම සඳහා වූ බදු උපාංග හැසිරවීමට රජය නිර්භීත විය යුතුය. මෙම උදාහරණය රථ වාහන මෙන්ම වෙනත් ආනයනික අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ භාවිතයටද අදාළ වේ.

## දේශීය කර්මාන්තකරුවා කෙරෙහි විශ්වාසය තැබීම

විවෘත ආර්ථිකය යටතේ අප විශ්වාසය තැබුවේ සහ සියලු සහන ලබා දුන්නේ විදේශීය ආයෝජකයන්ටය. නමුත් අද වසර 30කට පසුව ආපසු හැරී බලන විට මෙම ඊනියා ආයෝජකයන් අප රටට ඉතිරි කොට ඇත්තේ මොනවාද? අප රටේ දැවැන්ත රාජ්‍ය ආයතන මිලදී ගත් මෙම ඊනියා ආයෝජකයින් ඒවායේ යන්ත්‍ර සූත්‍ර විකුණා දමා, දේශීය බැංකුවලින් ණය ලබා ගෙන අවසානයේ සේවකයන්ගේ වැටුප්ද නොගෙවා පලා ගිය අවස්ථා කොතෙක්ද? එසේ නාස්ති කළ කාලය සහ ජාතික ධනය අප රටේ කර්මාන්තකරුවා ඔසවා තැබීම සඳහා වැය කළේ නම් අද අප ජාතියක් ලෙස සිටින්නේ කොතැනද? අප රටේ ''ටාටා බිර්ලලා'' නිර්මාණය නොවූයේ නිදහසින් පසුව අප අපගේ කර්මාන්තකරුවා කෙරෙහි විශ්වාසය තබා කටයුතු නොකිරීම නිසාය. එපමණක් නොව, විශේෂ ආයෝජන මණ්ඩල පනතක් මඟින් දේශීය ව්‍යාපාරිකයාට නොදෙන සහන විදේශිකයාට ලබා දීමට අප කටයුතු කල නිසාය. දේශීය කර්මාන්තකරුවා ඔසවා තැබීම පිළිබඳව ඉන්දියාවෙන් පාඩම් ඉගෙන ගැනීමට අප තාමත් පමා වී නැත.

අද අප රටේ කර්මාන්තකරුවා ලෝකයේ ඉහළම වෙළඳපොළ කොටසක් සහිත ටයර් නිපදවීමට සමත් වී සිටියි. එමෙන්ම, අද අප රටේ වතුර පොම්ප, පාවහන්, බිස්කට් වර්ග, චොක්ලට් වර්ග, ඖෂධීය රූපලාවන්‍ය ද්‍රව්‍ය ලෝකයේ නිෂ්පාදන අතර ඉහළම ස්ථානය දිනා ගැනීමට සමත් වී ඇත. දේශීය වෙළඳපොළ තුළ කිසිදු විදේශීය නිෂ්පාදනයකට එම ක්ෂේත්‍රවල තරඟ වැදීමට නොහැකි වී ඇත. එම කර්මාන්තකරුවන්ගේ ඉතිහාසය විමසා බැලීමේදී ඔවුන් ස්වඋත්සාහයෙන් ඉතා දුෂ්කර මාවතක් හරහා එම ගමන පැමිණ ඇති බව පැහැදිලි වේ. ඔවුන් සියලු දෙනා ''බිර්ලලාගේ'' විභවය සහිත රටට ආඩම්බර විය හැකි පිරිසකි. ඔවුන්ගේ නිෂ්පාදන/වෙළඳ නාම ලෝකයේ ඉහළින් ඔසවා තැබීමට සහ තව තවත් එවැනි නව ව්‍යාපාරිකයන් බිහි කිරීමට රජය තීරණාත්මකව මැදිහත් වන්නේ නම් අප රටට කළ නොහැක්කක් නොමැති බව ඔවුන් ඔප්පු කොට පෙන්වනු ඇත.

## පොහොර සහනාධාරයේ වැරැද්ද නිවැරදි කිරීම උපාය මාර්ගිකව වැදගත් වේ

වසරකට ශ්‍රී ලංකාවේ පොහොර ආනයනය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 300ක් පමණ වැය කරන අතර ඒවා 95%ක පමණ සහනාධාර යටතේ ප්‍රධාන වශයෙන් වී ගොවියාට ලබා දේ. මේ ආකාරයට වී ගොවියාට වක්‍ර සහනාධාරයක් ලබා දෙන්නේ පිරිවැයෙන් යම් ප්‍රතිශතයක් පියවා ගැනීම සඳහාය. බොහෝ රටවල් තෝරාගත් කෘෂිකර්ම ක්ෂේත්‍රවලට සහනාධාර ලබා දෙන්නේ ගොවියා ලබා ගන්නා අස්වැන්නට සාපේක්ෂ සෘජු ගෙවීමක් ලෙසයි. ඉන්දුනීසියාවේ වී වගාවට සහ ඇමරිකාවේ තිරිඟු වගාවට සහනාධාර ලබා දෙන්නේ සෘජුව ලබා ගන්නා අස්වැන්නට අනුව ප්‍රතිශතයක් ලෙසය. නමුත් දියුණු පරිපාලන සහ තොරතුරු සන්නිවේදන ක්‍රමවේද නොමැති විටෙක එවැනි ක්‍රමවේදයක් තදබල ලෙස දූෂණ සහ වංචාවලට ගොදුරු විය හැක. කෙසේවෙතත් දූෂණ වංචා ගැටළුව ලංකාවේදී වක්‍ර සහනාධාරයක් වන පොහොර සහනාධාරයට අදාළවද මතුවී ඇත.

වක්‍ර සහනාධාර ලබා දීමේදී තෝරා ගන්නා යෙදවුමට අනුව යෙදවුම භාවිතා කිරීමේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වෙනස්කම් සිදුවේ. පොහොර සහනාධාරය නිසා අධික ලෙස සහ වැරදි ලෙස පොහොර යෙදීමට අමතරව කාබනික ද්‍රව්‍ය භාවිතයට ඇති පෙළඹීම විශාල වශයෙන් අඩු වී ඇත. එම තත්වය තුළ කෘෂි පරිසර පද්ධතියට දීර්ඝ කාලීනව හානි සිදු වෙනවාට අමතරව අස්වැන්නේ අපේක්ෂිත වෙනසද නොලැබී යයි. පොහොර සහනාධාරය යනු උතුම් ආර්ථික අරමුණක් සඳහා ගන්නා ලද වැරදි දේශපාලන තීන්දුවක් මිස අන් යමක් නොවේ. මෙම තත්වය තුළ පොහොර සහනාධාරය සඳහා වැය කරන අති විශාල මුදල් කන්දරාව ගොවි ණය පොලී සහනාධාර, උසස් බිත්තර වී සැපයීම, ගොවි සමිති වලට චක්‍රීය අරමුදල් සැපයීම ආදී වෙනත් ක්ෂේත්‍ර සඳහා වැය කළ යුතුව ඇත. මෙම තීන්දු ගත යුත්තේ ගොවි සමිති මුල්කොටගෙන ක්‍රියාත්මක කිරීම සඳහාය. (ඒ සඳහා ගොවි සමිති සමග දියුණු සංවාදයකට එළඹිය යුතුය.)

## ආර්ථික මධ්‍යස්ථාන මිථ්‍යාව

කෘෂි ආර්ථිකයේ වෙළඳපොළ ගැටළු විසඳීමේ කෝකටත් තෛලය ලෙස අද ඉදිරිපත් කෙරෙන උපාය මාර්ගික විසඳුම වී ඇත්තේ දේශපාලන හේතුමත තෝරාගන්නා ලද ස්ථානවල ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමය. ලෝකයේ භාණ්ඩ වෙනුවට භාණ්ඩ හුවමාරු කළ 'බාටා' යුගයේදී ආර්ථික මධ්‍යස්ථාන සංකල්පය නවීන විශ්වකර්ම සංකල්පයක් විය හැකි වුවද, අද වන විට එය වෙළෙන්දා විසින් ගොවියා කොටු කරන උගුලක් බවට පත් වී ඇත. මෙම ආර්ථික මධ්‍යස්ථාන ජාලය තුළ ප්‍රධාන වශයෙන් ගැටළු දෙකක් ඇත. පළමුවැන්න ගොවිපොළ ගේට්ටුව අසලදී ගොවියා සතු වූ කේවල් කිරීමේ බලය වෙළෙන්ඳාගේ දෙපතුල අසලදී පූජා කිරීමට සැලැස්වීමේ උපායමාර්ගික වැරැද්දය. දෙවැන්න එම මධ්‍යස්ථාන තුළ පවතින දේශපාලන බලපෑම් මැද ගොඩනැඟී ඇති වෙළඳසැල් බදු දීමේ ක්‍රමවේදය හේතුවෙන් වෙළෙන්දාට අධික පිරිවැයක් දැරීමට සිදුවීමය. ඔවුන් ඒවා පියවා ගන්නේ පෙරළා එහි බර ගොවියා සහ පාරිභෝගිකයා මතම පැටවීමෙනි. මෙම මධ්‍යස්ථානවලදී බාහිර වෙළඳුන්ගෙන් ගොවියාට වැඩි මිලක් ලැබෙන ආකාරයට කේවල් කිරීමක් සඳහා මධ්‍යස්ථාන වෙළෙන්දාට දිරිගැන්වීමක් නැත. එසේ වන්නේ ගොවියාට කුමන මිලක් ලැබුණත් තැරැව්කාර වෙළෙන්දාට තම ප්‍රතිලාභය ලැබෙන බැවිනි.

පිළිතුර ඇත්තේ අද යුගයේ අඩු මිලට පවතින සන්නිවේදන තාක්ෂණික හැකියාව ප්‍රයෝජනයට ගෙන ගොවි සමිති මුල් කොට ගෙන ''වර්චුවල්'' හෙවත් භෞතික වශයෙන් නොපවතින එහෙත් ගනුදෙනු පමණක් කෙරෙන වෙළඳපොළක් නිර්මාණය කිරීමයි. එනම් ගොවියාගේ කේවල් කිරීමේ බලය ගොවිපොළ ගේට්ටුව අසලදී රැක දීමය. එහිදී, මිල තීරණය වන්නේ භාණ්ඩ ගොවිපොළේ තිබියදීමය.

ඒ මඟින් සියලු භාණ්ඩ එක් මධ්‍යස්ථානයකට ප්‍රවාහනය කොට එතනින් නැවත බෙදාහැරීමේදී සිදුවන ප්‍රවාහන වියදම් නාස්තියද අවම වේ. මෙම ක්‍රමවේදයේ මූලික අරමුණ විය යුත්තේ විවිධ කේවල් කිරීමේ ක්‍රමවේද හරහා මිල වැට්ටවීමේ පිස්සුවකට නොයා මිල ස්ථායීකරණය කිරීම මඟින් ගොවියා, පාරිභෝගිකයා සහ වෙළෙන්දා යන ත්‍රිත්වයම රැක ගැනීමය.

## විදේශ ආයෝජන මිථ්‍යාව

ආයෝජන මණ්ඩල පනත මඟින් වසර 30කට අධික කාලයක් කොතෙක් දිරිගැන්වීම් ලබා දුන්නත් රටක් ලෙස අපට ආකර්ෂණය කර ගත හැකි වූ ජාතික ආර්ථිකයට උපායමාර්ගික වශයෙන් වැදගත් වූ කර්මාන්ත මොනවාද ? රටේ බදු ගෙවන්නාගේ වියදමින් මෙම ආයෝජකයන්ට ලබා දෙන ප්‍රතිලාභ වලට සාපේක්ෂව විදේශ විනිමය රට තුළට ගලා ඒමේ අමව ප්‍රතිලාභය හෝ අප සංසන්දනය කොට ඇත්ද ? මෙම ඊනියා ආයෝජකයන් බෝහෝ විට තම ප්‍රාග්ධන අවශ්‍යතාවයෙන් වැඩි කොටස සපයා ගෙන ඇත්තේ දේශීය බැංකුවලින් ණය ලබාගෙනය. එසේ ලබා ගත් ණය පවා නොගෙවා රටින් පැන ගිය අවස්ථා කොතෙක්ද ? මේවා පිළිබඳ පුළුල් අධ්‍යයනයකින් තොරව මෙතෙක් කරගෙන ආ සියල්ල ඉදිරියට ගෙන යාමෙන් ප්‍රතිඵලයක් ලැබේද ? එම තත්වය තුළ ණය දෙන ආයතනවල උවමනාව සහ උපදෙස් මත ක්‍රියාත්මක කළ ආයෝජන මණ්ඩල පනත මඟින් මේ රටට සිදුවූ හානිය සහ ප්‍රතිලාභ ඇත්නම් ඒ පිළිබඳව පුළුල් අධ්‍යයනයකට කාලය පැමිණ ඇත.

විදේශ ආයෝජන දිරිමත් කළ යුත්තේ ජාතික ආර්ථික උපායමාර්ගික ප්‍රවේශය යටතේ රටක් ලෙස අප දිරිමත් කළ යුතු යයි තීරණය කරනු ලබන කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා පමණි. එසේ නැතිව කුමන හෝ රටකින් ඉවත් කෙරෙන කර්මාන්ත ශාලාවක් ගලවා ගෙනවිත් අපේ රටේ සවි කිරීමට දිරිගැන්වීම් ලබා දීම කර්මාන්ත සංවර්ධනය ලෙස හැඳින්විය හැකිද ?

## බැංකු පද්ධතියේ අකාර්යක්ෂමතාව පිළිබඳ ගැටළුව

ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය, අභ්‍යන්තර අකාර්යක්ෂමතාව සහ ජාතික ආර්ථික අවශ්‍යතාවන් නොසලකමින් ඉහළ ලාභ ලැබීමේ අපේක්ෂාව පෙරදැරි කරගැනීම සහ කූඨ ව්‍යාපාරිකයින්ට අවිධිමත් ලෙස නිසි ආරක්ෂාවකින් තොරව මහා පරිමාණ ණය ලබා දීම ආදී වශයෙන් වන විවිධ හේතු කාරණා නිසා කලාපයේ අකාර්යක්ෂම බැංකු පද්ධතිය ලෙස නමක් දිනාගෙන ඇත. මේ පිළිබඳව මෑතකදී අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයද යොමුවීම ඉතා සුබවාදී කාරණයකි.

අප රටේ බැංකුවල පොලී අනුපාත පැතිරීම හෙවත් තැන්පතු සහ ණය පොළී අතර වෙනස 9% සිට 12% තරම් ඉහළ අගයක් ගන්නා අතර ඉන්දියාවේ එය 5%ක් පමණ වන අතර එය සිංගප්පූරුවේ 3%ක් සහ ජපානයේ 1%ක් පමණ වේ. යම්කිසි රටක ඉහළම ලාභ ලබන ව්‍යාපාර අතර බැංකු හෝ මූල්‍ය ආයතන ඉහළින්ම නියෝජනය වන්නේ නම් එම රටේ සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යාවසායකයන්ට කිසි දිනෙක ගොඩ ඒමට නොහැකි බව සක්-සුදක් සේ පැහැදිලිය. අප රටේ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ගෙන් 90% පමණ බැංකුවල ''වැඩවසම් සම්බන්ධතා සහිත වහලුන්'' බවට පත් වී ඇත. මෙම ක්ෂේත්‍රයේ ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභය බොහෝ විට බැංකුවල පොලී අනුපාතයට වඩා පහළ අගයක් ගන්නා අතර එම ව්‍යාපාර වසර කිහිපයක් හෝ පවතින්නේ ව්‍යවසායකයා පමණක් නොව ඔහුගේ හෝ ඇයගේ පවුලේ සියලු දෙනාගේ ශ්‍රමයේ වටිනාකමද ඊනියා අතිරික්තයට එකතු වන බැවිනි. ඇත්ත වශයෙන්ම මොවුන් සියලු දෙනාගේ ව්‍යාපාර පවතින්නේ බැංකුවේ පැවැත්ම සඳහාය. කෙසේ වෙතත් අවසානයේ ප්‍රාග්ධනය ඛාදනය වීමෙන් ව්‍යාපාර ඇද වැටෙන විට බැංකුව විසින් ණයකරුවා උගසට තැබූ දේපල වෙන්දේසි කර තම ආයෝජනය සියලු වියදම් සහිතව නැවත ලබා ගනී. දිනපතා පුවත්පත්වල පළවන දේපළ වෙන්දේසි කිරීමේ දැන්වීම් සමීක්ෂණය කළහොත් මෙම තත්වය පැහැදිලි වනු ඇත.

අද අප රටේ බැංකු පද්ධතිය සුළු ව්‍යාපාරිකයන්ගේ හදිසි ප්‍රාග්ධන අවශ්‍යතාව කොතරම් නරක ආකාරයට ව්‍යාපාරික අවස්ථාවක් බවට පත් කරගෙන සිටිනවාද යන්න වටහා ගැනීමට හොඳම උදාහරණය රන් උකස් සේවාවයි. අවම අනතුර සහිත සහ පරිපාලන වශයෙන් අවම වියදමක් සහිත එහෙත් සුළු ණය වෙළඳපොළ තුළ විශාල කාර්යභාරයක් සහිත රන් උගස් සේවාව සඳහා ලංකාවේ වාණිජ බැංකු ඉහළම පොලී අනුපාතයක් අයකරන අතර එය වසන් කිරීම සඳහා ප්‍රචාරණයේදී මාසික වශයෙන් පොලිය ගණනය කර දක්වන අවස්ථාද දැකිය හැකිය. අප රටේ වාණිජ බැංකු රජය මඟින් ලබා දෙන පොළී සහනාධාරය යොදාගෙන ණය දීම සඳහා තම ප්‍රාග්ධනය යෙදවීමට මැළිකමක් දක්වති. ඊට හේතුව වෙනත් අංශවලට එම ප්‍රාග්ධනය යෙදවීමෙන් වැඩි ලාභ ලබා ගත හැකි වීමය. 2007 වසරේදී වාණිජ බැංකු 14ක් වී වගාව සඳහා ණය වශයෙන් ලබා දී ඇත්තේ මිලියන 1052 ක් පමණි. (නමුත් එම වසරේදී ෆාම්තෙල් ආනයන කරුවන් කිහිප දෙනෙකුගේ කපා හැර ඇති ආනයන බදු ප්‍රමාණය මිලියන 3233 කි.)

මේවායින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ වැණිජ බැංකු, ජාතික ආර්ථික උපායමාර්ගයන් නොසලකා හරිමින් පටු වාණිජ අරමුණු තුළ පමණක් කොටු වී සිටින බවය. ජාත්‍යන්තර ණය දෙන ආයතන සැම විටම උදව් කරන්නේ සහ උපදෙස් දෙන්නේ ග්‍රාමීය ණය දෙන ආයතන පවා මේ ආකාරයට වාණිජ මට්ටමට ගෙන ඒම සඳහාය. අද ස.ණ.ස. බැංකුව පත්වී ඇති තත්වය ඊට හොඳම උදාහරණයකි. ගොවිජන බැංකුවද ඒ ආකාරයට වාණිජකරණය කිරීමට ඔවුන් උත්සාහ කළද එය අසාර්ථක විය. නමුත් ප්‍රාග්ධන හිඟය නිසා අද එම වටිනා 'බැංකුව' ස්වාභාවික මරණයක් අත්කර ගනිමින් සිටියි.

මෙවැනි බැංකු පද්ධතියකින් රටේ ජාතික ආර්ථිකය උද්දීපනය කළ නොහැකි බව ඉර-හඳ මෙන් විශ්වාසය. එබැවින් ජාතික අර්ථික සංවර්ධනයේ පූර්ව අවශ්‍යතාවක් ලෙස අප රටේ බැංකු පද්ධතිය ප්‍රතිසංවිධානය කළ යුතුය. එසේ නැතහොත් යම් නිශ්චිත අරමුණුවලට අදාළව නිර්වාණිජකරණයට ලක් කිරීම මගින් ද්විත්ව බැංකු පද්ධතියක් ගොඩනැඟිය යුතුය. එනම් රාජ්‍ය ප්‍රාග්ධනය සහ සහනාධාර සහිත සුළු සහ මධ්‍යම පරිමාණ ණය දෙන බැංකු පද්ධතියක් (අඩු මෙහෙයුම් වියදම් සහිත) සහ සම්ප්‍රදායානුකූල වාණිජ බැංකු පද්ධතියක් වශයෙන් පද්ධති 2ක් ගොඩනැඟිය යුතුය. අඩු වියදම් බැංකු ක්‍රමයක් සඳහා හොඳම මොඩලය සපයන්නේ ගොවිජන බැංකුවයි.

## "යටිතල පහසුකම් සංවර්ධනය" නැවත විග්‍රහ කිරීම

ලෝකයේ බොහෝ දියුණු වන රටවල්වල මෙන්ම ශ්‍රී ලංකාවේද ආර්ථික සහ මානව සංවර්ධනයට ඇති ප්‍රධානම බාධකය වන්නේ යටිතල පහසුකම් වැරදියට විග්‍රහ කර ගැනීමය. ඉතා සුලබව යටිතල පහසුකම් ලෙස හැඳින්වෙන අධිවේගී මාර්ග, ගුවන් පාලම්, නාගරික වෙළඳාමට අවශ්‍ය පොදු පහසුකම් ආදිය සැබෑ සංවර්ධන ක්‍රියාදාමයක් අරම්භ කිරීමේ පූර්ව කොන්දේසි ලෙස සැලකීම මෙම වැරැද්දයි. ඒවාද අවශ්‍යවන අවස්ථාවක් ඇත. නමුත් ඒ ප්‍රමුඛතා ලැයිස්තුවේ තවත් බොහෝ දේවලට පිටුපසිනි. ප්‍රමුඛතාවය පටලවා ගැනීම යනු, ආර්ථිකය එක තැන පල්වීම මිස අන් යමක් නොවේ. වහලක් නැති ගෙයකට ගේට්ටුවක් දැමීම හෝ ගෙදරට එන පාරට තාර දැමීම ප්‍රමුඛතාවයක්ද? කෘෂිකාර්මික ප්‍රදේශයක බහුතරයක් ජනතාවට ආර්ථිකයට දායක වීමට අවශ්‍ය කෘෂි සහ වාරි කර්මාන්ත යටිතල පහසුකම් සඳහා මුදල් වැය නොකරන්නේ නම් සහ ඒ වෙනුවට නගරයේ අභිනවයෙන් ඉදිකරන 'සුපිරි වෙළඳ සැල්' යටිතල පහසුකම ප්‍රයෝජනයට ගැනීමට බහුතරයක් සාමාන්‍ය ජනතාවට ආර්ථික හැකියාවක් ලැබෙන්නේ නැත. ඒ නිසාම එම වෙළඳ සැලේ කඩ කාමර කුලියට ගත් වෙළෙන්ඳන්ට ටික කාලයකින් ඒවා වසා දැමීමට සිදුවේ.

රටක් ලෙස අප ණය ලබා ගත යුත්තේ අපේ ප්‍රමුඛතාවන්ට අනුව අප විසින් තෝරන ව්‍යාපෘතිවලට මිස ණය දෙන ආයතන විසින් තෝරා දෙන ව්‍යාපෘතිවලට නොවේ. එසේ කළහොත් අපට ණය

නොලැබෙනු ඇතැයි යන මිථ්‍යාව බිඳ හෙළිය හැක්කේ නිර්භයව එසේ කළහොත් පමණි. ණය දෙන ආයතන සතු අතිරික්ත ප්‍රාග්ධනය අපට නොදී කාට දෙන්නද ? අද දකුණු ඇමරිකානු රටවල් ඒ ආකාරයට කේවල් කිරීමේ බලය ලබා ගෙන ඇත. පෑලියගොඩ ගුවන් පාලම ඉදි කිරීම සඳහා වැය කළ මුදලින් නැඟෙනහිර පළාතේ තරුණයන් 20,000කට රැකියා සපයමින් කන්තලේ සීනි කර්මාන්ත ශාලාව නවීන පහසුකම් සහිතව නැවත ආරම්භ කිරීමට හැක. අප ජාතියක් ලෙස හදිසියේ කළ යුතුව ඇත්තේ ඒ ආකාරයේ වෙනස් කම් නොවේද ? එසේ එම ගුවන් පාලම සෑදීම වසර දෙක තුනකින් පමා කළා නම් අහස කඩා වැටී කොළඹ-නුවර පාර වසා දැමීමට සිදු වනවාද?

## සුපර් පොස්පේට් පොහොර පිළිබඳ වැරදි ආදර්ශය මඟින් ලෝක වාර්තාවක් පිහිටුවීම

ශ්‍රී ලංකාවට වසරකට අවශ්‍ය ට්‍රිපල් සුපර් පොස්පේට් ආනයනය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 60ක පමණ විදේශ විනිමය වැයවේ. නමුත් වසර සිය ගණනකට ඒ හා සමාන සිංගල් සුපර් පොස්පේට් ප්‍රමාණයක් නිපදවීමේ හැකියාව සහිත කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා උපරිම වශයෙන් වැය වන්නේ ඇමරිකානු ඩොලර් මිලියන 10ක් පමණි. මෙවැනි උදාහරණයක් ලෝකයේ කිසිදු රටකින් සොයාගත හැකිද ? කෙසේ වෙතත් මෙම අඳුරු වළාව තුළ ඇති රිදී රේඛාව වන්නේ අදාළ ආයතනයේ සභාපතිවරයා ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන් මෙන්ම බාහිර විද්වතුන් විශාල ප්‍රමාණයක් එය කළ හැකි බවත් කළ යුතු බවත් පැහැදිලිව ප්‍රකාශ කිරීමය.

**මේ ආකාරයට දීර්ඝ උදාහරණ ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් ජාතික ආර්ථිකයට අදාළ ධනාත්මක සහ නිෂේධනාත්මක කාරණා සාකච්ඡා කළ හැකි වුවද අවසාන වශයෙන් කිව යුත්තේ අප මෙතෙක් පවත්වාගෙන එන ලද ආර්ථික මොඩලය තව වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීමෙන්වත් දැන හෝ නොදැන ඊට පැලැස්තර ඇලවීමෙන් හෝ 'ටින්කර්' වැඩ කිරීමෙන්වත් ජාතියක් ලෙස අප ඉදිරියේ ඇති අභියෝග ජය ගත නොහැකි බවය. ''අපට කළ හැකිය'' යන දැඩි විශ්වාසයෙන් යුතුව රටට ආර්ථික උපාය මාර්ගික මග පෙන්වීම ලබා දීම මව්බිම ලංකා පදනමේ අරමුණයි. එබැවින් රජයෙන්, සියලු දේශපාලන පක්ෂ වලින් සහ මහජනතාවගෙන් අප ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ රටේ සමස්ත ගමන් මග හෙවත් උපායමාර්ගික ආකෘතිය වෙනස්කර ගැනීම සඳහා මෙම යෝජනා මාලාව උපයෝගී කර ගන්නා ලෙසය.**

**තවද, මේ රටේ ඉදිරි ගමනට දැන හෝ නොදැන අකුල් හෙළන ''බැරි බැරි රෝගයෙන්'' පෙළෙන සමහර උසස් රාජ්‍ය නිලධාරීන්ගෙන් අප ඉල්ලා සිටින්නේ තමාට බැරි නම් කළ හැකි අයට අවස්ථාව ලබා දෙමින් විශ්‍රාම ගන්නා ලෙසය. මේ රටේ බදු ගෙවන ජනතාව ඔවුන්ට බුලත් අතක් දී අවසර ලබා දීමට අමතරව සම්පූර්ණ වැටුප විශ්‍රාම වැටුප ලෙස ලබා දීමට එකඟ වනු ඇත. (මෙම ප්‍රකාශය නිසා තම මව්බිමට ආදරයෙන් සේවය කරන බහුතරයක් වූ අවංක රාජ්‍ය නිලධාරීන් සිත් රිදවා නොගනු ඇතැයි අපි අපේක්ෂා කරමු.)**

**මෙම උපාය මාර්ගික යෝජනා මාලාව ඉදිරිපත් කිරීමේදී අප අවධානය යොමු කරන්නේ ජාතික ආර්ථිකයට ඉතා තීරණාත්මක සහ වැඩි බලපෑම ඇති කළ හැකි අංශ කෙරෙහිය. අනෙකුත් ක්ෂේත්‍ර ජාතික ආර්ථික උපාය මාර්ගික ප්‍රවේශය තුළ නියෝජනය නොවිය යුතු යයි ඉන් අදහස් නොකෙරේ.**

| | |
|---|---|
| සභාපති, ආරියශීල වික්‍රමනායක | වෛද්‍ය වසන්ත බණ්ඩාර |
| කුලතුංග රාජපක්ෂ | වෛද්‍ය සුමිත් වන්නි ආරච්චි |
| සමන්ත කුමාරසිංහ | ආචාර්ය ත්‍රිෂාන්ත නානායක්කාර |
| මහාචාර්ය රංජිත් සේනාරත්න | රංජිත් පේජ් |

**2009 ජූලි 08**

# < 3 >
# සංක්ෂිප්ත යෝජනා හෙවත් අවධානය යොමු කිරීම

ජාතික ආර්ථික සංවර්ධනයට අදාළ කුමන හෝ යෝජනාවක් එම යෝජනාව පදනම් වන මූලික උපාය මාර්ගික ප්‍රවේශයෙන් වියුක්තව සලකා බැලීමෙන් අදාළ උපාය මාර්ගික වෙනස හෙවත් ආර්ථික මොඩලයේ වෙනස ළඟා කර ගත නොහැක. යම් යෝජනාවක් ව්‍යුක්තව ගෙන ක්‍රියාත්මක කිරීම හුදු පැලැස්තර ඇලවීමක් හෝ 'ටින්කරින්' වැඩක් ලෙස සැලකීමේ වරදක් නැත. එසේ වුවද, උපාය මාර්ගික ප්‍රවේශයේ සංක්ෂිප්තයක් ලෙස එහි අඩංගු යෝජනා මෙසේ ලැයිස්තු ගත කෙරෙන්නේ එම ප්‍රවේශය පිළිබඳ මහජන අවධානය යොමු කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස පමණි.

## දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරීම සහ දේශීය කර්මාන්තකරුවා ශක්තිමත් කිරීම සඳහා වන යෝජනා

01. ශ්‍රී ලංකාවේ විකල්ප තිබියදී ආනයනය කරනු ලබන ද්‍රව්‍ය සහ භාණ්ඩ සඳහා ජාතික ආර්ථික සෙස් බද්දක් පැනවීම.

02. 60%ක් දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන සෑබෑ ශ්‍රී ලාංකීය වෙළඳ නාම සඳහා වන ප්‍රචාරක වියදම් බදු ගණනයේදී 100%ක්ම වියදම් ලෙස එකතු කිරීමට ඉඩ ලබාදීම.

03. 60%ක් දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන සෑබෑ ශ්‍රී ලාංකීය වෙළඳ නාම අපනයනයේදී විදේශ රටවල සිදු කරන ප්‍රචාරක වියදම් පියවා ගැනීම සඳහා අපනයන වටිනාකමින් (දේශීයව එකතු කරන ලද වටිනාකමින්) 1%ක සහනාධාරයක් ලබා දීම.

04. දේශීයව 33%ට වඩා වැඩි වටිනාකම් එකතු කිරීමේ කර්මාන්ත දියුණු කිරීම සඳහා ලබා ගන්නා ණය ප්‍රාග්ධනයෙන් 50%ක් සඳහා 50%ක් ණය පොලී සහනාධාර ලබා දීම.

05. දේශීයව 33% වඩා වැඩි වටිනාකම් එකතු කිරීමේ කර්මාන්ත සඳහා ආනයනනය කරන ප්‍රාග්ධන භාණ්ඩ සඳහා පවතින සමස්ත බදු වලින් 50%ක සහනාධාරයක් ලබා දීම.

06. ආයෝජන මණ්ඩල පනතේ 18 වැනි වගන්තිය සංශෝධනය කිරීම මඟින් දේශීය ව්‍යාපාරිකයා අභිබවා විදේශීය ව්‍යාපාරිකයාට ලබා දෙන සහන අහෝසි කිරීම සහ 16 වැනි වගන්තිය අනුව සියලු සහන නව දේශීය කර්මාන්ත සඳහා ලබා දීම.

07. ආයෝජන මණ්ඩල පනත ක්‍රියාත්මක වූ දා සිට විදේශීය ආයෝජකයන්ට ලබා දුන් සහන සහ ඒ මඟින් රටට ලැබුනු ධනාත්මක හා නිෂේධාත්මක ප්‍රතිලාභ පිළිබඳව විමර්ශනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පුළුල් බලතල සහිත කොමිසමක් පිහිටුවීම.

08. ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය දීර්ඝ කාලීනව ශක්තිමත් කිරීමේ විභවය සහ ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළටම ඔසවා තැබීමේ විභවය සහිත කර්මාන්ත ක්ෂේත්‍ර 10කට අයත් සැබෑ ශ්‍රී ලාංකීය වෙළඳ නාම 10 ලෝකයේ ප්‍රචලිත කිරීම සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.

09. සූර්ය සිංහ සම්මාන ලාභී සැබෑ ශ්‍රී ලාංකීය නිෂ්පාදන ප්‍රචලිත කිරීම සහ දේශීයත්වය ළමා මනසට කාවැද්දීම සඳහා බාලදක්ෂ ව්‍යාපාරය හා සමාන බරකින් සූර්ය සිංහ ව්‍යාපාරය පාසැල් තුළ ප්‍රචලිත කිරීම සහ දේශීයත්වය සහ ජාතික අභිමානය මතු කෙරෙන ටෙලි නාට්‍ය සඳහා රාජ්‍ය මාධ්‍ය තුළ වැඩි ඉඩකඩ ලබා දීම. (ඒ සඳහා රාජ්‍ය රූපවාහිනී නාලිකා වල විශේෂ කාල පරාසයක් වෙන් කිරීම)

10. විදේශවල නිපදවන රූපවාහිනී වෙළඳ දැන්වීම් අධෛර්ය කිරීම සඳහා ප්‍රචාරය කෙරෙන වාර ගණනට අනුව සම්මතයක් සකස් කොට විශේෂ බද්දක් පැනවීම.

## සාගර සහ මිරිදිය සම්පත්වලින් රටට උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා වන යෝජනා

11. මහජන ධීවර සමාගම් ජාලයක් පිහිටුවා මහා පරිමාණ ධීවර නාවික යාත්‍රා 10ක් මිලදී ගෙන සමස්ත ශ්‍රී ලාංකික මුහුදු සීමාව ආවරණය කිරීම සහ නාවික හමුදාව, ජාතිය වෙනුවෙන් සාගර සම්පත් වලින් උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා වන ආර්ථික බලඇණියක් බවට පත් කිරීම.

12. විදේශීයන්ට ශ්‍රී ලංකාවේ මුහුදේ මසුන් මැරීම සඳහා අවසර ලබා නොදීම.

13. ආනයනික ධීවර නිෂ්පාදන සඳහා අය කරන සෙස් බද්දක් මඟින් දේශීය මුහුදු සහ මිරිදිය ධීවර කර්මාන්තයට සහන ලබා දීම. දේශීයව උසස් මට්ටමේ ධීවර යාත්‍රා නිපදවීම සඳහා 'සී-නෝර්' සහ 'ඩොක්යාඩ්' ආයතන සහ නාවික හමුදාව ඒකාබද්ධ ව්‍යාපෘතියක් දියත් කිරීම.

14. සාගර විශ්ව විද්‍යාලයට සහ ''නාරා'' ආයතනයට ඒකාබද්ධව සිදු කෙරෙන සාගර සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනයට ආදළ ව්‍යාපෘති සහ පර්යේෂණ සඳහා ජාතික පර්යේෂණ අයවැයෙන් 10%ක් වෙන් කිරීම.

15. මිරිදිය ධීවර කර්මාන්තය කෘෂි කර්මාන්තය සමඟ ඒකාබද්ධ කොට සංවර්ධනය කිරීම සඳහා ධීවර සෙස් අරමුදලෙන් ප්‍රතිශතයක් වැය කිරීම.

## කෘෂිකාර්මික නවෝදයක් සඳහා වන යෝජනා

16. ජාතික ආරක්ෂාව හා සමානව වැදගත් ජාතියේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට අවශ්‍ය නීතිමය සහ පරිපාලනමය පසුබිම ඇති කිරීම සඳහා නව පාර්ලිමේන්තු පනතක් (ආහාර සුරක්ෂිතතා පනත) සම්මත කිරීම.

17. බෝග වගාව සමඟ කිරි ගව පාලනය ඒකාබද්ධව කරන ගොවීන්ට විශේෂයෙන් සහනාධාර ලබාදී දිරිගැන්වීම සඳහා සුවිශේෂ සහනාධාර ක්‍රමයන් සකස් කිරීම.

18. කොස්, දෙල් සහ මයියොක්කා විශේෂිතව ප්‍රචලිත කිරීම සහ ජාතිය සතු සෑම බිම් අඟලකින්ම උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා රාජ්‍ය ආයතන, පාසල් සහ මහජන සංවිධාන හරහා දැවැන්ත ''එල දරන රැක්'' රෝපණ ජාතික ව්‍යාපෘතියක් දියත් කිරීම.

19. තේ සහ රබර් වගාව සඳහා දැනට පවතින භූමිය තව දුරටත් වැඩි නොකිරීම සහ තිබෙන භූමියෙන් උපරිම ඵලදායීතාව ලබා ගැනීම සඳහා පාංශු සංරක්ෂණ මනා සැලසුමක් සහිතව අදාළ වතු ආශ්‍රිතව සැලසුම් සකස් කිරීම. (භූමිවල විශේෂතා සැලකිල්ලට ගනිමින්) ඒ සඳහා පාංශු සංරක්ෂණ පනත සංශෝධනය කොට නීතිමය විධිවිධාන ඇති කිරීම සහ පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම.

20. ජාතික පශු සම්පත් මණ්ඩලය මුල් කොට ගෙන ඉදිරි වසර 10ක ඉලක්ක සහිතව ජාතික කිරිගව අභිජනන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සහ එය එම ආයතනයේ මූලික වගකීම බවට පත් කිරීම.

21. කිරි දෙනුන් මැරීම වැළැක්වීම සඳහා පන්සල් සහ පොලීසිය මුල් කොට ගෙන මහජන ක්‍රියාකාරිත්වයක් ආරම්භ කිරීම සහ රටේ ගව රංචුව වඩාත් කාර්යක්ෂමව බෙදී යාම සහතික කිරීම සඳහා විකුණන දෙනුන් මිලදී ගැනීමේ සහ නැවත සුදුසු ගොවීන්ට අඩු මිලට විකිණීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.

22. කිරි දෙනුන් මිලදී ගැනීම සඳහා 50% ණය පොලී සහනාධාරයක් ලබා දීම.

23. ආනයනික කිරිපිටි දිය කිරීමෙන් දියර කිරි සාදා විකිණීම සහ කිරිවල මේදය ඉවත් කොට බාහිරින් ෆාම් තෙල් ආදී මේදය එකතු කොට විකිණීම අධෛර්යය කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග හඳුන්වා දීම.

24. රෝහල්, පාසල් සහ හමුදා ආශ්‍රිතව තිරිඟු පිටි භාවිතය සම්පූර්ණයෙන්ම නැවැත්වීම සහ සහල් පිටි කර්මාන්තය සහ ඒ ආශ්‍රිත ආහාර දිරි ගැන්වීම සඳහා ණය පොලී සහනාධාර සහ වැට් බදු සහනාධාර ලබා දීම

25. තිරිඟු පිටි සහ කිරි පිටි ප්‍රචලිත කිරීම සඳහා ජනමාධ්‍ය යොදා ගැනීම තහනම් කිරීම.

26. මහඉලුප්පල්ලම සහ බතලගොඩ කෘෂිකර්ම පර්යේෂණ ආයතන ජාතික වශයෙන් වැදගත් උපාය මාර්ගික ආයතන ලෙස නම් කිරීම සහ රජය සතු සියලු ගොවිපොළවල් ජාතික බීජ නිෂ්පාදන වැඩසටහනක් සඳහා වාණිජ පදනමින් තොරව යොදා ගැනීම.

27. ග්‍රාමීය කුඩා වාරිමාර්ග සංවර්ධනය සඳහා මහජන ක්‍රියාකාරිත්වය සහිත ඒකාබද්ධ රාජ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීම සහ ඒ සඳහා ජාතික අරමුදලක් පිහිටුවීම.

28. ග්‍රාමීය කෘෂි පරිසර පද්ධති සංරක්ෂණය සඳහා පරිසර සංවිධාන, පාසල් සිසුන්, විද්වතුන් ආදීන් සම්බන්ධ කර ගැනීම සඳහා ස්වේච්ඡා ශ්‍රමය සහ දැනුම කළමනාකරණය කරනු ලබන ආයතනයක් රජය අනුග්‍රහයෙන් පිහිටුවීම.

## දේශීය ප්‍රාග්ධනය ගොඩනැඟීම සහ විදේශ විනිමය ඥානවන්තව ආයෝජනය කිරීම සඳහා වන යෝජනා

29. ඉදිරි වර්ෂ 3 සඳහා පෞද්ගලික පාවිච්චියට එක් අයකු එක් වාහනයකට වඩා ආනයනය කිරීමේදී සහ අධික මිල සහිත ජංගම දුරකථන ආනයනයේදී අධෛර්ය කිරීමේ බදු අය කිරීම.

30. ශ්‍රී ලංකාවේ ආනයන ලැයිස්තුවේ ඉහළම ඇති ද්‍රව්‍ය 10 ක ආනයනය 20% කින් අඩු කිරීම සඳහා මහජන අධ්‍යාපනය ඇතුළු ක්‍රියාමාර්ග හඳුන්වා දීම.

31. විදේශ සේවා නියුක්තිකයන්ගේ විදේශීය ඉතුරුම් ජාතික මට්ටමේ වාණිජ ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම දිරිගැන්වීම් සඳහා සහන ලබා දීම සහ එම ක්‍රියාවලිය සම්බන්ධීකරණය සඳහා කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

32. විදේශ සේවා නියුක්තිකයන්ගේ ආරක්ෂාව, අභිවෘද්ධිය සහ අභිමානය සඳහා අවම වශයෙන් ඉන්දියාව සහ පිලිපීනය අනුගමනය කරන ක්‍රියාමාර්ග වහාම ස්ථාපිත කිරීම. (විශේෂයෙන්ම කාන්තාවන්ට අදාළව)

33. ලොතරැයි තෑගි මුදල්වලින් 90%ක් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපෘතිවල ආයෝජනය කරන අවස්ථාවල දිරි ගැන්වීම සඳහා අමතර 5%ක තෑගි මුදලක් ලබා දීම.

34. කෘෂිකාර්මික සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ මහා පරිමාණ ආයෝජනවලදී ප්‍රාග්ධන බදු සහන ලබා දීම.

35. විදේශීය බැංකු සහ සන්නිවේදන ආයතන ලාබ ලෙස රටින් පිටතට රැගෙන යන අරමුදල් වලට ආයෝජනය කළ මුදලට සාපේක්ෂව සීමා පැනවීම.

36. අපනයන නිෂ්පාදනවල ආනයන කොටස 40% වඩා අඩුවන අවස්ථාවල වාර්ෂිකව වැඩිවන අපනයන ආදායමට සාපේක්ෂව ආදායම් බදු සහන ලබා දීම.

37. ඉන්දු-ශ්‍රී ලංකා සීපා ගිවිසුම පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර දැනට පවතින නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ප්‍රබල ශ්‍රී ලාංකික වෙළඳ නාම 10කට සහන ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ එහි ප්‍රතිඵල වසර දෙකක් අධ්‍යයනය කිරීම.

## කෘෂිකාර්මික සහ බලශක්ති උත්පාදන ඒකාබද්ධ සංවර්ධන මොඩලයක් සඳහා වන යෝජනා

38. හෙක්ටයාර් 60,000ක උක් වගා කිරීම මඟින් ජාතික පෙට්‍රල් අවශ්‍යතාවට සමාන ප්‍රමාණයකින් එතනෝල් නිපදවීම මඟින් පෙට්‍රල් ආනයන වියදම ඉතිරි කර ගැනීම සහ රටට අවශ්‍ය සීනි ප්‍රමාණය නිපදවා ගැනීම සහ ඒ ආශ්‍රිතව විදුලිය නිෂ්පාදනය, සත්ව ආහාර නිෂ්පාදනය, කිරි නිෂ්පාදනය සහ කිරි ආශ්‍රිත සකස් කළ නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම.

39. එතනෝල් යොදාගෙන ධාවනය කිරීම සඳහා මෝටර් සයිකල්, කුඩා කාර් සහ පාපැදිවලට සවි කරනු ලබන කුඩා එන්ජින් එකලස් කිරීම සහ ඊට අවශ්‍ය විශේෂ අමතර කොටස් දේශීයව නිපදවීම සඳහා දිරිගැන්වීම් ලබා දීම. (අවම වශයෙන් මූලික ආයෝජනය සඳහා 50%ක පොලී සහනාධාර)

40. සම්පූර්ණයෙන්ම එතනෝල් යොදා ධාවනය කිරීම සඳහා වෙනස් කරනු ලබන වාහන සහ මෝටර් සයිකල් සඳහා ආදායම් බලපත්‍ර ගාස්තු 50%කින් අඩු කළ යුතු අතර එතනෝල් විකිණීමේ බලපත්‍ර පෞද්ගලික ආයතනවලටද ලබා දිය යුතුය.

41. මහජනයා සතු ඕනෑම සිලින්ඩරයකට ගෑස් පුරවා ගැනීමට අවසර ලබා දීම සහ ඊට අවශ්‍ය යාන්ත්‍රණය හඳුන්වා දීම මඟින් ගෑස් වෙළඳපොළ කාර්යක්ෂම කිරීම.

42. විකල්ප බලශක්ති උත්පාදනය කොට භාවිතා කරන පාරිභෝගිකයන් සඳහා විදුලි බිලෙන් සහන ලබා දීම.

43. බලශක්ති පිරිමැස්ම නොසලකා ඉදිකරනු ලබන ගොඩනැඟිලි සඳහා දණ්ඩන බද්දක් අය කිරීම

44. ක්‍රම ක්‍රමයෙන් පෙට්‍රල්වලට එතනෝල් මිශ්‍ර කර විකිණීම සඳහා තෝරාගත් ඛණිජ තෙල් නීතිගත සංස්ථා බෙදුම්හල් මඟින් ආරම්භ කිරීම සහ ඒසඳහා පෙට්‍රල්වලට එකතු කරනු ලබන එතනෝල් ප්‍රමාණයට සාපේක්ෂව මිල සූත්‍ර හඳුන්වා දීම

## ජාතියේ පොදු ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා වන යෝජනා

45. රටේ ප්‍රධානම මඟී ප්‍රවාහන මාධ්‍ය බවට දුම්රිය සේවය පත්කිරීම සහ මන්නාරම, කන්කසන්තුරේ දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය අප රටේ ප්‍රධානම සංවර්ධන ව්‍යාපෘතිය ලෙස නම් කිරීම.

46. දුම්රිය පාදක නාගරික සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සහ එහි ආදායම් දුම්රිය ගමනාගමන සංවර්ධනය සඳහා යෙදවීම.

47. දුම්රිය මැදිරි සහ කුඩා එන්ජින් සහිත දුම්රිය දේශීයව නිපදවීම සඳහා රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ ව්‍යාපෘති දිරිගැන්වීම සඳහා උපරිම සහන ලබා දීම.

48. දුම්රිය භාණ්ඩ ප්‍රවාහන සේවය පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව රටේ ප්‍රධානතම ජාතික මට්ටමේ භාණ්ඩ ප්‍රවාහන සේවය ලෙස දියුණු කිරීම සහ මහාමාර්ගවල බහාලුම් ප්‍රවාහනය සීමා කිරීම.

49. හම්බන්තොට නගරය ශ්‍රී ලංකාවේ උප අගනගරය ලෙස නම් කොට හම්බන්තොට වරාය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වරාය ලෙස ගොඩනැගීම. ඒ තුළ හම්බන්තොට-කොළඹ දුම්රිය ප්‍රවාහන සේවය සහ හම්බන්තොට, ත්‍රිකුණාමලය, ගාල්ල, කොළඹ නාවික භාණ්ඩ ප්‍රවාහන සේවය ආරම්භ කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතාවක් ලබා දීම.

50. ජාතික මාර්ග පද්ධතිය ජාතික සංවර්ධන ක්‍රියාවලියට සාපේක්ෂව ජාලයක් ලෙස කාර්යක්ෂම කිරීම සඳහා ජාතික සැලසුමක් සකස් කිරීම සහ අධිවේගී මාර්ග සහ ගුවන් පාලම් ඉදි කිරීම අවුරුදු 05කට නැවැත්වීම.

51. පාපැදි දේශීයව නිපදවීම දිරිමත් කිරීම, පොදුවේ පාපැදි භාවිතය දිරිමත් කිරීම සඳහා අධ්‍යාපනික සහ සංස්කෘතික ක්‍රියාකාරකම් පාසල් තුළ සහ ජනමාධ්‍ය මඟින් මෙහෙයුමක් දියත් කිරීම. එසේම ත්‍රී රෝද රථ සඳහා මීටර් සවි කිරීම සහ ත්‍රී රෝද රථ ආනයනය සීමා කිරීම.

## ජාතික සංවර්ධනයේදී තරුණ තරුණියන්ට ප්‍රමුඛතාව ලබාදීම සඳහා වන යෝජනා

52. දැනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ පවතින සහ අවිධිමත්ව පවරා දී ඇති සියලු ඉඩම් පිළිබඳව කඩිනමින් නැවත සමීක්ෂණයක් කිරීම සඳහා කොමිසමක් පත් කිරීම සහ එහි නිර්දේශවලට අනුව සාමූහික සහ පෞද්ගලික ගොවිපොළ ආරම්භ කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන්ට ඉඩම් ලබා දීම.

53. තරුණ කෘෂි නිෂ්පාදන සමුපකාර පිහිටුවීම සහ ඒවාට කෘෂි ඉඩම් වෙන් කිරීමට ඉහළ ප්‍රමුඛතාවක් ලබා දීම සහ තාක්ෂණය, ප්‍රාග්ධනය ඇතුළු අනෙකුත් දිරිගැන්වීම් ලබා දීම සඳහා රාජ්‍ය අරමුදල් යෙදවීම. තරුණ නිෂ්පාදන සමුපකාර පිහිටුවීමේදී ත්‍රිවිධ හමුදා හැරගිය පිරිස් සහ විශ්‍රාමලත් පිරිස් සඳහා ප්‍රමුඛතාවක් ලබා දිය යුතු අතර රටේ යම් භූමි ප්‍රමාණයකින් ආර්ථික ප්‍රයෝජන රටට ලබා දීමේ වගකීමෙන් යම් ප්‍රතිශතයක් ත්‍රිවිධ හමුදාවලටද පැවරිය යුතුය.

54. කෘෂි කර්මාන්තය සහ සත්ව පාලනය සංවිධානාත්මකව ජීවන වෘත්තිය ලෙස තෝරා ගන්නා තරුණ තරුණියන්ට නිෂ්පාදන සමුපකාර ගොඩනැංවීමේ කාලය තුළ වසර 2ක් සඳහා ජීවන ආධාර ලබා දීම.

55. කෘෂි කර්මාන්තයේ සහ සත්ව පාලනයේ යෙදීම ආකර්ෂණීය ආකාරයට සිදු කිරීම සඳහා තරුණ තරුණියන්ට අවශ්‍ය විශේෂ උපකරණ, විශේෂ ඇඳුම් සහ උපාංග මිලදී ගැනීම සඳහා රජය මඟින් සහනාධාර ලබා දීම.

56. කෘෂි කර්මාන්තය සහ සත්ව පාලනය ජීවන වෘත්තිය ලෙස තෝරා ගන්නා තරුණ තරුණියන්ට අඛණ්ඩව එම ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා විවෘත කෘෂි විශ්ව විද්‍යාලයක් පිහිටුවීම.

57. කෘෂි කර්මාන්තය සහ සත්ව පාලනය ජීවන වෘත්තියක් ලෙස සමාජයේ ඉහළින් ඔසවා තැබීම සඳහා රාජ්‍ය මාධ්‍ය යොදා ගනිමින් අධ්‍යාපනික සහ සංස්කෘතික ක්‍රියාකාරකම් දියත් කිරීම.

## රටට අවශ්‍ය විශිෂ්ටයා බිහි කිරීම සඳහා වන යෝජනා

58. පාසල් 1000කින් පමණ සමන්විත ජාතික මට්ටමේ විශේෂ ආදර්ශ පාසල් පද්ධතියක් ගොඩනැඟීම සඳහා වසර 05 ක ඉලක්ක සහිතව ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.

59. විශේෂ ආදර්ශ පාසල් සඳහා ගුරුවර ගුරුවරියන් සහ විදුහල්පතිවරුන් තේරීම සඳහා විශේෂ නිර්ණායක යොදා ගැනීම සහ ඔවුන්ට විශේෂ පහසුකම් සහ දීමනාවක් ලබා දීම.

60. විශේෂ ආදර්ශ පාසල් සඳහා ස්වෙච්ඡාවෙන් සම්පත් දායකත්වය ලබා දීම සඳහා විශ්‍රාමලත් වෘත්තිකයන් සංවිධානය කිරීම සහ මෙහෙයවීම සඳහා ජාතික මට්ටමේ ස්වෙච්ඡා ශ්‍රමය සහ දැනුම කළමනාකරණ ආයතනයක් පිහිටුවීම.

61. පාසල් පෙළපොත් නැවත භාවිතා කිරීමේ සංස්කෘතියක් සිසුන් තුළ ඇති කිරීම සහ ඒ මඟින් ඉතිරි වන මුදල් අමතර කියවීම් පොත් මුද්‍රණය සඳහා යෙදවීම.

62. සෑම විශේෂ ආදර්ශ පාසලකම භාෂා විද්‍යාගාරයක් සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක් පිහිටුවීම සහ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා ත්‍රිත්වය ඉතා ඉහළින් ඉගැන්වීමේ පහසුකම් ඇති කිරීම.

63. පුළුල් මහජන සංවාදයකට පසුව තෝරාගත් විෂය ක්ෂේත්‍ර සඳහා පමණක් විධිමත්ව රජයේ පාලනයට යටත් කළ පෞද්ගලික උපාධි ප්‍රදානය කිරීමේ ආයතනවලට අවසර දීම සහ ඒවායේ නඩත්තුව සඳහා ආචාර්යවරු ඇතුළු රජයේ විශ්ව විද්‍යාලවල සම්පත් යොදා ගැනීම වැළැක්වීම සඳහා නීතිමය සහ පරිපාලනමය ප්‍රතිපාදන ඇති කිරීම.

64. දේශීය සහ විදේශීය සමාගම්වලට ආයෝජන සහන ලබා දීමේදී මානව සම්පත් සංවර්ධනය සඳහා නිශ්චිත ප්‍රතිශතයක් ආයෝජනය කිරීම කොන්දේසියක් ලෙස අනිවාර්ය කිරීම.

65. වතු ආශ්‍රිත ශ්‍රම බලකාය වඩාත් පුළුල් ක්ෂේත්‍රවල යෙදවීම සඳහා තාක්ෂණික පුහුණු ආයතන පිහිටුවීමේදී එම ප්‍රදේශවලට ප්‍රමුඛතාව දීම සහ ආයෝජකයින්ට එම ප්‍රදේශවල කර්මාන්ත ආරම්භ කිරීම සඳහා විශේෂ දිරිගැන්වීම් ලබා දීම.

66. විදේශගත විශේෂඥ දැනුම සහිත පිරිස් ශ්‍රී ලංකාවේ නැවත පදිංචි වීම දිරිමත් කිරීම සඳහා පහසුකම් ඇති කිරීම. ඒ සඳහා උදාහරණයක් ලෙස වෛද්‍ය සංග්‍රහය සංශෝධනය කොට වෙනමම විශේෂඥ වෛද්‍ය රෙජිස්ටරයක් ආරම්භ කිරීම.

## දැඩි මූල්‍ය විනය සහිත රාජ්‍ය කළමනාකරණය සඳහා වන යෝජනා

67. වාණිජ බැංකු විසින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාවසායකයන්ගේ අවශ්‍යතාවයන් නොසලකා හැරීමේ ගැටළුව විසඳීම සඳහා රජයේ සහනාධාර ලබන, අඩු පිරිවැය සහිතව ක්‍රියාත්මක විය හැකි සහ ''වාණිජ බැංකු සංස්කෘතියෙන්'' මිදුනු උප බැංකු පද්ධතියක් පිහිටුවීම

68. පෞද්ගලික අංශයේ අල්ලස් හා දූෂණ සොයා බැලිය හැකි වන ආකාරයට අල්ලස් හා දූෂණ පනත සංශෝධනය කිරීම

69. මූල්‍ය ආයතන අධ්‍යක්ෂවරුන් සහ විධායක නිලධාරීවරුන් සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි සහ සොයා බැලීමේ යාන්ත්‍රණයක් සහිතව ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම

70. පෞද්ගලික මූල්‍ය ආයතනවල සිදුවන දූෂණ වංචාවලට එරෙහිව අපරාධ නීතියට අනුව ක්ෂණිකව ක්‍රියාත්මක වීම සඳහා සහ වැරදිකරුවන් කළු ලයිස්තුවට ඇතුළත් කිරීම සඳහා පරිපාලන යාන්ත්‍රණයක් හඳුන්වා දීම

71. ණය කාඩ්පත් සහ ණයවර ලිපි මඟින් රටින් පිටතට ඇදීයන විදේශ විනිමය ප්‍රමාණය පළිබඳව ඉතා නිවැරදිව සමීක්ෂණය කිරීම සඳහා මහබැංකුව මඟින් යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ එම වියදම් පිළිබඳව මහජනයාට තොරතුරු දැනගැනීමට ඉඩ සැලසීම

72. කුඩා ආයෝජන සඳහා ණය ලබා ගන්නා ජනප්‍රිය ක්‍රමයක් වන රන් උගස් සේවා සඳහා රාජ්‍ය බැංකු හරහා විශේෂ පොලී සහනාධාරයක් ලබා දීම

73. පොහොර සහනාධාරය වෙනුවට එම අරමුදල් ප්‍රමාණයම යොදවා මූල්‍ය සහනාධාරයක් ලෙස කෘෂි බැංකුව හරහා ගොවි ණය සඳහා පොලී සහනාධාරයක් ලබා දීම සහ එම බැංකු වලට ප්‍රාග්ධනය සැපයීම.

## දේශයේ සැබෑ උරුමයෙන් පුළුල් ආර්ථික ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වන යෝජනා

74. දේශීය වෛද්‍ය ක්‍රමයේ ශක්තිය භාවිතා කොට ලෝකයේ ඉහළම ආදායම් සහිත රටවල වයස්ගත ජනගහනයෙන් කොටසක් ශ්‍රී ලංකාවට ගෙන්වීම මුල්කොටගෙන සංචාරක කර්මාන්තයේ නවෝදයක් ඇති කිරීම.

75. දේශීය වෛද්‍ය ක්‍රමය සහ බටහිර වෛද්‍ය ක්‍රමය ඒකාබද්ධව පර්යේෂණ කිරීම මඟින් එම වෛද්‍ය ක්‍රමය ලෝකයේ ඉහළටම ඔසවා තැබීමට රජය පූර්ණ ලෙස මැදිහත් වීම.

76. දේශීය ඖෂධ සහ දේශීය ඖෂධ ආශ්‍රිතව නිෂ්පාදනය කරන රූපලාවන්‍ය ද්‍රව්‍ය ඉහළ ගුණාත්මකභාවයෙන් ජාත්‍යන්තර වෙළඳපොළට ගෙන යාම සඳහා ව්‍යවසායකත්වය දිරි ගැන්වීම.

77. පුල්මුඩේ ඛණිජ වැලි නිස්සාරණය කිරීම සහ එප්පාවල පොස්පේට් නිධිය ආශ්‍රිතව සුපර් පොස්පේට් නිපදවීම සඳහා කර්මාන්තශාලා, මහජන සහ රාජ්‍ය ආයෝජන ඒකාබද්ධතාවයෙන් ආරම්භ කිරීම.

78. සත්ව ආහාර සඳහා මිනිසාට ආහාරයට ගත හැකි ධාන්‍ය භාවිතය අවම කෙරෙන සහ ස්වභාවික ශාක කොටස් සහ කෘෂි අපද්‍රව්‍ය උපරිමයෙන් භාවිතා කරමින් සත්ව ආහාර (විශේෂයෙන් කිරි ගවයින් සඳහා) කර්මාන්ත ආරම්භ කිරීම සඳහා දිරිගැන්වීම් ලබා දීම.

79. අනාගතයේ මහා පරිමාණයෙන් සිදු කිරීමට නියමිත ඛණිජ තෙල් කැනීම සහ ඒ ආශ්‍රිත අතුරු නිෂ්පාදන කර්මාන්ත ජාලයක් දේශීයව පිහිටුවීම සඳහා මහා පරිමාණ රාජ්‍ය සමාගමක් පිහිටුවීම සහ ඊට අවශ්‍ය ප්‍රාග්ධනය ණය පදනම යටතේත් තාක්ෂණය සහ පිරිස් බලය කුලී පදනම යටතේ විදේශවලින් ලබා ගැනීම.

80. උතුරු සහ නැගෙනහිර පළාත්වල මහජනයා නැවත පදිංචි කිරීම සඳහා සහ සියලු සංවර්ධන කටයුතු කළමනාකරණය කිරීම සඳහා අවරුදු 05ක කාලයකට යටත්ව සංවර්ධන අධිකාරී 02ක් පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවීම. (විශේෂ යෝජනාව)

# < 4 >
# තත්ත්ව විග්‍රහය

ශ්‍රී ලංකාව සාගර සම්පත් ඇතුළු ජෛව සම්පත් සහ ස්වාභාවික ඛණිජ සම්පත් පිහිටීම අතින්, ලෝකයේ ඉහළම සිටින රටවල් අතරට වැටෙන අතර පොදු මානව සංවර්ධන නිර්ණායකයන්ට අනුවද ලෝකයේ දියුණුම මානව සම්පතක් සතු රටකි. නමුත් සමස්ත සමාජ ආර්ථික නිර්ණායකයන්ට අනුව ශ්‍රී ලංකාව ලෝකයේ දුප්පත්ම රටවල් 20ට අයත් වේ. එසේ වන්නේ කෙසේද ?

ලෝකයේ ශ්‍රේෂ්ඨතම ශිෂ්ටාචාර 6න් එකක් වන ශ්‍රී ලාංකීය ශිෂ්ඨාචාරයට වසර 9000ක පමණ ඉතිහාසයක් ඇත. ක්‍රි.පූ. දෙවන ශතවර්ශයේදී එදා ලෝකයේ උසම ගොඩනැගිල්ල ලෙස සැලකෙන අභයගිරි චෛත්‍ය ඉදිකිරීමට අපි සමත් වූයෙමු. එවැනි විසල් නිර්මාණයක් කිරීමට අපේ මුතුන් මිත්තන් පෙළඹුණේ වැඳුම් පිදුම් කිරීමට පමණක් නොවන බව ඉතා පැහැදිලිය. එය එදා ශ්‍රී ලාංකිකයාගේ හැකියාවේ සහ අභිමානයේද සංකේතයකි. එදා ලෝකයේ පෙරදිග ධාන්‍යාගාරය බවට අප රට පත් වූයේ අපටම අනන්‍ය වූ දේශීය වාරි තාක්‍ෂණයේ මහිමයෙනි. අනෙක් සෑම ශිෂ්ටාචාරයක්ම ආරම්භ වූයේ ගංගා ඔස්සේ  ස්වාභාවිකව ගලන ජලය ආශ්‍රිතවය. නමුත් අපි, වැසි ජලය මිනිසා විසින් නිර්මාණය කළ ඉංජිනේරුමය ව්‍යුහයක් වූ 'වැව'ට එක්රැස් කොට සොරොව්වක් මඟින් ජලය බෙදා හැරීමේ තාක්‍ෂණය ලෝකයට හඳුන්වා දුන්නෙමු. එදා මිනිසා සහ අද මිනිසා අතර ඇති වෙනස කුමක්ද ?

අප රටේ ජෛව විවිධත්වය හා බැඳුණු දේශීය දැනුම් පද්ධතිය, විශේෂයෙන්ම දේශීය වෛද්‍ය ක්‍රමය ලෝකයේ කිසිදු දියුණු ශිෂ්ටාචාරයක පවතින තත්වයකට දෙවැනි නොවේ. අද නටබුන් වී ඇති අප ජාතියේ ඓතිහාසික උරුමයන් සාක්ෂි දරන්නේ ජාතියක් ලෙස අප සතු වූ දැනුම් පද්ධතියේ අසම සම බව මිස අන් කුමක්ද ? වී උරුමය සංස්කෘතියක් ලෙස අද ජීවත් වන මිනිසා තුළ සැඟව නැතැයි කිසිවකුට කිව හැකිද ?

යුද්ධමය වශයෙන් බලසම්පන්න රටවල් විවිධ කාල වකවානුවලදී අප රට ආක්‍රමණය කළද අපි ඔවුන්ට කැමැත්තෙන් යටත් නොවූයෙමු. අපේ මුතුන් මිත්තන් දීර්ඝකාලීනව ආක්‍රමණිකයන් සමඟ සටන් වැදුනේ යටත්වී ජීවත් වීම අපගේ ශිෂ්ටාචාරගත සංස්කෘතිය නොවූ හෙයිනි. කෙසේ වෙතත් අවසානයේ ශ්‍රී ලංකාව නාමිකව හෝ නිදහස දිනා ගත්තේ එම සටන්වල ප්‍රතිඵල නිසා මිස ආක්‍රමණිකයාගේ අනුකම්පාව නිසා නොවන බව අපි ඉතා හොඳින් දනිමු.

නාමිකව හෝ ලබාගත් නිදහස භාවිතා කරමින් එදා පටන් අපි සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජන කොටස් එකාවන්ව ශ්‍රී ලාංකික ජාතිය ලෙස අපගේ ජාතික රාජ්‍යය ගොඩනැඟීමට කටයුතු කළෙමු. අපි අපගේ සාම්ප්‍රදායානුකූල කෘෂිකර්මාන්තය නඟා සිටුවන අතර අපගේම වූ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැඟීමටද උත්සාහ කළෙමු. වී වගේම අපි රාජ්‍ය ආයතන පද්ධතියක් සහ ආරක්‍ෂක

හමුදාවන් ගොඩනැඟුවෙමු. සියලු බාධක මැද්දේ වුවද, සාධාරණත්වය මත පදනම් වූ ලෝකයේ දියුණුතම සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපන සේවා පද්ධතීන් ගොඩනැඟීමට අපි සමත් වූයෙමු.

එහෙත් ඉන්දියාවේ සිදුවූවාක් මෙන් අප ජාතියක් ලෙස ඉතා ගැඹුරින් සමාජීය වශයෙන්, ආර්ථික වශයෙන් සහ සංස්කෘතික වශයෙන් වූ වහල්භාවයෙන් මිදීම සඳහා දීර්ඝ කාලීන අනවරත සටනක නියැළුනේ නැත. ඒ නිසාම, අප තුළ වූ මානසික වහල්භාවයෙන් සම්පූර්ණයෙන්ම ගැලවීමට අපට නොහැකි විය. එසේම අප ගොඩනැඟූ අධ්‍යාපන ක්‍රමය තුළින් අපගේ ශිෂ්ටාචාරය සැබැවින්ම නියෝජනය කරන මිනිසා නිර්මාණය වූයේ නැත. එවැනි තත්වයක් තුළ අපට අප සතු වූ විශ්මිත ජෛව විවිධත්වයෙන් උපරිම ප්‍රතිපල නෙළා ගැනීමට ලැබුනේ නැත. ඒ වෙනුවට අප අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පිටරටින් ආනයනය කර පරිභෝජනය කරන ජාතියක් බවට පත් විය. තේ, පොල්, රබර් ආදී වැවිලි අපනයනවලින් උපයන ආදායම තිරිඟු පිටි සහ කිරිපිටි ආනයනය කිරීමට යෙදවීම අපට ලජ්ජාවට කරුණක් වූයේ නැත. කෘෂි අපනයන ආර්ථිකය වුවද අප විසින් ගොඩ නැඟුවේ අපට ස්වාභාවික වෙළඳපොළ වාසිය අත්වන තේ, කුරුඳු, ගොරක, කුළු බඩු සහ ඖෂධීය නිෂ්පාදනවලට වටිනාකම් එකතු කරමින් නොවේ. ඒ වෙනුවට අප ඉතා සුළු ලාභයකට සකස් නොකළ කුළු බඩු කොහුබත්, විසිතුරු මසුන්, ගර්කින්, කජු සහ මල් ආදී වශයෙන් සුද්දා කියන දේ ඔහුට ඕනෑ හැටියට සහ ඔහු කියන මිලට රට පැටවීමට ක්‍රියා කළෙමු.

එසේම අමුද්‍රව්‍ය අපනයනය කරනවා වෙනුවට නිමි භාණ්ඩ අපනයනය කිරීම සඳහා අපගේ කර්මාන්තකරුවන් උපරිමයෙන් දිරිමත් කිරීමට සහ ශක්තිමත් කිරීමට අප උත්සාහ කළේ නැත. ඒ නිසාම අප රටේ ''ටාටා බිර්ලා''වරුද බිහි වූයේ නැත. තවද අප රට වටේට වූ අසීමිත සාගර සම්පත් සහ ඛණිජ සම්පත් වලින් මෙන්ම වරායවල් වලින්ද උපරිම ප්‍රයෝජන ගැනීමට අප උනන්දු වූයේ නැත. ඒ වෙනුවට අපගේ සියලු නීති රීති ලිහිල් කොට බදු ගෙවන්නන්ගේ අරමුදලින් සහනාධාර දෙමින් පිටරටින් ව්‍යාපාරිකයන් මෙහි පැමිණෙන තෙක් අපි බලා සිටිමු.

එහි ප්‍රතිඵලයක් ලෙස පිටරටින් මෙහි පැමිණියේ යල් පැනගිය හෝ පරිසරයට හානිකර තාක්ෂණය සහිත කර්මාන්ත අතලොස්සක් පමණි. අවසානයේ දේශීය සහ විදේශීය ප්‍රාග්ධනය බහුලව ආයෝජනය වන කර්මාන්තය බවට පත් වූයේ ඇඟළුම් කර්මාන්තයි. එයද ඉහළ වෙළඳපොළට යැවෙන විලාසිතා ඇඟළුම්වලට වඩා අඩු මිල ඇඳුම් සහ ඇතිරිලි ආදියට සීමා විය. එයින් ඇත්ත වශයෙන්ම රටට ලැබුණේ 'අඩු මිල ශ්‍රමයේ' ප්‍රතිලාභ පමණි.

එසේම අප රටේ ජෛව විවිධත්වයේ අසිරිය සහ අපගේ ශිෂ්ටාචාරගත උරුමයේ වටිනාකම මෙන්ම දේශීය වෛද්‍ය ක්‍රමයේ ශක්තිය මත පදනම්ව සංචාරක කර්මාන්තය දියුණු කරනවා වෙනුවට අපි හිරු එළිය, මුහුදු වැල්ල සහ බාල සතුට විකිණීම මුල් කොට ගත් සංචාරක කර්මාන්තයක් පවත්වාගෙන යන්නෙමු. ඒ නිසාම එයින් අපට ලැබෙන විදේශ විනිමය ප්‍රතිලාභය අප විසින් හෝටල් ඉදිකිරීම සඳහා ආයෝජනය කොට ඇති සම්පත්වලට සාපේක්ෂව කිසිසේත්ම සාධාරණ වන්නේ නැත. බොහෝ දුරට අද අප රටට අඩු මිලට බාල සතුට සොයා එන්නේ දුප්පත් සංචාරකයන් පිරිසකි. ඔවුන් අප රටේදී වියදම් කරන මුදල ඒක පුද්ගල මධ්‍ය අගයක් ලෙස ගතහොත් ඇමරිකන් ඩොලර් 500ක් තරම් වූ සොච්චම් මුදලකි.

මහවැලිය ආශ්‍රිතව කෘෂි කර්මාන්තයේ නවෝදයක් ඇති කිරීමට අප සමත් වුවද, ඒ හරහා සම්ප්‍රදායානුකූල ග්‍රාමීය වාරි පද්ධති ආශ්‍රිත කෘෂි පරිසර පද්ධතීන්ට සිදු වූ හානිය අපි නොසලකා හැරියෙමු. ඒ තත්වය තුළ කෘෂිකර්මාන්තයට යම් වාණිජ මුහුණුවරක් ලැබුණද, දීර්ඝ කාලීනව ග්‍රාමීය කෘෂි නිෂ්පාදන ආර්ථිකය තුළ සාධාරණ වර්ධනයක් සිදු වූයේ නැත. අවසානයේ වාණිජ කෘෂි

කර්මාන්තයේ නාමයෙන් පිටරට පැටවීම සඳහා කෘෂි නිෂ්පාදන රාශියකට භූමිය සහ වෙනත් සම්පත් විශාල වශයෙන් යෙදවූවද, එයින් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය ආහාර ආනයනය කිරීම සඳහාවත් ප්‍රමාණවත් වූයේ නැත. ඊට අමතරව ධීවර කර්මාන්තයද සම්ප්‍රදායානුකූල මට්ටමින් ඔබ්බට ගෙන යාමට අප අසමත් වී ඇති බැවින් රට වටකොට මුහුද ඇති රටකට ටින්මාළු ආනයනය කිරීමට සිදු වී ඇත.

නිදහසින් පසුව සිදුවූ මේ සියලු පීලි පැනීම් එසේම තිබියදී අපි සියලු සමාජ ආර්ථික දෝෂයන්ට එකම ප්‍රතිකාරය ලෙස නගර ආශ්‍රිත වෙළඳාම මුල්කොට ගත් ඊනියා නිදහස් වෙළඳ ආර්ථික මොඩලයක් තෝරාගෙන ඉදිරියට යමින් සිටිමු. ඒ තුළ විදේශීය රටවලින් පොලියට ලබා ගන්නා අති විශාල ණය කන්දරාවක් යටිතල පහසුකම් නමින් හැඳින්වෙන සමස්ත ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයන්ට පිටස්තරින් අලවා ඇති විවිධ ඉංජිනේරුමය ව්‍යුහයන් ඉදි කිරීම සඳහා වැය කරන්නෙමු. ඒවායේ සැබෑ දීර්ඝකාලීන ආර්ථික ප්‍රතිලාභ කෙසේ වෙතත් අවසානයේ එම ආයෝජනවලින් යම් කෙටි කාලීන මූල්‍යමය ප්‍රතිලාභයක් වේ නම් ඒවා අත්වන්නේද සංඛ්‍යාලේඛන විජ්ජා පෙන්වන රාජ්‍ය නිලධාරීන්ට සහ විදේශීය කොන්ත්‍රාත්කරුවන්ට මෙන්ම දැනටමත් නාගරික පහසුකම් භුක්ති විඳින අතලොස්සක් වූ බදු ගෙවන්නන් පිරිසකට පමණි. එම ආයෝජනවලින් නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලියට දායක වීමේ අවස්ථාව ලැබෙන තෙක් බලා සිටින සහ වක්‍ර බදු ගෙවමින් රාජ්‍යය නඩත්තු කරන බහුතරයක් මහජනතාවට නව ආර්ථික ඉඩප්‍රස්ථා විවර වන්නේ නැත.

ලංකාවේ වැඩිම කුඩා වැව් ඝනත්වය ඇති කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක අවම වශයෙන් කුඩා වැව් 3500ක් ප්‍රතිසංස්කරණය කිරීමට වැයවන මුදල හෙවත් රු. කෝටි 350ක් සෘජු ආර්ථික ප්‍රතිලාභ පැත්තෙන් ඉතා නොවැදගත් ගුවන් පාලමක් ඉදිකිරීමට වැය කරන්නේ ණය දෙන ආයතන විසින් තෝරා දී ඇති ඉහත සඳහන් සංවර්ධන මොඩලය නිසාය. අඩුම වශයෙන් එම ගුවන් පාලම ඉදිකිරීම නිසා එම මුළු මුදලින් 50%කට වැඩි කොටස විදේශ විනිමය ලෙස ශ්‍රී ලංකාව හරහා ගමන් කරන්නේවත් නැත. ඉතිරිය විශාල දේශීය සමාගමක (විදේශීය) ගිණුමට බැරවේ. අවසානයේ ආයෝජනයේ කෙටි කාලීන ප්‍රතිලාභ ලෙසවත් ප්‍රදේශයේ බහුතරයක් ජනතාවගේ ජීවිතවලට බලපෑමක් වන්නේ නැත. දුම්රිය හරස් පාර උඩින් බාධාවක් නැතිව වේගයෙන් ගියද ගමනට ගතවන කාලය අවසානයේ තීරණය වන්නේ අද සිදුවන පරිදිම බස් රියදුරන්ගේ ආකල්ප සහ ආර්ථික උවමනාව මතය.

අප රට අද මේ ආකාරයට ලෝකයේ ඉහලම ණය බරක් සහිත රටක් බවට පත් වන්නේ සංවර්ධන මොඩලයේ පවතින මෙම පටලවා ගැනීම නිසා බව ඉතා පැහැදිලිය. එම පටලවා ගැනීම නිවැරදි කිරීමකින් තොරව ජාතියක් ලෙස අපට ඉදිරියට යා නොහැකි බව ඉතා පැහැදිලිය. මතුපිටින් පැලැස්තර ඇලවීමෙන් හෝ 'ටින්කරින්' කිරීමෙන් එම වරද නිවැරදි කිරීම කළ නොහැක. එය සිදු කළ හැක්කේ සැබෑ ලෙසම උපාය මාර්ගිකව නිවැරදි සහ අප රටට උචිත සංවර්ධන මොඩලයක් තේරීමෙන් පමණි.

එම තත්වය තුළ මව්බිම ලංකා පදනම ලෙස අප ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවගෙන් සහ දේශපාලන පක්ෂ සහ සංවිධානවලින් ඉල්ලා සිටින්නේ නිදහස් වෙළඳාම මත පදනම් වූ නාගරික යටිතල පහසුකම් සංවර්ධන මොඩලය වෙනුවට බහුතරයක් ජනතාවට ඵලදායී ලෙස ආර්ථික ක්‍රියාවලියට දායකවීමට හැකි ජාතික නිෂ්පාදනය ඉහළ නැංවෙන සහ අප රට ලෝකයේ ඉහළට මසවා තැබෙන නිෂ්පාදන ආර්ථික මොඩලයක් තේරිය යුතු බවකි. අවසානයේ රටට වාසිදායක ලෙස වෙළඳාම දියුණු වන්නේද එහි ප්‍රතිඵලයක් ලෙස මිස වෙළඳාමට පහසුකම් සැපයීම සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය මුල්කොට ගත් ඊනියා නිදහස් වෙළඳ ආර්ථිකය තුළ නොවේ.

එවැනි ජාතික ආර්ථික මොඩලයක් තුළ බහුතරයක් පොදු මහජනතාවගේ ඵලදායී දායකත්වයට ආර්ථිකය තුළ ඉඩ ප්‍රස්ථා විවර වනු ඇත. ඒ තුළ දේශීය කර්මාන්තකරුවා ශක්තිමත් වන අතර ආනයන විකල්ප රට තුළ නිපදවීම සඳහා මෙන්ම රටට වාසිදායක වන ආකාරයට වටිනාකම් එකතු කළ නිෂ්පාදන අපනයනයට වැඩි ඉඩ කඩ විවෘත වේ. ඒ තුල දේශීය කෘෂි නිෂ්පාදනය ඉහල නැංවෙන අතර අත්‍යවශ්‍ය ආහාර ආනයනය සඳහා විදේශ විනිමය වැය කිරීම අවම වනු ඇත. එමෙන්ම ඒ තුළ දේශීයව ප්‍රාග්ධනය ගොඩනැඟීමට ප්‍රමුඛතාව ලබා දෙන අතර විදේශ ණය ප්‍රාග්ධනය යොදවනු ඇත්තේ ණය දෙන ආයතනවල කොන්දේසිවලට අනුව නොව සෘජුව ජාතික නිෂ්පාදනයට අවශ්‍ය දායකත්වය සපයන යටිතල පහසුකම් සඳහාය.

# < 5 >
# උපාය මාර්ගික යෝජනා

රණවිරුවෝ මේ වන විට තම ජීවිත පූජා කරමින් අපගේ මව්බිම ත්‍රස්ත ග්‍රහණයෙන් මුදා ගැනීමේ සටන පූර්ණ ජයග්‍රහණයෙන් අවසන් කිරීමට සමත් වී සිටිති. එම ජයග්‍රහණ අප රටේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට සැබෑ ලෙසම භුක්ති විඳීමට ලැබෙන්නේ ආර්ථික ක්ෂේත්‍රයේද සැබෑ ජයග්‍රහණ සඳහා ඉතිහාසයේ ලැබී ඇති මෙම ස්වර්ණමය අවස්ථාව ප්‍රයෝජනයට ගතහොත් පමණි. ඒ නව ප්‍රවේශය තුළ රටේ සමස්ත ජනතාවගේ බලාපොරොත්තු දැල්විය යුතු අතර බහුතරයකට ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ සක්‍රීය කොටස්කරුවන් බවට පත්වීමේ ඉඩකඩ විවර විය යුතුය. ඒ සඳහා මව්බිම ලංකා පදනම විසින් පහත සඳහන් ආකාරයට උපායමාර්ගික ප්‍රවේශයන් 10ක් තුළ අතුරු යෝජනා ඉදිරිපත් කෙරේ.

**01. දේශීය කර්මාන්ත පද්ධතිය ශක්තිමත් කොට සැබෑ ශ්‍රී ලාංකේය වෙළඳ නාම දේශීයව සහ විදේශීයව ප්‍රචලිත කිරීම සහ දේශීය කර්මාන්තකරුවා සමාජයේ ඉහළට ඔසවා තැබීම සඳහා රජය පූර්ණ ලෙස මැදිහත් වීම, ඒ සඳහා අවශ්‍ය අරමුදල් දේශීයව විකල්ප නිෂ්පාදන ඉදිරිපත් කිරීමේ හැකියාව සහ විභවය තිබියදී ආනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා පනවනු ලබන ජාතික ආර්ථික සෙස් බද්දක් මඟින් උපයා ගත යුතුය. එම ප්‍රවේශයේදී,**

1.1 පළමු අදියර තුළ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන කෑමට ගන්නා සියලුම තෙල් වර්ග වලට, පාවහන් ඇතුලු සියලුම රබර් ආශ්‍රිත නිෂ්පාදනවලට, ආනයනය කරනු ලබන තේ, තිරිඟු පිටි, කිරිපිටි, චොක්ලට්, බිස්කට් ඇතුළු රසකැවිලි සහ රූපලාවන්‍ය නිෂ්පාදන වලට ජාතික ආර්ථික සෙස් බද්දක් පැනවීම. මෙම බද්ද නිර්ණය කිරීමේදී අදාළ නිෂ්පාදනවල දේශීය විකල්ප නිෂ්පාදනය ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළ මිල මට්ටම අනුව බදු ප්‍රමාණය ඒකකයකට අය කෙරෙන ආකාරයට එක් එක් නිෂ්පාදනය සඳහා වෙන් වශයෙන් තීරණය කල යුතුය. අත්‍යවශ්‍ය ආහාර ලයිස්තුව වහා සංශෝධනය කළ යුතු අතර උදාහරණයක් ලෙස පිටිකිරි, තිරිඟු පිටි සහ අර්තාපල් එයින් ඉවත් කළ යුතුය. තිරිඟු පිටි සඳහා අදාළ අපනයන රටේදී 20% පමණ විශේෂ සෘජු සහනාධාරයක් ලබා දෙන බැවින් දේශීය වෙළඳපොළ තුල සාධාරණව තරඟ වැදීමේ මූලධර්මය යටතේ තිරිඟු පිටි සඳහා අවම වශයෙන් අමතර 20% බද්දක් පැනවිය යුතුය.

1.2 ශ්‍රී ලංකාවේ අමුද්‍රව්‍ය අවම වශයෙන් 60%ක් යොදා ගනිමින් නිෂ්පාදනය කරන භාණ්ඩ වල ප්‍රචාරක වියදම්, ආදායම් බදු ගණනය කිරීමේදී 100%ක් වියදම් ලෙස එකතු කිරීමට අවසර ලබා දීම. එසේම එම භාණ්ඩ අපනයනය කිරීමේදී විදේශීය රටවල සිදු කරන ප්‍රචාරක වියදම්වලින් කොටසක් පියවීම සඳහා අපනයන වටිනාකමින් (දේශීයව එකතු කළ වටිනාකමින්) 1%ක මුදලක් සහනාධාර ලෙස ලබා දීම (එම සහනාධාරය ගෙවිය

යුත්තේ අපනයන වටිනාකමට අදාළ සමස්ත විදේශ විනිමය ප්‍රමාණය රට තුළට බැරවීමෙන් පසුව වන අතර එය සියලුම දේශීය වෙළඳ නාම යටතේ අපනයන කරනු ලබන නිෂ්පාදන සඳහා ලබා දිය යුතුය.)

1.3 ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් සපයන දේශීයව වටිනාකම් එකතු කිරීම 33%ට වඩා වැඩි කර්මාන්ත අභිනවයෙන් ඉදිකිරීමේදී, පුළුල් කිරීමේදී හෝ නවීකරණය කිරීමේදී ඒ සඳහා ණය ප්‍රාග්ධනය ලබා ගැනීමේදී එම ණය ප්‍රමාණයෙන් 50%ක් සඳහා 50%ක පොලී සහනාධාරයක් ලබා දීම. එය එසේ දැනට ලබාගෙන නොගෙවා ඇති ණය සඳහාද වලංගු විය යුතුය. එසේම ඒ ආකාරයට නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හෝ ගුණාත්මකව වැඩි දියුණු කිරීම සඳහා සෘජුව දායක වන යන්ත්‍ර සූත්‍ර සහ උපාංග ආනයනයේදී සියලුම බදු වර්ග අයත් වන ලෙස දැනට පවතින මට්ටමින් 50%ක සහනාධාරයක් ලබා දීම. මෙම සහනාධාර ලබා දීමේදී අදාළ කර්මාන්තයෙන් ජාතික ආර්ථිකයට කෙරෙන තීරණාත්මක බලපෑම අනුව සියළුම කර්මාන්ත ලැයිස්තු ගත කළ යුතුය. එහිදී ආනයන විකල්පයක් වීම, ශුද්ධ විදේශ විනිමය ආදායම් ප්‍රතිශතය, නව තාක්ෂණය හඳුන්වා දීම, රැකියා උත්පාදනය වන ප්‍රමාණය, ප්‍රාග්ධනයේ දේශීය හිමිකාරීත්වය (60%) ආදී කාරණා සැලකිල්ලට ගත යුතුය. ඒ අනුව, සහනාධාර ලබා දෙනුයේ ඒ ආකාරයට ප්‍රමුඛතාවන් අනුව ලැයිස්තුගත කෙරෙන දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයතන සඳහා පමණි. ඒ මඟින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජනවල දිශානතිය තීන්දු කිරීමද අපේක්ෂා කෙරේ. කර්මාන්තවල ප්‍රමුඛතාව නිර්ණය කිරීමේදී කෘෂි නිෂ්පාදනවල නාස්තිය අවම කිරීම, කල් තබා ගැනීම සහ පාරිභෝගික ඉල්ලුම සඳහා ආනයන විකල්ප ලෙස නව නිෂ්පාදන ඉදිරිපත් කිරීම ආදිය මුල් කොට ගත් කර්මාන්ත සඳහා විශේෂ අවධානයක් හිමි විය යුතුය.

1.4 ආයෝජන මණ්ඩල පනත මඟින් දේශීය ව්‍යාපාරිකයා අභිබවා විදේශීය ආයෝජකයින්ට ලබා දෙන විශේෂ සහන සියල්ල අහෝසි කිරීම සහ මෙතෙක් ආයෝජන මණ්ඩල පනත යටතේ ලබා දුන් සියලු සහන සහ ඊට එරෙහිව ලබා ගත් ප්‍රතිලාභ පිළිබඳව පුළුල් විමර්ශනයක් කිරීම සඳහා මහජනයාට අදහස් පළ කල හැකි කොමිසමක් පිහිටුවීම. ඒ අනුව, පනතේ 18 වැනි වගන්තිය සංශෝධනය කළ යුතුය. ඊට අමතරව 16 වගන්තියේ සහන සියල්ල නව කර්මාන්ත සඳහා ලබා දිය යුතුය. දේශීය හෝ විදෙශීය වශයෙන් වන කුමන ආකාරයේ ආයෝජනයකදී වුවද සහන ලබා දීම තීරණය විය යුත්තේ අදාළ කර්මාන්තය ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වයේ ප්‍රමාණය මතය. ඒ අනුව ජාත්‍යන්තර වෙළඳපොළ තුළ (සහ ශ්‍රී ලංකාව තුළ) සන්සන්දනාත්මක වාසිය වැඩි වශයෙන් ලබා ගත හැකි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත ප්‍රමාණයක් තෝරා එම කර්මාන්ත ජාතික වැදගත්කමක් ඇති කර්මාන්ත ලෙස නම් කොට ඒවාට උපරිම සහන සහ වරප්‍රසාද ලබා දීම සඳහා නීතිමය වශයෙන් ආවරණය ලබා දිය යුතුය. පළමු වටයේදී එම නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහළ මට්ටමට ගෙන ඒම සඳහා අවශ්‍ය තාක්ෂණික මැදිහත්වීම පූර්ණ රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදු කිරීම සඳහා අරමුදල් සහ යාන්ත්‍රණ හඳුන්වා දිය යුතුය. (උදාහරණ ලෙස පහත සඳහන් කර්මාන්ත සලකා බැලිය හැකිය. නිමි තේ, නිමි කුරුඳු නිෂ්පාදන, දේශීය ඖෂධ වර්ග සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය, බිස්කට්, චොකලට් සහ රසකැවිලි, පාවහන්, වතුර මොටර්, රබර් ආශ්‍රිත නිෂ්පාදන, බයිසිකල්)

1.5 සැබෑ ශ්‍රී ලාංකේය නිෂ්පාදන මහජනයා අතර ප්‍රචලිත කිරීමට (දේශීයව සහ විදේශීයව) ස්වෙච්ඡාවෙන් කටයුතු කරන සියලු සංවිධාන සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම,

(විශේෂයෙන්ම මාධ්‍ය අනුග්‍රහය) ඒ අනුව, උදාහරණයක් ලෙස මව්බිම ලංකා පදනම විසින් යෝජනා කොට ඇති පරිදි පාසල්වල **සූර්යසිංහ ළමා සමාජ** ගොඩ නැඟීම හරහා කුඩා කාලයේ සිටම දේශීයත්වය අගය කිරීමේ මානසිකත්වය ඇති කිරීමේ වැඩපිළිවෙළට අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රහය ලබා දීම සහ රජයේ මාධ්‍යවලින් සතියකට යම් නිශ්චිත කාලයක් ලබා දීම. (ඒ අනුව, බාලදක්ෂ ව්‍යාපාරය හා සමාන ආකාරයකින් සූර්ය සිංහ ව්‍යාපාරයද ප්‍රචලිත කෙරෙනු ඇත. මෙම ව්‍යාපාරය මඟින් දේශීයත්වය ප්‍රචලිත කිරීමට අමතරව අධ්‍යාත්මිකව උසස් මනසකින් ක්‍රියා කරන සහ විශිෂ්ටයින් වීමට උත්සාහ කරන දරුවන් බිහිකිරීම අරමුණු කෙරේ.) විශේෂයෙන්ම දේශීයත්වය සහ ජාතියේ අභිමානය සහ හැකියාව මතු කෙරෙන ටෙලිනාට්‍ය සඳහා රාජ්‍ය මාධ්‍ය ආයතනවලින් ප්‍රමුඛතාවක් ලබා දීමද මීට අයත් වේ. ඒ සඳහා විශේෂ කාල පරාසයක්ද වෙන් කළ යුතුය. දැන්වීම්කරණයේදී හැකිතාක් දේශීයව නිපදවන දැන්වීම් භාවිතා කිරීම දිරිමත් කිරීම සඳහා විදේශීය රූපවාහිනී වෙළඳ දැන්වීම් සඳහා අධෛර්යය කිරීමේ බද්දක් පැනවිය යුතුය.

**02. සාගර සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා රාජ්‍ය අංශය, ධීවර සමුපකාර සමිති, පෞද්ගලික සමාගම්, දේශීය සුළු ආයෝජකයින් මෙන්ම විදේශීය රැකියා නියුක්තිකයන් ආදී වශයෙන් වන සමාජයේ විවිධ ක්ෂේත්‍රවල නියැලී සිටින ව්‍යවසායක මනසක් සහිත පිරිස් සහ ආයතනවලට කොටස් ලබා ගත හැකි ආකාරයට මහජන ධීවර නිෂ්පාදන සමාගම් ජාලයක් ගොඩනැඟීම සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා රජය පූර්ණ ලෙස මැදිහත් වීම.**

2.1 මහජන ධීවර සමාගම් හරහා මහජන ප්‍රාග්ධනය සහ රාජ්‍ය බැංකුවලින් ලබා ගන්නා ණය ප්‍රාග්ධනයද යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ සමස්ත සාගර කලාපය ආවරණය කළ හැකි වන ආකාරයට මහා පරිමාණ ධීවර නාවික යාත්‍රා 10ක් මිලදී ගෙන ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සඳහා භාවිතයට ගැනීම. ප්‍රායෝගිකව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සන්නිවේදන සහ තාක්ෂණික සහය මෙන්ම ආරක්ෂක සහ පුහුණු කටයුතු සඳහාද ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහාය ලබා ගත යුතුය. ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහාය රජය හරහා නිල වශයෙන් මෙන්ම අවබෝධතා ගිවිසුම් මත වාණිජ වශයෙන්ද ලබා ගත යුතුය. එමෙන්ම, පිරිස් බලය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශ්‍රාමික නිලධාරීන් යොදා ගත යුතුය. (මෙම මහා පරිමාණ ධීවර නාවික යාත්‍රා යොදා ගැනීමේදී සුළු සහ මධ්‍ය පරිමාණ ධීවර කටයුතුවලට බාධාවක් නොවන නිර්ණායක යොදා ගත යුතුය. මෙහිදී, නාවික හමුදාව ජාතිය වෙනුවෙන් සාගර සම්පත්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වන ආර්ථික බල ඇණියක් බවට පත් කළ යුතුය.

2.2 ආනයනික මත්ස්‍ය නිෂ්පාදන සහ ටින්මාළු සඳහා ධීවර සංවර්ධන සෙස් බද්දක් අයකොට ඒ මඟින් මධ්‍ය ප්‍රමාණයේ ධීවර යාත්‍රා නිෂ්පාදනයට මෙන්ම ඒවා මිලදී ගැනීම සඳහා ණය පොලී සහනාධාර ලබා දීම සඳහා අරමුදලක් ගොඩනැඟීම. තවද, එම අරමුදලින් යම් ප්‍රතිශතයක් මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා යෙදවීම. එසේම උසස් මට්ටමේ ධීවර යාත්‍රා දේශීයව නිපදවීමේ කර්මාන්තය දියුණු කිරීම සඳහා 'සී-නෝර්' ආයතනය, 'ඩොක්යාඩ්' ආයතනය සහ නාවික හමුදාව සතු සම්පත් තාක්ෂණය සහ යාන්ත්‍රණ ඒකාබද්ධ කොට ක්‍රියාත්මක කිරීම.

2.3 කිසිදු විදේශීය සමාගමකට ශ්‍රී ලංකාවට අයත් මුහුදේ මසුන් මැරීම සඳහා අවසර ලබා නොදීම. දැනට ලබා දී ඇති අවසරයන් අහෝසි කළ යුතු අතර විදේශීය ධීවර ආයතන

දේශීය ව්‍යාපාරික ආයතන සමඟ එක් වීමේදී විදේශික සමාගම් උදෙසා 40%ක උපරිම ආයෝජනයකට පමණක් අවසර ලබා දිය යුතුය. දැනට ගැඹුරු මුහුදේ සිදු කෙරෙන විශේෂයෙන් විදේශීය යාත්‍රා මඟින් මසුන් මැරීම නැවැත්වීම සඳහා නාවික හමුදාවේ සහාය ලබා ගත යුතු අතර එම නීතිවිරෝධී ක්‍රියාවන්ට සහාය දක්වන දේශීය තැරව්කරුවන්ට එරෙහිව නීති මඟින් කටයුතු කළ යුතුය.

2.4 සාගර විශ්වවිද්‍යාලයට නාරා ආයතනය අනුබද්ධව නාවික හමුදාවේ සහාය ඇතිව සාගර සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ කිරීම සඳහා සහ ඒ ආශ්‍රිත ව්‍යාපෘති දියත් කිරීම සඳහා සමස්ත ජාතික පර්යේෂණ අරමුදල් ප්‍රමාණයෙන් අවම වශයෙන් 10%ක් යෙදවීම. (මිරිදිය ජලාශ ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති සඳහා ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන සහ විශ්ව විද්‍යාල යොදා ගත යුතු අතර, සමස්ත පර්යේෂණ අරමුදලෙන් ප්‍රතිශතයක් ඒ සඳහා වෙන් කළ යුතුය.)

2.5 මිරිදය ධීවර කර්මාන්තය ඓතිහාසිකව පැවති ආකාරයට කෘෂිකර්මාන්තය සමඟ ඒකාබද්ධ වන නිෂ්පාදන ව්‍යාපෘතියක් ලෙස දියුණු කිරීම. එහිදී සෑම වැවකම ධීවර කර්මාන්තය ගොවි සංවිධානය යටතට පත් කළ යුතු අතර, වෘත්තීය මිරිදිය ධීවරයන් බිහි කිරීම දිරිමත් නොකළ යුතුය. ඒ වෙනුවට කෘෂිකර්මාන්තයට අමතරව ධීවර කර්මාන්තයේ යෙදෙන ගොවීන් පුහුණු කළ යුතුය. මිරිදිය මසුන් බෝ කිරීම සඳහා වන රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කොට කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රමුඛතාව සහිතව අරමුදල් යෙදවිය යුතු අතර ධීවර සෙස් අරමුදලෙන් යම් ප්‍රතිශතයක් ඒ සඳහා වෙන්කළ යුතුය. මිරිදිය මසුන් බෝකර ජලාශවලට මුදා හැරීමේ ක්‍රියාවලිය සඳහා සහනාධාර ලබා දීම මඟින් ස්වේච්ඡා සංවිධාන, විශ්ව විද්‍යාල, පෞද්ගලික ආයතන ආදිය දිරිමත් කළ යුතුය.

**03. කෘෂි කර්මාන්තය සමඟ සත්ව පාලනය ඒකාබද්ධ කොට ගොවියා මුල් කොට ගත් තිරසාර කෘෂි නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලියකට පණ දීම සහ ජාතික ආරක්ෂාව හා සමාන බරකින් ජාතියේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම. ඒ සඳහා සියලුම ආනයනික පළතුරු, එළවළු සහ ධාන්‍ය වර්ග සඳහා යම් නිශ්චිත කාලයක් සඳහා සෙස් බද්දක් පනවා අරමුදල් සොයා ගැනීම සහ ආහාර සුරක්ෂිතතාවට අදාළව නව පාර්ලිමේන්තු පනතක් සම්මත කර ගැනීම.**

3.1 ආහාරයට ගත හැකි වාර්ෂික හා බහුවාර්ෂික බෝග ජාතික මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා, විශේෂයෙන්ම කොස්, දෙල් සහ මයියොක්කා ප්‍රචලිත කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම. මේ සඳහා සියලුම රාජ්‍ය ආයතන, පාසල් සහ ස්වේච්ඡා සංවිධාන යොදාගත යුතු අතර ඉඩකඩ ඇති ගෙවතු, රජයේ ඉඩම් සහ මඟ දෙපස මෙන්ම වනාන්තර ලෙස වැවීමද මේ සඳහා ප්‍රයෝජනයට ගත යුතුය. එහිදී ඒ සඳහා අවශ්‍ය උසස් මට්ටමේ පැළ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ආයතන තෝරාගෙන යම් සහනාධාර මුදලක් ගෙවීමෙන් දිරිගැන්වීමක් ලබා දිය යුතුය. රෝපණ ද්‍රව්‍ය සපයන ප්‍රමාණය අනුව, එවැනි කටයුතු සඳහා නායකත්වය සපයන ගොවි සංවිධාන, පරිසර සංවිධාන ඇතුළු ස්වේච්ඡා සංවිධානවල නඩත්තුව සඳහා යම් අරමුදල් ප්‍රමාණයක්ද ලබා දිය යුතුය. එසේම තේ සහ රබර් වැවිලි සඳහා වෙන් කොට ඇති භූමිය තවදුරටත් වර්ධනය කිරීම නොකළ යුතු අතර දැනට තිබෙන භූමි ප්‍රමාණයෙන් උපරිම ඵලදායීතාව ලබා ගැනීම සඳහා පාංශු සංරක්ෂණ මහා සැලසුමකට යටත්ව අදාළ වතු මට්ටමින් සැලසුම් සකස් කළ යුතුය. ඒ සඳහා පාංශු සංරක්ෂණ පනත සංශෝධනය කොට නීතිමය විධිවිධාන ඇති කළ යුතු අතර අමාත්‍යාංශය යටතේ පරිපාලන යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. මහා පරිමාණ

පොල්වතු කැඩීම වැළැක්වීම සඳහා දැඩි පියවර ගන්නා අතර කුඩාවතු සහ ගෙවතු ආශ්‍රිතව අනෙකුත් ඵල දරන බෝග සමඟ පොල් වගාව දිරිමත් කළ යුතුය.

3.2 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම වගකීම ලෙස එම ආයතනය ආශ්‍රිතව බාහිර කිරි ගොවීන්ටද සම්බන්ධ විය හැකි ආකාරයට ජාතික කිරිගව අභිජනන වැඩසටහනක් ආරම්භ කිරීම. ඊට සමගාමීව කිරි දෙනුන් මැරීම වැළැක්වීම සඳහා මහජන කමිටු පිහිටුවීමට පන්සල් සහ පොලිසිය සමඟ කටයුතු කළ යුතු අතර විකුණනු ලබන දෙනුන් නැවත වඩා හොඳින් රැකබලා ගන්නා කිරි ගොවියකු අතට පත් කිරීම සඳහාද දෙනුන් නැවත බෙදා හැරීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කළ යුතුය. ඒ ආකාරයට දෙනුන් මිලදී ගැනීම සඳහා 50%ක පොලී සහනාධාරයක් රජය මඟින් ලබා දිය යුතුය. බෝග වගාව සමඟ කිරිගව පාලනය ඒකාබද්ධ කරනු ලබන ගොවීන් විශේෂයෙන් දිරිගැන්වීම සඳහා දිරිගැන්වීම් ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. එවැනි ගොවීන්ට ගොවි ණය හෝ වෙනත් සහනාධාර ලබා දීමේදී ප්‍රමුඛතාව දිය යුතුය. එමෙන්ම ආනයනික කිරිපිටි දිය කිරීමෙන් දියර කිරි හා ඒ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන නිපදවීම අධෛර්ය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. ඒ අනුව කිරිවල ඇති ස්වාභාවික කිරි මේදය ඉවත් කොට බාහිරින් එකතු කරන ලද මේදය සහ මෙලමයින් ප්‍රමාණය මෙන්ම, කිරිපිටි දියකිරීමෙන් සාදන ලද නිෂ්පාදනයක්ද යන්න භාණ්ඩයේ පැහැදිලිව පෙනෙන ලෙස මුද්‍රණය කළ යුතුය. ඒ මඟින් දේශීය නැවුම් එළකිරි වෙළඳපොළ පුළුල් කිරීම අපේක්ෂා කෙරේ. නැවත සකස් කළ පිටිකිරි වර්ග සැබෑ පිටිකිරි ලෙස ප්‍රචාරය කොට විකිණීම තහනම් කළ යුතුය. (මේ සඳහා ආහාර සුරක්ෂිතතා පනත මඟින් නීතිමය ප්‍රතිපාදන ඇති කළ යුතුය.)

3.3 දේශීය ආහාර ප්‍රචලිත කිරීම සඳහා රෝහල්වල, පාසැල්වල, ආරක්ෂක හමුදා සහ පොලිසි තුළ තිරිඟු පිටි භාවිතය සම්පූර්ණයෙන්ම නැවැත්වීම සඳහා පෝෂණය මුල් කොට ගත් පරිපාලන තීන්දුවක් ගැනීම. ඊට සමගාමීව 100%ක් සහල්පිටි නූඩ්ල්ස් ඇතුළු සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කරන ආයතන දිරිමත් කිරීම සඳහා ප්‍රාග්ධනයට 50%ක පොලී සහනාධාර සහ 100%ක වැට් බදු සහන ලබා දිය යුතුය. එමෙන්ම, කිරිපිටි සහ තිරිඟු පිටි ප්‍රචලිත කිරීම සඳහා ජනමාධ්‍ය යොදා ගැනීම, පෝෂණ හේතු සහ ළමයින් පෙළඹවීමට අදාළ ආචාර්ය ධර්ම යටතේ සම්පූර්ණයෙන්ම තහනම් කළ යුතුය. ඊට අමතරව සහල් සඳහා පාලන මිලක් නියම කිරීම දිගටම පවත්වාගෙන යා යුතු අතර සහල්වල මිලට වඩා 20%කින් වැඩි මිලක් තිරිඟු පිටි සඳහා නියම වන ලෙස තිරිඟු පිටි සඳහා වන බදු නිර්ණය කළ යුතුය.

එමෙන්ම, මහා පරිමාණ සහල් මෝල් හිමියන් විසින් සහල් වෙළඳපොළ පාලනය කිරීම වැළැක්වීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ සහල් මොල් හිමියන්ට කාර්යක්ෂමව වෙළඳපළ තුළ ක්‍රියාත්මක විය හැකි පසුබිමක් සකස් කළ යුතුය. ඒ අනුව, වී මිල දී ගැනීම සඳහා මහා පරිමාණ මෝල් හිමියන්ට ලබා දෙන සහන පොලී ණය පහසුකම් ප්‍රමාණය සමූපකාර මඟින් වී මිලදී ගැනීම සඳහා යෙදවිය යුතු අතර මිල නියම කොට එම වී විකිණිය යුත්තේ කුඩා සහ මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට පමණි.

3.4 වී වගාව සහ ධාන්‍ය නිෂ්පාදන දීර්ඝකාලීනව රැක ගැනීම සඳහා සහ දියුණු කිරීම සඳහා අවශ්‍ය දේශීය බීජ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මුල්කොටගෙන බතලගොඩ වී පර්යේෂණ ආයතනය සහ මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනය ජාතික උපාය මාර්ගික ආයතන දෙකක් සේ නම්කොට සුවිශේෂී පරිපාලන සහ අධීක්ෂණ ව්‍යුහයක් තුළ

දියුණු කිරීම. ඒවා විදේශීය ණය දෙන ආයතනවල සහ විවිධ විදේශීය පර්යේෂණ ආයතනවල අයුතු බලපෑම් වලින් තොරව කළමණාකරණය කිරීම සඳහා රට පිළිගත් විද්වතුන්, ගොවීන් මෙන්ම මහජන ක්‍රියාකාරිකයන්ගෙන් සමන්විත පාලක මණ්ඩල පත් කළ යුතු අතර, ඒවායේ ක්‍රියාකාරීත්වය පොදු මහජනයාගේ සහ ගොවීන්ගේ ප්‍රශ්න කිරීමට සහ සොයා බැලීමට යටත් කිරීම සඳහාද යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය. රජය සතු සියලු ගොවිපොළ ජාතික බීජ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා වාණිජ පදනමින් තොරව පූර්ණ වශයෙන් යොදා ගැනීමද මීට අයත් වේ.

3.5 ග්‍රාමීය කුඩා වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා ගොවීන්ට සහභාගී විය හැකි සහ නායකත්වය ලබා ගත හැකි ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකිවන ලෙස විශේෂ පරිපාලන යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ඒ සඳහා වන වියදමින් 50%ක් සහ තාක්ෂණික සහය රජය මඟින් ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. ඒ සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභාව සහ ගොවි සංවිධාන සහ ස්වෙච්ඡා සංවිධාන එක්වන ලෙස යාන්ත්‍රණයක් සකස් විය යුතු අතර ජාතික අරමුදලක් පිහිටුවිය යුතුය. පරිසර සංවිධාන, පාසල් සහ විශ්ව විද්‍යාල සිසුන් සම්බන්ධ කර ගනිමින් කෘෂි වන වගාව, පාංශු සංරක්ෂණය සහ ජලය එක්රැස් කිරීම් යන ත්‍රිත්ව ක්‍රියාකාරීත්වය සඳහා ස්වෙච්ඡා ශ්‍රමය, දැනුම සහ අරමුදල් රැස් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කල යුතුය. ඒ සඳහා නායකත්වය සපයන සහ එවැනි ජාතික ව්‍යාපෘතියක් කළමනාකරණය කිරීමට ඉදිරිපත් වන ස්වෙච්ඡා සංවිධාන සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දිය යුතුය.

**04. විදේශ විනිමය නාස්ති කිරීම අවම කිරීම සඳහා මහජනයා පෙළඹවීම, විදේශ විනිමය ඉපැයීම දිරිමත් කිරීම සහ දේශීය ප්‍රාග්ධන හැකියාව ශක්තිමත් කිරීම. සහ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වලදී ශ්‍රී ලංකාවට සාධාරණව ලැබිය යුතු වාසි ලබා ගැනීම සඳහා මැදිහත් වීම. ඒ සඳහා,**

4.1 ඉදිරි වසර 3ක කාලය තුළ පෞද්ගලික පාවිච්චිය සඳහා දෙවන වාහනයක් ආනයනය කිරීමේදී සහ පෙර ආනයනය කළ හෝ අලුතින් මිලදී ගත් වාහනයට වසර 7ක් ගතවීමට පෙර අළුත් වාහනයක් ආනයනය කිරීමේදී වාහනයේ වටිනාකමට සමාන මුදලක් ආනයන බලපත්‍රයක් නිකුත් කිරීම හරහා අය කිරීම.(සාමාන්‍යයෙන් අය කරන බදුවලට අමතරව) එමෙන්ම ජංගම දුරකථනයකට අවශ්‍ය අවම විශේෂාංග ඉක්මවා යන වැඩි වටිනාකම් සහිත දුරකථන සඳහා වෙළඳපොළ මිලට අනුව 100%ක නව බද්දක් පැනවීම. එසේම ශ්‍රී ලංකාවේ ආනයන බිලේ ඉහළම ඇති ද්‍රව්‍ය 10ක ආනයනය 20%කින් අඩු කිරීම සඳහා මහජනයා සමඟ ගැඹුරු සාකච්ඡාවක යෙදීම. (මෙම ද්‍රව්‍ය 10 අතරට ආනයනය කරන රසායනික පොහොර වර්ග අයත් නොවේ නම් 11 වැන්න ලෙස එයද ඇතුළත් කළ යුතුය.)

4.2 විදේශ සේවා නියුක්තිකයන් තම විදේශීය අරමුදල් රජය අනුමත කළ දේශීය ව්‍යාපෘතිවල ආයෝජනය කොට එම කොටස් මුදල් වසර 05ක කාලයක් තබා ගැනීමේදී එසේ ආයෝජනය කළ මුදලින් 2%කට සමාන මුදලක කොටස් මිලදී ගැනීම සඳහා රජය විසින් සහනාධාරයක් ලබා දීම. විදේශීය ඉතුරුම් ජාතික සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේ දිශාවට ආයෝජනය කිරීමේ අරමුණින් ආරම්භ කරනු ලබන පොදු සමාගම්වල හෝ රාජ්‍ය සමාගම්වල ආයෝජනය කිරීම දිරි ගැන්වීම සඳහා මහ බැංකුව, කොටස් වෙළඳපොළ සහ කොටස් වෙලඳපොළ පාලන කොමිසමේ සහයෝගය ඇතිව සම්බන්ධීකරණ කාර්යාලයක් පිහිටුවිය යුතුය. ඊට අමතරව රටට විදේශ විනිමය ඉපයීම සඳහා දුක් විඳිනා විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය සඳහා විදේශ සේවා කාර්යාංශය හරහා අවම වශයෙන්

ඉන්දියාව සහ පිලිපීනය අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණය හෝ ඉතා කඩිනමින් හඳුන්වා දිය යුතුය.

4.3 සියලුම ලොතරැයි දිනුම්වල තෑගි මුදල් අධි සුඛෝපභෝගී වාහන සහ පෞද්ගලික නිවාස ඉදිකිරීම හෝ මිලදී ගැනීම සඳහා යොදවන්නේ නොමැතිව කර්මාන්තයක හෝ කෘෂි ව්‍යාපෘතියක යොදවන්නේ නම් (තෑගි මුදලින් අවම වශයෙන් 90%ක්) එම තෑගිලාභීන්ට එවැනි ආයෝජනයක් සහතික කිරීමෙන් පසුව සාමාන්‍ය තෑගි මුදලට අමතර 5%ක තෑගි මුදලක් ලබා දීම(තෑගිලාභියාගේ කැමැත්ත මත). දේපළ විකිණීම හෝ තෑගි ලෙස විශාල ප්‍රාග්ධනයක් ලැබෙන පුද්ගලයන් එම මුදල්වලින් 80%කට වැඩි ප්‍රමාණයක් කෘෂිකාර්මික හෝ කර්මාන්ත ව්‍යාපෘතිවල ආයෝජනය කරන අවස්ථාවල එම අරමුදල් 100% ක්ම ප්‍රාග්ධන බද්දෙන් නිදහස් කළ යුතුය.

4.4 විදේශීය බැංකු සහ සන්නිවේදන ආයතන විසින් කරනු ලබන ප්‍රචාරක කටයුතුවලදී ප්‍රචාරක වියදම් 100%ක්ම බදු ගණනය කිරීමේදී වියදම් ලෙස අඩු කිරීමට ඉඩ නොදිය යුතු අතර වසරකදී පිටරට රැගෙන යන ලාභය ආයෝජනය කරන ලද මුදලින් 20% ඉක්මවා නොයන ලෙස සීමාවක් පැනවිය යුතුය. ඊට සමගාමීව දේශීය සමාගම්වල අපනයන නිෂ්පාදනවල ආනයන කොටස 40% වඩා අඩු නිෂ්පාදන සඳහා විදේශ විනිමය ආදායම් වැඩිවීමේ ප්‍රතිශතයට සාපේක්ෂව දිරිගැන්වීම් ආදායම් බදු සහන ලෙස ලබා දිය යුතුය. එසේ සහන ලබා දිය යුත්තේ විදේශ විනිමය ආදායම 100%ක් රට තුලට බැර කරන අවස්ථාවල පමණි.

4.5 ඉන්දියාව සමඟ සීපා ගිවිසුම පිළිබඳව සාකච්ඡා කිරීමට පෙර දැනට පවතින නිදහස් වෙළඳ ගිවිසුමට අදාළව ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිෂ්පාදන ක්ෂේත්‍ර 10කට අයත් ප්‍රබල සැබෑ ශ්‍රී ලාංකීය වෙළඳ නාම 10ක් සඳහා ඉන්දියානු වෙළඳපොළ තුල ඉඩ ලබා ගැනීම සඳහා බදු නොවන බාධක ඉවත් කිරීම පිළිබඳව එකඟතාවකට පැමිණිය යුතුය. එම තත්වය අවුරුදු 2ක කාලයක් ඇගැයීමෙන් පසුව සීපා ගිවිසුම පිළිබඳව සාකච්ඡා ආරම්භ කළ යුතුය. ඒ ආකාරයට ඉන්දියානු වෙළඳපොළට පිවිසීම සඳහා තෝරා ගැනෙන වෙළඳ නාම ප්‍රචලිත කිරීම සඳහා රජය විසින් තානාපති අංශ හරහා උපරිම පරිපාලන සහ රාජතාන්ත්‍රික මැදිහත්වීම සිදු කළ යුතුය.

**05. බලශක්ති අර්බුදයට විසඳුම් සෙවීම සහ පවතින බලශක්ති වෙළඳපොළ කාර්යක්ෂම කිරීම සඳහා පරිසර හිතවාදී සහ තිරසාර ජාතික ඒකාබද්ධ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. එහිදී,**

5.1 අවම වශයෙන් හෙක්ටයාර් 60,000ක බිම් ප්‍රමාණයක් උක් වගා කිරීම හරහා රටට අවශ්‍ය සීනිවලට අමතරව පෙට්‍රල් අවශ්‍යතාවට සමාන ප්‍රමාණයකින් එතනෝල් දේශීයව නිපදවීම. මේ සඳහා ජාතික වශයෙන් අවශ්‍ය වන සීනි කර්මාන්ත ශාලා 05 සඳහා දැනට පැලවත්ත සමාගමේ ධාරිතාව වැඩිකිරීම ඇතුළුව, හිඟුරාන, සෙවණගල, කන්තලේ කර්මාන්තශාලා නවීකරණය කිරීම හෝ නැවත ඉදිකිරීම සිදු කළ යුතු අතර අමතරව නව කර්මාන්තශාලාවක් ඉදි කළ යුතුය. එමෙන්ම, ඒ සඳහා අවශ්‍ය ආයෝජන රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව සහ අවශ්‍ය නම් විදේශ ආයෝජන දිරිගැන්වීම් මඟින් ලබා දිය යුතුය. එමෙන්ම ඒ සඳහා ඉඩම් ලබා ගැනීමේදී කිසිදු වනාන්තරයක් විනාශ කිරීමෙන් හෝ එළි පෙහෙළි කිරීමෙන් වැළකී දැනට වගා නොකරන අර්ධ නිසරු බිම් ඒ

සඳහා තෝරා ගත යුතුය. තවද උක් වගාව ආශ්‍රිත බහුවාර්ෂික සහ වාර්ෂික ආහාර බෝග නිෂ්පාදනය සහ සත්ව පාලනය ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම සඳහා රජය යම් සහනාධාර ප්‍රමාණයක් ලබා දිය යුතුය. මේ සඳහා පෞද්ගලික අංශයට බදු සහන, ආයෝජනය සඳහා පොලී සහනාධාර සහ යන්ත්‍ර සූත්‍ර සඳහා තීරු බදු සහන උපරිමයෙන් ලබා දිය යුතුය. ඊට අමතරව උක් සඳහා ගොවියාට සහතික මිලක් නියම කිරීමද රජය විසින් කළ යුතුය. මෙම සමස්ත ක්‍රියාවලියේදී සීනි නිපදවීම, විදුලිය නිපදවීම, එතනෝල් නිපදවීම, කිරි නිපදවීම, සත්ව ආහාර නිපදවීම සහ කිරි ආශ්‍රිත සකස් කළ ආහාර නිපදවීම සහ පාරිසරික සංචාරක කර්මාන්තය ඒකාබද්ධ වන මොඩලයක් හඳුන්වා දිය යුතුය.

5.2 එතනෝල් යොදාගෙන ධාවනය කරන වාහන (මෝටර් සයිකල් සහ කුඩා කාර්) දේශීයව නිපදවීම හෝ එකලස් කිරීමේ කර්මාන්ත මෙන්ම පවතින වාහනවලට එතනෝල් භාවිතය සඳහා අවශ්‍ය අමතර කොටස් නිෂ්පාදන කර්මාන්තය දිරි ගැන්වීම සඳහා උක් වගාව සඳහා ලබා දෙන සහන සියල්ල ලබා දිය යුතුය. එසේම සම්පූර්ණයෙන්ම එතනෝල් යොදා ධාවනය කිරීම සඳහා වෙනස් කළ වාහනවලට එතනෝල් (පානය කළ නොහැකි ලෙස සකස් කරන ලද) විකිණීම සඳහා අවසරය ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ මධ්‍යස්ථානවලට මෙන්ම භාජනවල පුරවා සීල් කරන ලද එතනෝල් විකිණීමේ අවසරය බලයලත් පෞද්ගලික සිල්ලර වෙළඳසැල්වලටද ලබා දිය යුතුය. එතනෝල් යොදා ධාවනය කරන වාහන සඳහා ආදායම් බලපත්‍ර ගාස්තුව 50%කින් අඩුකළ යුතය. ජාතියක් ලෙස පෙට්‍රල්වලින් එතනෝල්වලට මාරු වීම ක්‍රමානුකූල ක්‍රියාදාමයක් වන බැවින් මුල් කාලයේ තෝරාගත් ප්‍රදේශවල පෙට්‍රල්වලට යම් එතනෝල් ප්‍රතිශතයක් එකතු කිරීම කළ යුතු අතර ක්‍රම ක්‍රමයෙන් එය ඉහළ දැමිය යුතුය. එකතු කරන ලද එතනෝල් ප්‍රතිශතයට අනුව මිල අඩු කිරීම සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දිය යුතුය.

5.3 එල්.පී. ගෑස් මිලදී ගැනීමේදී මහජනයාට තමන්ට අවශ්‍ය ගෑස් ප්‍රමාණය තමා දැනට මිළ දී ගෙන ඇති ඕනෑම සිලින්ඩරයකට පුරවාගත හැකි ආකාරයට ගෑස් බෙදා හැරීම කාර්යක්ෂම කිරීම සඳහා නව නීති රෙගුලාසි හඳුන්වා දීම. ඒ මඟින් ගෑස් සිලින්ඩර තොග වශයෙන් එහා මෙහා ප්‍රවාහනය කිරීම වෙනුවට විශාල ගෑස් ටැංකි ප්‍රාදේශියව සවි කිරීම මඟින් මහජනයාට තමන්ට අවශ්‍ය ප්‍රමාණයට ගෑස් මිලදී ගැනීමේ අවස්ථාව ලබා දිය යුතුය. ඒ තුළ, සිලින්ඩරවලට මිලදී ගැනීමේදී සෑම විටම කි.ග්‍රෑ. 01කට වැඩිපුර ගෙවීමට සිදුවීමේ ගැටළුවද නිරාකරණය වේ. එහිදී ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සතු ගෑස් එම සංස්ථාව මඟින් ත්‍රීරෝද රථ සඳහා පමණක් ලබා දීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා හිමිකම් ලබා දිය යුත්තේ මීටර් සවිකිරීමට හෝ කුමන හෝ අචාරධර්ම පද්ධතියකට එකඟ වන ත්‍රී රෝද රථ සඳහා පමණි. දේශීයව නිපදවන ගෑස් විකිණීම සඳහා වෙනමම මිල සූත්‍රයක් හඳුන්වා දිය යුතුය.

5.4 හිරු එළියෙන්, සුළං බලයෙන් සහ වෙනත් විකල්ප ආකාරයෙන් අමතර බලශක්තිය උපදවන සහ ප්‍රයෝජනයට ගන්නා ආයතනවලට එම ආයතන විසින් ජනනය කරන ප්‍රමාණයට සාපේක්ෂව විදුලි බල මණ්ඩලය හරහා විදුලි බිලට ලබා දෙන සහනාධාරයක් ලෙස අවම වශයෙන් 10%ක සහනාධාරයක් ලබා දීම. ජාතික පද්ධතියෙන් විදුලි බලය ලබා නොගෙන විකල්ප ක්‍රම මඟින් සම්පූර්ණයෙන්ම බලශක්ති අවශ්‍යතාව සපුරාගන්නා ආයතන වලටද එසේ නිපදවන සමස්ත බලශක්ති ප්‍රමාණයට සාපේක්ෂව සහනාධාරයක් ලබා දිය යුතුය.

5.5 නගර සභාවලින් සහ රාජ්‍ය ආයතනවලින් විවිධ ආයතන සහ මහජනයා සතු පෞද්ගලික ගොඩනැඟිලි සඳහා බදු අයකිරීමේදී එම ගොඩනැඟිලි බලශක්ති කාර්යක්ෂමතාවන්ට අනුව ශ්‍රේණිගත කොට බදු අයකිරීම් සූත්‍ර හඳුන්වා දිය යුතුය. එහිදී බලශක්ති කාර්යක්ෂමතාව නොසලකා සැලසුම් කරන සහ ඉදිකරනු ලබන හෝ පසුව වෙනස් කොට ප්‍රයෝජනයට ගන්නා ආයතන සඳහා දණ්ඩන බද්දක්ද අය කළ යුතුය. ඒ මඟින් දවස පුරා විදුලි ආලෝකය සහ වායු සමීකරණය කිරීම සඳහා විදුලිය බහුලව භාවිතා කිරීමට සිදුවන ගොඩනැඟිලි සඳහා 10% ක දණ්ඩන බද්දක් අය කළ යුතු අතර එය ජාතික පරිසර සංරක්ෂණ අරමුදලකට යෙදවිය යුතුය.

**06. සමස්ත ජාතියේම පොදු ඵලදායීතාව ඉහළ නැංවෙන ආකාරයට සහ සමාජ සාධාරණත්වය මෙන්ම පාරිසරික සාධාරණීත්වයද රැකෙන ආකාරයට පොදු පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම. පොදු පහසුකම් සඳහා යොදවන ජාතික සම්පත්වල නාස්තිය අවම කිරීම සහ තිබෙන සම්පත් වඩා කාර්යක්ෂම ලෙස නැවත යෙදවීම.**

6.1 රටේ ප්‍රධානතම මඟී ප්‍රවාහන මාධ්‍ය බවට දුම්රිය සේවය පත්කිරීම සහ මන්නාරම සහ කන්කසන්තුරේ දක්වා දුම්රිය සේවය යථා තත්වයට පත් කිරීම අප රටේ ප්‍රධානතම සංවර්ධන ව්‍යාපෘතිය ලෙස නම් කිරීම. එසේම අනාගතයේ සිදුකරන සියලුම නාගරික සංවර්ධන ව්‍යාපෘති දුම්රිය ගමනාගමන පහසුකම් පාදක කර ගනිමින් සිදු කිරීම. ඒ සඳහා දුම්රිය පාදක නාගරික සහ උප නාගරික සංවර්ධන අධිකාරියක් පිහිටුවිය යුතු අතර ඒ අනුව, නගර සහ නාගරික පොදු පහසුකම් ඉදිකිරීම දුම්රිය ගමනාගමන පහසුවට සාපේක්ෂව තීන්දු කෙරෙනු ඇත. එම නගර ආශ්‍රිතව සිදුකෙරෙන වාණිජ සහ නිවාස ව්‍යාපෘතිවලින් උපයන ආදායමෙන් 50%ක් දුම්රිය සංවර්ධනය සඳහා නැවත යෙදවිය යුතුය. එහිදී ප්‍රධාන නගර කොළඹට යා කරන දුම්රිය මාර්ගවල ධාවනය කරන දුම්රිය ප්‍රමාණය සහ පහසුකම් වැඩි කිරීම සඳහා වන ආයෝජන සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතුය.

6.2 හම්බන්තොට නගරය ශ්‍රී ලංකාවේ උප අගනගරය ලෙස නම් කොට හම්බන්තොට වරාය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වරාය ලෙස ගොඩනැඟීම. ඒ තුළ හම්බන්තොට-කොළඹ දුම්රිය සේවාව සහ හම්බන්තොට සිට ත්‍රිකුණාමලය, ගාල්ල, කොළඹ වරායවල් අතර නාවික භාණ්ඩ ප්‍රවාහන සේවයක් ආරම්භ කිරීම සඳහා ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතාව ලබා දීම. ඊට අමතරව දුම්රිය මුල්කොටගත් භාණ්ඩ ප්‍රවාහන සේවය රටේ ප්‍රධානතම භාණ්ඩ සේවාව ලෙස ආරම්භ කිරීම. ඒ සඳහා පෞද්ගලික බෙදාහැරීම් ආයතනද සම්බන්ධ කර ගත යුතුය. එහිදී දුම්රිය දෙපාර්තමේන්තුව සතු සියළු ගබඩා සංකීර්ණ උපරිම කාර්යක්ෂමතාවයෙන් ප්‍රයෝජනයට ගත යුතුය. එමෙන්ම ඊට සමගාමීව භාණ්ඩ ප්‍රවාහනය සඳහා වන බර වාහන ආනයනය අධෛර්ය කිරීම සඳහා අමතර බදු මුදලක් අයකළ යුතු අතර බහාලුම් ප්‍රවාහනය කරන බරවාහන ධාවනය රාත්‍රී කාලයට පමණක් සීමා කළ යුතු අතර දිවා කාලයේ නතර කර තබන ස්ථාන පිළිබඳවද මාර්ග තදබද අවම වන ආකාරයට නිර්ණායක හඳුන්වා දිය යුතුය.

6.3 දුම්රිය මැදිරි සහ සැහැල්ලු දුම්රිය එන්ජින් සහිත මැදිරි දේශීයව නිපදවීම සඳහා දේශීය ව්‍යවසායකයන් දිරිමත් කිරීම. ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව ප්‍රයෝජනයට නොගන්නා ප්‍රාදේශීය අංගනයන් කොන්දේසි යටතේ ලබා දිය යුතුය. එම ව්‍යවසායකයන් සමඟ ඉදිරි වෙළඳ ගිවිසුම් ඇතිකර ගැනීම මඟින් ආයෝජන දිරිමත් කිරීම සඳහා රජය මැදිහත් විය යුතුය.

6.4 මහාමාර්ග සංවර්ධනයේදී සුවිශේෂී තෝරාගත් මාර්ග ඉතා ඉහළින් ගොඩනැඟීම සහ අනෙකුත් මාර්ග අත්හැර දැමීමේ ප්‍රවේශයෙන් ඉවත් වී සමස්ත රටේම ආර්ථික සංවර්ධන අවශ්‍යතාවට සාපේක්ෂව අවශ්‍ය මාර්ග ජාලයේ පොදු කාර්යක්ෂමතාව ඉහළ නැංවෙන ආකාරයේ මාර්ග සංවර්ධන ජාතික සැලැස්මක් සකස් කිරීම. ඒ තුළ නව අධිවේගී මාර්ග ඉදිකිරීම මෙන්ම නව ගුවන් පාලම් ඉදිකිරීමද අවම වශයෙන් වසර 05ක කාලයක් සඳහා කල් දැමිය යුතුය. එමෙන්ම, කොළඹ නගරයට ඇතුළුවන ප්‍රධාන ස්ථාන සහ දුම්රිය ස්ථාන ආශ්‍රිතව රථ ගාල් ඉදි කොට එම ස්ථානවල ඉතා සුළු අයකිරීමක් සහිතව වාහන ගාල් කිරීමේ පහසුකම් ලබා දීම සහ එම ස්ථානවල සිට විශේෂ බස්රථ සේවයක් කොළඹ නගරය තුළට චක්‍රීයව ධාවනය කිරීමද සිදු කළ යුතු වේ. එසේම රාජ්‍ය ආයතන, විශේෂයෙන්ම අමාත්‍යාංශ සඳහා නව ගොඩනැඟිලි ඉදි කිරීම මෙන්ම පෞද්ගලික අංශයෙන් කුලියට ගැනීම අත්හිටුවා දැනට තිබෙන රාජ්‍ය ආයතනවල ඉඩකඩ පිළිබඳ සමීක්ෂණය කොට අතිරික්ත ඉඩ භාවිතා කිරීම කළ යුතුය.

6.5 එසේම රට තුළට ආනයනය කරන ත්‍රිරෝද රථ සඳහා වර්ෂයකට යම් සීමාවක් පැනවීම සහ ත්‍රිරෝද රථවලට මීටර් සවිකිරීම අනිවාර්ය කිරීම. එමෙන්ම කුඩා මෝටර් සයිකල් අමතර කොටස් දේශීයව නිපදවීමේ සහ ඒවා දේශීයව එකලස් කිරීමේ සහ පාපැදි දේශීයව නිපදවීමේ කර්මාන්ත සඳහා රජය බදු සහන සහ ආයෝජන පොලී සහනද ලබා දිය යුතුය. එසේම කෙටි ගමන් සඳහා පාපැදි භාවිතා කිරීමට මහජනයා පොළඹවන අධ්‍යාපන සහ සංස්කෘතික ක්‍රියාකාරකම් හඳුන්වාදීමට රාජ්‍ය මාධ්‍ය ආයතන යම් නිශ්චිත ඉඩ ප්‍රමාණයක් වෙන් කළ යුතුය.

**7.0 රටේ සමස්ත මහජනතාවට ආර්ථිකයට දායක වීමට අවශ්‍ය ආර්ථික ඉඩ ප්‍රස්ථා වැඩි කිරීම සහ ජාතිය සතු වගාවට යෙදවිය හැකි භූමියෙන් උපරිම ඵලදායීතාවය ලබා ගැනීමේ ප්‍රවේශය තුළ තරුණ තරුණියන් සඳහා විශේෂ ප්‍රමුඛතාවක් ලබා දීම සහ ඔවුන් දිරිමත් කිරීම සඳහා විශේෂ සහන සහ අනුග්‍රහය ලබා දීම.**

7.1 තරුණ නිෂ්පාදන සමුපකාර ජාලයක් බිහි කිරීම මඟින් සත්ව පාලනය සහ සාමූහික ගොවිපොළ සංවර්ධනය සඳහා තරුණ තරුණියන් යොමු කිරීම. එහිදී එම සමුපකාර සඳහා රජය මඟින් පොලී රහිත ප්‍රාග්ධනය සැපයීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම මඟින් අරමුදල් ලබා දීම හරහා ඒවායේ ක්‍රියාකාරීත්වයට මූලික සහාය ලබා දිය යුතුය. එම විශේෂ සමුපකාරවලට තාක්ෂණය සහ පරිපාලන සහාය ලබා දීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් සමුපකාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කළ යුතුය. මෙම තරුණ නිෂ්පාදන සමුපකාර ජාලය ජාතික මට්ටමේදී දැවැන්ත තරුණ බලවේගයක් හෙවත් හමුදාවක් බවට පත් කිරීම සඳහා විධිමත් ජාතික මට්ටමේ සංවිධාන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.

7.2 දැනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ පවතින සහ අවිධිමත්ව පවරාදී ඇති සියලු ඉඩම් පිළිබඳව ඉතා කඩිනමින් නැවත සමීක්ෂණය කිරීම සහ සාමූහික හෝ පෞද්ගලික ගොවිපොළ ආරම්භ කිරීම සඳහා වගාවට සුදුසු ඉඩම් රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා යම් කොන්දේසි යටතේ ලබා දීම. මෙම ඉඩම් ලබා දීමේදී නිෂ්පාදන සමුපකාරයක් පිහිටුවීම පූර්ව කොන්දේසියක් ලෙස සැලකිය යුතුය. ජාතිය සතු භූමියෙන් උපරිම ඵලදායීතාව ලබා ගැනීම සඳහා වන මෙම ක්‍රියාදාමයේදී යුද්ධ හමුදාව හැරගිය පිරිස් මෙන්ම විශ්‍රාම ගිය පිරිස්වලින් උපරිම ඵලදීයීතාවය ලබා ගැනීම සඳහාද ප්‍රමුඛතාව

ලබා දිය යුතුය. ඊට අමතරව ජාතිය සතු භූමියෙන් යම් ප්‍රමාණයකින් රටට ආර්ථික ප්‍රතිලාභ ලබාදීම සඳහා යුද්ධ හමුදාවද සෘජුව සම්බන්ධ කරගත යුතුය.

7.3 කෘෂිකර්මාන්තය සහ සත්ව පාලනය ජීවන වෘත්තිය ලෙස තෝරාගෙන නිෂ්පාදන සමුපකාරවලට ගොනුවන තරුණ තරුණියන් සඳහා වසර 2ක කාලයකට මාසික යැපීම් දීමනාවක් ලබා දීම සහ විධිමත්ව සහ ආකර්ෂණීය ලෙස කෘෂි නිෂ්පාදන සහ සත්ව පාලන කටයුතු කිරීම සඳහා අවශ්‍ය ඇඳුම්, අත්වැසුම්, බූට්ස් ආදිය මෙන්ම කුඩා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රජය මඟින් සහනාධාරයක් ලබාදීම.

7.4 තරුණ තරුණියන්ට නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදෙන අතර කෘෂිකර්මාන්තය සහ සත්ව පාලනය ආශ්‍රිතව අඛණ්ඩව අධ්‍යාපනය ලබා ගැනීම සඳහා විවෘත විශ්ව විද්‍යාල හරහා කෙටි කාලීන අධ්‍යාපන පාඨමාලා සහ ප්‍රායෝගික පුහුණු පාඨමාලා හඳුන්වා දීම. ඔවුන්ට විවිධ මට්ටම්වලින් ලබා ගන්නා සුදුසකම් අනුව අවසානයේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය අර්ධකාලීනව ලබාගත හැකි ආකාරයේ ජාතික විවෘත කෘෂි විශ්ව විද්‍යාලයක් ආරම්භ කල යුතුය. ඒ සඳහා පවතින කෘෂි විද්‍යාපීඨවල අමතර සම්පත් භාවිතා කළ යුතුය.

7.5 කෘෂිකර්මාන්තය සහ සත්ව පාලනය ජීවන වෘත්තිය ලෙස තෝරාගත් තරුණ තරුණියන්ට තමා තෝරාගත් අලුත් ජීවිතය පිළිබඳ ආශ්වාදයක් සහ ආකර්ෂණයක් ඇතිවන ආකාරයේ අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු හඳුන්වා දීම සහ ඒ සඳහා රජයේ ජනමාධ්‍ය තුළ විශේෂ ඉඩකඩක් වෙන් කිරීම. එහිදී, තරුණ තරුණියන් අතර ගොවිපලේ වැඩ කරන ගමන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබාගන්නා, සවස හරකා බැඳ ගෙට ඇවිත් පෞද්ගලික පරිගණකයෙන් අන්තර්ජාලයේ සැරිසරමින් ලෝක ආර්ථික සහ සමාජ දේශපාලන තොරතුරු සොයා යන සහ පසුදා උදෑසන අවදි වී තමා විසින්ම කිරි දොවා පානය කරන උසස් දෙමුහුන් දේශිය සංස්කෘතියක් ඇති කිරීම සඳහා එම අධ්‍යාපන සහ සංස්කෘතික ක්‍රියාකාරකම් භාවිතා කළ යුතුය.

**08. ජාතියට අවශ්‍ය කරන විසල් මනසක් සහිත සෑම අතින්ම විශිෂ්ටයන් විය හැකි විභවය සහිත මානව සම්පතක් ගොඩනැඟීම සඳහා අධ්‍යාපන පද්ධතිය කාර්යක්ෂම සහ ප්‍රතිඵලදායී ලෙස යොදා ගැනීම. ඒ සඳහා,**

8.1 රටපුරා භූගෝලීය වශයෙන් සහ ජන පැතිරීමට අනුව පාසැල් 1000ක් විශේෂ ආදර්ශ පාසල් ලෙස (දැනට ජාතික පාසැල් ලෙස හඳුනා නොගන්නා පාසල් අතරින්) තෝරාගෙන විශේෂ ව්‍යාපෘතියකට යටත්ව අවුරුදු 05ක කාලයක් සඳහා විශේෂ මැදිහත් වීමක් සිදු කිරීම. එම විශේෂ ව්‍යාපෘතිය යටතේ වන පාසල්වල අධ්‍යාපනික සහ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල සංවර්ධනය සඳහා විශේෂ ජාතික මට්ටමේ තාක්ෂණික භාරකාර මණ්ඩලයක් සහ අරමුදලක් පිහිටුවිය යුතුය. නමුත් එම පාසල්වල මූලික පරිපාලන වගකීම අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේම පැවතිය යුතුය. එම භාරකාර මණ්ඩලයට රටේ පිළිගැනීමට ලක්වූ ස්වාධීන විද්වතුන් සහ සමාජ ක්‍රියාකාරිකයන් පත් කල යුතු අතර ඒවායේ ක්‍රියාකාරීත්වය තුළ විනිවිදභාවය සහ සමාජ වගකීම තහවුරු කිරීම සඳහා මහජනයා විසින් ප්‍රශ්න කළ හැකි සහ අධීක්ෂණය කළ හැකි යාන්ත්‍රණයක්ද සකස් කළ යුතුය. මෙම පාසල්වලට විදුහල්පතිවරුන් තේරීම, ගුරුවරුන් තේරීම සහ සිසුන් තේරීම සඳහා විශේෂ නිර්ණායක සකස් කළ යුතුය. එම පාසල් මඟින් ප්‍රදේශයේ යම් පෝෂණ ප්‍රදේශයක පවතින පාසල්වලට ආදර්ශය සහ තාක්ෂණික සහාය ලබා දෙනු ඇත. මෙම පාසල් ජාලයට අධ්‍යාපනික සහ තාක්ෂණික සහාය ලබා දීම සඳහා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත්

වන ආයතන සහ පුද්ගලයන්, විශේෂයෙන් විශ්‍රාමලත් විද්වතුන් සම්බන්ධ කිරීම සඳහාද ස්වේච්ඡා ශ්‍රමය සහ දැනුම කළමනාකරණය කිරීමේ ආයතනයක් පිහිටුවිය යුතුය.

8.2 මෙම විශේෂ ව්‍යාපාති පාසල් සියල්ලේම භාෂා සහ තොරතුරු තාක්ෂණ පරීක්ෂණාගාර පිහිටුවීම සහ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂා තුනම ඉතා හොඳින් ඉගැන්වීමටත් මාධ්‍ය ලෙස මව්බසින් පමණක් (සිංහල හෝ දෙමළ) ඉගැන්වීමටත් කටයුතු කිරීම. මෙම පාසල්වලට තෝරාගන්නා විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට විශේෂ දීමනාවක් ලබා දිය යුතු අතර දුෂ්කර ප්‍රදේශවලට යාමට කැමති ගුරුවරුන්ට නේවාසික පහසුකම් ඉදිකිරීමට කටයුතු කළ යුතුය.

8.3 පාසැල් පෙල පොත් සෑම වසරකම මුද්‍රණය කිරීම වෙනුවට විෂය මාලා වෙනස් කරන තුරු ඒවා දීර්ඝකාලීනව භාවිතා කිරීමේ සංස්කෘතියක් ළමයින්ට හඳුන්වා දීම සහ එසේ ඉතිරිවන මුදලින් අමතර කියවීම් පොත් ලබා දීමට කටයුතු කිරීම. විශේෂ ව්‍යාපෘතියක් ලෙස පාසල් ආශ්‍රිතව දියුණු කියවීමේ සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා දියුණු පුස්තකාල පද්ධතියක්ද ගොඩනැඟිය යුතුය.

8.4 විවිධ විෂය ක්ෂේත්‍රවලට විශේෂිත වූ විවෘත විශ්ව විද්‍යාල ජාලයක් ආරම්භ කිරීම සහ ඒවායේ පාඨමාලා දැනට පවතින ප්‍රාදේශීය තාක්ෂණික ආයතන සහ විශ්ව විද්‍යාලවල අමතර පහසුකම් යොදා ගනිමින් ව්‍යාප්ත කිරීම. එම පාඨමාලා සහ විෂය නිර්දේශ සකස් කිරීමේදී පෞද්ගලික ආයතනවල මානව සම්පත් අවශ්‍යතාද සැලකිල්ලට ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය. ඊට අමතරව පුළුල් මහජන සංවාදයකට පසුව තෝරාගත් විෂය ක්ෂේත්‍ර සඳහා පමණක් පෞද්ගලික විශ්ව විද්‍යාල ආරම්භ කිරීමට අවසර ලබා දිය යුතු අතර ඒවායේ අධ්‍යාපන සහ තාක්ෂණික මට්ටම අවශ්‍ය ඉහළ මට්ටමින් පවත්වා ගැනීම සඳහා රජය මඟින් විශේෂ මැදිහත්වීමක් සහිත යාන්ත්‍රණයක් සහ ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. එමෙන්ම එම ආයතනවල ගාස්තු අය කිරීම්ද රජයේ පාලනයට යටත් කළ යුතු අතර අඩු ආදායම් සිසුන්ට ඒ සඳහා සහන පොලියට ණය ලබාදීමටද රජය මැදිහත් විය යුතුය. පෞද්ගලික විශ්ව විද්‍යාලවල ක්‍රියාකාරීත්වය නිසා රජයේ විශ්ව විද්‍යාල අඩාල වීම සිදු නොවීම සහතික කිරීම සඳහා නීතිමය සහ පරිපාලන ප්‍රතිපාදන ඇති කළ යුතුය. එසේම යුද්ධයෙන් පසුව ඇතිවූ නව තත්වය තුළ ශ්‍රී ලංකාවේ පදිංචි වීමට කැමති විශේෂඥ වෘත්තීය හැකියාව සහිත විදේශගත ශ්‍රී ලාංකිකයන් ගෙන්වා ගැනීම සඳහා පහසුකම් ඇති කළ යුතුය. ඒ සඳහා ද්විත්ව පුරවැසිකම නොමිලේ ප්‍රදානය කළ යුතු අතර වෘත්තීය ලියාපදිංචි වීමේ පහසුකම් ආදියද විධිමත් කළ යුතුය. උදාහරණයක් ලෙස වෛද්‍ය සංග්‍රහය සංශෝධනය කොට විශේෂඥ වෛද්‍යවරුන් සඳහා වෙනම රෙජිස්ටරයක් ආරම්භ කළ යුතුය.

8.5 සියලුම දේශීය සහ විදේශීය ආයෝජකයන් රජයෙන් බදු සහන ලබා ගැනීමේදී පූර්ව කොන්දේසියක් ලෙස මානව සම්පත් සංවර්ධන ඉලක්ක ප්‍රමාණයක් යම් පොදු නිර්ණායක මත රජය විසින් ලබා දීම. එහිදී, ලබා ගන්නා සහන ප්‍රමාණයට සාපේක්ෂව මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජනය කළ යුතු ප්‍රතිශතයන්ද නිර්ණය කළ යුතුය. ඒ සඳහා එම ආයතන විසින් දැනට පවතින අධ්‍යාපන ආයතන හරහා හඳුන්වාදෙන දීර්ඝකාලීන විධිමත් අධ්‍යාපන පාඨමාලා මෙන්ම අභ්‍යන්තරව හඳුන්වාදෙන කෙටිකාලීන පාඨමාලා, වැඩමුළු සහ ප්‍රායෝගික පුහුණුවද යොදා ගත හැක. එමෙන්ම විශේෂ වශයෙන් වතු ආශ්‍රිත ශ්‍රම බලකාය වඩාත් පුළුල් ක්ෂේත්‍රවල සේවා නියුක්තිය ලබාගත හැකි ශ්‍රම බලකායක් බවට

පත් කිරීම සඳහා ආයෝජකයින් එම ප්‍රදේශවලට යොමු කිරීම මුල් කොට ගෙන දිරි ගැන්වීම් ආරම්භ කළ යුතුය. එසේම එම ප්‍රදේශවල තාක්ෂණික පුහුණු ආයතන ව්‍යාප්ත කිරීම සඳහාද ප්‍රමුඛතාව ලබා දිය යුතුය.

**9.0 රටේ මූල්‍ය පාලනය පිළිබඳව මහජනතාවගේ විශ්වාසය නැවත දිනාගත හැකි වන ලෙස මූල්‍ය වෙළඳපොළ පද්ධතිය ශක්තිමත් කිරීම සහ ජාතික ආර්ථික අවශ්‍යතාවය අනුව එහි කාර්යක්ෂමතාව වැඩි කිරීම. ඒ සඳහා,**

9.1 පෞද්ගලික අංශයේ වංචා හා දූෂණ පිළිබඳව නීති මඟින් ක්‍රියා කිරීමට මහජනතාවට අවස්ථාව ලබා දීම සඳහා අල්ලස් හා දූෂණ පනත සංශෝධනය කොට පෞද්ගලික අංශයද ආවරණය කිරීම සහ බදු වංචා අවම කිරීම සහ සෙස් බදු අයථා ලෙස වෙනත් අංශ සඳහා යෙදවීම වැළැක්වීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇතිකිරීම. එහිදී වංචා දූෂණවලට ඉඩ ලැබෙන බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය සහිත වැට් බදු ක්‍රමය වෙනස් කොට සරල බදු ක්‍රමයක් හඳුන්වා දිය යුතු අතර යම් ක්ෂේත්‍රයක් සඳහා අය කෙරෙන සෙස් බදු අදාළ ක්ෂේත්‍රය සඳහා පමණක් භාවිතා කළ යුතුය.

9.2 විශේෂයෙන්ම බැංකු, කොටස් වෙළඳපොළ තැරැව්කරුවන්, රක්ෂණ ආයතන ඇතුළු වෙනත් සියලුම මූල්‍ය ආයතන ආවරණය වන ලෙස ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම. එමෙන්ම, එම ආචාරධර්ම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව, රක්ෂණ මණ්ඩලය, කොටස් වෙළඳපොළ කොමිසම සහ විගණන පාලක මණ්ඩලය ආදී සියළු ව්‍යවස්ථාපිත මූල්‍ය පාලන ආයතන ඇතුළත් වන ලෙස පරිපාලන යාන්ත්‍රණයක් සකස් කිරීම සහ එම යාන්ත්‍රණය හරහා එම කටයුතු පිළිබඳ සොයා බැලීමට මහජනයාට අවස්ථාව ලබා දීම. මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජනයාගේ විශ්වාසය බිඳවැටීම වළක්වා ගැනීම සඳහා මේ වන විට මහජනයාගේ දේශීය සහ විදේශීය ඉතුරුම් වංචාකාරී ලෙස අයුතු ප්‍රයෝජනයට යොදවන ලද සහ විනිමය පාලන නීති උල්ලංඝනය කළ මූල්‍ය ආයතනවල වගකිව යුතු ප්‍රධානීන් සියලු දෙනා හට අපරාධ නීතිය යටතේ කඩිනමින් දඬුවම් පැමිණවීම සහ ඔවුන්ගේ දේපළ විකිණීම මගින් එම තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා ක්‍රමවත් අධිකරණ සහ පරිපාලන ක්‍රියාකාරකම් ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීම

9.3 ණය කාඩ්පත්වලින් සහ ආනයන සඳහා නිකුත් කරනු ලබන ණයවර ලිපි හරහා රටින් පිටතට ගලා යන විදේශ විනිමය පිළිබඳව නිශ්චිත තොරතුරු ලබා ගැනීම සඳහා ඉතා සූක්ෂම සොයා බැලීමේ යාන්ත්‍රණයක් සියලු මූල්‍ය ආයතන ආවරණය වන ලෙස ස්ථාපිත කිරීම. තිරිඟුපිටි සහ කිරිපිටි ආනයනයේදී ණයවර ලිපි නිකුත් කිරීම පිළිබඳව නිරතුරුව සොයා බැලෙන විශේෂ යාන්ත්‍රණයක්ද හඳුන්වා දිය යුතුය. රටට විදේශ විනිමය ඉපැයීමට කටයුතු කරන රටවැසියන්ට තමා එසේ උපයන මුදල් රටේ ජනතාව සහ රජය වැය කරන ආකාරය දැන ගැනීමට ඇති අයිතියට ගරු කරමින් ඉහත සඳහන් තොරතුරු වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කිරීම. එසේම රේගු බදු, ආදායම් බදු සහ වැට් බදු ආදී සියලු බදු අය කිරීමේ ක්‍රියාවලිය එක් මූලස්ථානයකින් අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සහ එම තොරතුරු මහජනයාට ලබා ගැනීමට ඉඩ සැලසීම.

9.4 මූල්‍ය ආයතන පද්ධතිය සඳහා හඳුන්වා දෙනු ලබන ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝනය කරනු ලබන මූල්‍ය ආයතන අධ්‍යක්ෂවරුන් සහ විධායක නිලධාරීන් මෙන්ම පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ වංචා දූෂණ හෝ මූල්‍ය අක්‍රමිකතා මත උසාවි මඟින් වැරදිකරුවන්

බවට පත්වන අධ්‍යක්ෂවරුන් සහ විධායක නිලධාරීන් ලැයිස්තු ගත කිරීම මුල්කොට ගෙන මහබැංකුව මඟින් රෙජිස්ටරයක් පවත්වාගෙන යාම සහ ඒ සඳහා ලේකම් කාර්යාලයක් ආරම්භ කිරීම. එසේම, ඒ ආකාරයට ලැයිස්තුගත වන පුද්ගලයන්ට පෞද්ගලික මූල්‍ය ආයතනවල හෝ රජයේ ආයතනවල වගකීම් ඉසිලීමට ඉඩ ලබා නොදීම සඳහා පරිපාලන යාන්ත්‍රණයක් මෙන්ම අවශ්‍ය වුවහොත් නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දීම සහ එසේ කළු ලැයිස්තුවට ඇතුලුවන පුද්ගලයන් පිළිබඳ විස්තර මහජනයාට ලබා දීම.

9.5 සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාවසායකයින්, ගොවීන් සහ ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සැබෑ දායකත්වය ජාතික ආර්ථිකයට ලබා ගැනීමට ඇති ප්‍රධානතම බාධකය වන කුඩා ආයෝජන සඳහා ලබා ගන්නා ණය සඳහා අධික පොලියක් ගෙවීමට සිදුවීමේ ගැටළුව විසඳීම සඳහා රාජ්‍ය බැංකු පද්ධතිය යොදා ගත නොහැකි නම් ද්විත්ව බැංකු පද්ධතියක් ගොඩනැඟීම මඟින් සුළු සහ මධ්‍ය පරිමාණ ණය සඳහා විශේෂිත වූ උප බැංකු පද්ධතියක් ගොඩ නැඟීම. එම බැංකු පද්ධතිය තුළ පරිපාලන පිරිවැය අවම කරමින් සහ රාජ්‍ය සහනාධාර යටතේ සහන පොලියට ණය ලබා දිය හැකි බැංකු සංස්කෘතියක් ගොඩ නැඟිය යුතුය. එහිදී ප්‍රධාන වශයෙන් ඉතා අවම අවදානමක් සහිත ණය දීමේ ක්‍රමය වන රන් උගස් සේවාව සඳහා සාමාන්‍ය ඉතිරිකිරීම් ගිණුමක පොලියට වඩා 2% පොලියක් පමණක් අයකිරීම සඳහා කටයුතු කළ යුතුය. එසේම දැනට ඉතා ඉහළම ණය ආපසු ගෙවීමේ ප්‍රතිශතය සහිත කෘෂි/ගොවිජන බැංකුවට රජය මඟින් ප්‍රාග්ධනය සහ පොලී සහනාධාර ලබා දීම මඟින් ගොවීන්ට ඉතා සහන පොලියට ණය ලබා දීම. ඒ සඳහා අවශ්‍ය අරමුදල් දැනට ලබා දෙන පොහොර සහනාධාරය යම් ප්‍රතිශතයකින් අඩු කිරීම මඟින් උපයා ගැනීම.

**10 ජාතිය සතු විශ්මිත ස්වාභාවික සම්පත්වලින් සහ සම්ප්‍රදායානුකූල දැනුම් පද්ධතිය ආශ්‍රිතව පරිසර හිතවාදී ලෙස උපරිම ආර්ථික ප්‍රයෝජන ලබා ගැනීම සහ එම සම්පත් ශ්‍රද්ධානවන්තව භාවිතා කිරීමට සහ ඒවාට ගරු කොට ආරක්ෂා කිරීමට සඳහා මහජනයා පෙළඹවීම.**

10.1 සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා ලෝකය පුරා වයස්ගත වූවන් මුහුණ දෙන සෞඛ්‍ය ගැටළුවලට අප රටේ දේශීය වෛද්‍ය ක්‍රමය සතු ප්‍රබල ප්‍රතිකාර ක්‍රමවල වාසිය යොදා ගනිමින් දේශීය වෛද්‍ය සභාවේ පාලනයට යටත් කළ ජාතික මට්ටමේ වාණිජ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. ඒ සඳහා රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීමට රජය මැදිහත් විය යුතුය. ඊට අමතරව සංචාරක කර්මාන්තය විදේශ රටවල ප්‍රචාරය කිරීමේදී අප රටේ ඓතිහාසික උරුමය, දේශීය වෛද්‍ය ක්‍රමයේ ප්‍රබලත්වය, ජෛව විවිධත්වය සහ භූගෝලීය සහ දේශගුණික විෂමතාවයන්ගේ වාසිය යොදා ගැනීම සඳහා සංචාරක කර්මාන්තයට ආදාළ සියළු ආයතනවලට මඟ පෙන්විය යුතුය.

10.2 දේශීය වෛද්‍ය ප්‍රතිකාරවල සහ ඖෂධවල ප්‍රතිඵලදායකත්වය පිළිබඳ පුළුල් විශ්වාසනීයත්වයක් සහිතව ජාතික මට්ටමින් පර්යේෂණ කිරීම සඳහා රාජ්‍ය සහ දේශීය ස්වෙච්ඡා සංවිධාන මෙන්ම වෘත්තික ආයතන දිරිමත් කිරීම සඳහා රජය විසින් ජාතික පර්යේෂණ අරමුදලින් යම් ප්‍රතිශතයක් වෙන් කිරීම. ඒ සඳහා පිළිගත්, දේශීය සහ බටහිර වෛද්‍යවරු ඒකාබද්ධව කටයුතු කරන ආයතනයක් සහ යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. එම පර්යේෂණ ප්‍රතිඵල මත දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම සහ ඖෂධ දේශීයව සහ විදේශීයව වාණිජ වශයෙන් ප්‍රචලිත කිරීමට රජය මැදිහත් විය යුතුය. දේශීය ඖෂධ, ප්‍රතිකාර ක්‍රම සහ ආහාර ප්‍රචලිත කිරීම සඳහා ඒවා ඇගයීමට ලක් වන විෂය කරුණු පාසල් පෙළපොත්වලට ඇතුළු කළ යුතුය.

10.3 දේශීය වෛද්‍ය ක්‍රමය ආශ්‍රිතව ඖෂධ සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය සහ ඖෂධමය ආහාර නිපදවීම සඳහා ඉදිරිපත් වන දේශීය සමාගම් දිරිමත් කිරීම සඳහා ණය පොලී සහනාධාර සහ ආදායම් බදු සහන ලබා දීම සඳහා රජය මැදිහත් වීම. එමෙන්ම, තේ, පොල්තෙල්, ගොරකා, කුරුඳු වැනි දේශීය නිෂ්පාදනවල ඖෂධමය ගුණය පිළිබඳව සිදු කෙරෙන පර්යේෂණ දිරිමත් කිරීම සඳහා ඒ ආශ්‍රිත අපනයන බදුවලින් ප්‍රතිශතයක් වැය කිරීම සහ එම සොයාගැනීම් භාවිතා කරමින් සිදු කරන නවතම අලෙවිකරණ වැඩසටහන් හරහා එම නිෂ්පාදනවලට විදේශීය වෙළඳපොළ තුළ ඉහළ මිලක් ලබා ගැනීම සඳහා තානාපති අංශ හරහා සහය ලබා දීමේ විශේෂ ක්‍රමවේදයක් ඇති කිරීම.

10.4 පුල්මුඩේ ඛනිජ වැලි සම්පත සහ එප්පාවල පොස්පේට් සම්පත ආශ්‍රිතව දේශීය ප්‍රාග්ධනය යොදා ගනිමින් උපරිම වටිනාකම් එකතු කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම. ඒ සඳහා විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ආයෝජන සහ දේශීය පෞද්ගලික ආයතනවල ආයෝජන දිරිගැන්වීම සඳහා, ඔවුන්ගේ ආයෝජනවලට ආරක්ෂාව සහතික කෙරෙන රජයේ පාලන කොටස් සහිත සමාගම් දෙකක් පිහිටුවීම. එමෙන්ම අනාගතයේදී ඛනිජතෙල් කැණීම් පුළුල් ලෙස ආරම්භ කිරීම සහ ඛනිජ තෙල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන කර්මාන්ත ජාලයක් ආරම්භ කිරීම සඳහා රජයට බහුතර කොටස් සහිත රාජ්‍ය සමාගමක් පිහිටුවිය යුතුය. ඒ සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය වර්ධනය කිරීම සඳහා විදේශ ණය ලබා ගැනීමේ වරදක් නැත. එමෙන්ම ඊට අවශ්‍ය තාක්ෂණය සහ තාක්ෂණික පිරිස් බලය විදේශ රටවලින් කුලියට ගැනීමේ වරදක්ද නැත. (වරද සිදුවනුයේ සමස්තය විදේශීය සමාගම්වලට පවරා දීම තුළය.)

10.5 මිනිසාට ආහාරයට ගත හැකි ධාන්‍ය යොදා ගනිමින් සකස් කරන සාන්ද්‍ර සත්ව ආහාර භාවිතය අවම කරමින් සත්ව පාලනය දිරි ගැන්වීම සඳහා පරිසර හිතවාදී සත්ව පාලන ක්‍රමවේද හඳුන්වා දීම. ඒ සඳහා සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය හරහා උපදේශන, තාක්ෂණික සහ මූල්‍යමය සහාය ලබා දිය යුතුය. විශේෂයෙන්ම ගෘහ ආශ්‍රිතව කුඩා පරිමාණ දේශීය කුකුළු පාලනය දිරිගැන්වීම සඳහා දේශීය පැටව් සපයන ආයතන සහ කෘෂි අපද්‍රව්‍ය සහ ආර්ථිකව ප්‍රයෝජනයට නොගන්නා ශාක කොටස්, පිදුරු ආදිය භාවිතා කරමින් කල් තබා ගත හැකි ගව ආහාර නිපදවන කුඩා සහ මධ්‍යම පරිමාණ ආයතන සඳහා රජය අනුග්‍රහය ලබා දිය යුතුය. ඒ යටතේ එවැනි ආයතන සඳහා ඉඩම් සහ සහන පොලී ණය ලබා දීමටද රජය කටයුතු කළ යුතුය. (පරිසර හිතවාදී කිරිගව පාලනයේදී ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ සාන්ද්‍ර ආහාර ලබාදීමකින් තොරව උපරිම කිරි ප්‍රමාණය ලබා ගත හැකි දේශීය කිරි දෙනුන් ප්‍රචලිත කිරීම සඳහාය.)

# < 6 >
# විශේෂ යෝජනාව

## උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල කෘෂිකර්මාන්තය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය මුල්කොටගත් කඩිනම් සංවර්ධන මෙහෙයුමක සුවිශේෂී අවශ්‍යතාව

උතුරු සහ නැගෙනහිර පළාත්වල පොදුවේ ජාතික සංවර්ධන උපායමාර්ගයෙන් වියුක්ත වූ සංවර්ධන මෙහෙයුමක අවශ්‍යතාවක් තිබිය නොහැක. නමුත් ඒ පළාත්වල වසර 30ක කාලයක් තිස්සේ පැවතුනු සමාජ ආර්ථික පසුබෑම යථා තත්වයට පත්කිරීමට නම් ජාතික උපායමාර්ගික ප්‍රවේශය තුළම කඩිනම් හෙවත් කාර්යක්ෂම ව්‍යාපෘති සහ වැඩසටහන් කළමනාකරණ ව්‍යුහයන්, ක්‍රමවේද සහ සංස්කෘතියක් හඳුන්වාදිය යුතුව ඇත. එම ක්‍රියාවලියට රටේ සමස්ත ජනතාවගේ ආශීර්වාදය සහ සක්‍රිය දායකත්වය හිමි විය යුතුය. සැබෑ ජාතික ඒකාග්‍රතාව ගොඩනැගිය හැක්කේ සද්භාවයෙන් ක්‍රියාත්මක කෙරෙන එවැනි දැවැන්ත මෙහෙයුමක් තුළිනි. නමුත් සැබෑ ලෙසම එවැනි ආර්ථික වැඩපිළිවෙළක් සාර්ථක වන්නේ ඊට සමගාමීව එම පළාත්වල සංස්කෘතික සහ අධ්‍යාපනික ප්‍රබෝධයකටද මඟපෙන්වීමක් සිදුවන්නේ නම් පමණි. එහිදී, බිඳවැටී ඇති සියලු ආගම්වලට අයත් පූජනීය ස්ථාන මෙන්ම සම්ප්‍රදායානුකූල අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රස්ථාන යළි ගොඩනැගීමට ප්‍රමුඛස්ථානයක් හිමි විය යුතුය. ඊට අමතරව මහජනයා ක්‍රියාකාරී ලෙස ජාතික ආර්ථිකයට දායක කර ගැනීම සහ ඔවුන් අතර සමගිය ගොඩනැගීම සඳහා නිෂ්පාදන සමුපකාර ප්‍රධාන උපාංගයක් ලෙස භාවිතා කළ යුතුය. තවද නැවත පදිංචි කිරීමේදී තාවකාලික හෝ අන්තර්කාලීන කඳවුරුවල මහජනයාට ගත කිරීමට සිදුවන කාලය හැකිතාක් අවම කළ හැකි නම් එසේ කිරීම මූලික ප්‍රතිපත්තියක් විය යුතුය. ඒ අනුව මහජනයා තමාගේ මුල් භූමියට හෝ නව භූමිවලට (තනිව හෝ සමුපකාර පදනම යටතේ) යොමුකොට ඔවුන් තමාගේම පෞද්ගලික ආර්ථික ජීවිතය හැකි ඉක්මනින් ඇරඹීම සඳහා දිරිමත් කළ යුතු වේ.

## ඒ සඳහා වන යෝජනා

I. උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා වෙන වෙනම වසර 5ක කාලයක් සඳහා ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් සංවර්ධන අධිකාරියක් සහ නැගෙනහිර පළාත් සංවර්ධන අධිකාරියක් පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවීම. මෙම සංවර්ධන අධිකාරිය සඳහා මහජනයාට වගවීමේ යාන්ත්‍රණය සහිත උපදේශන මණ්ඩල පිහිටුවිය යුතු අතර ඒවාට පාර්ලිමේන්තුව නියෝජනය වන සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයන් සහ රටේ පිළිගැනීමක් සහිත ස්වාධීන විද්වතුන් පත් කළ යුතුය. එම අධිකාරිය සඳහා පොදු අරමුදල් පිහිටුවිය යුතු අතර ඒවාට මහජනයා ස්වෙච්ඡාවෙන් ලබා දෙන අරමුදල් මෙන්ම යම් බදු පැනවීමකින් ලබා ගන්නා අරමුදල්ද යෙදවිය යුතුය. එම සංවර්ධන අධිකාරිවලට විදේශීය රටවලින් ණය ලබා ගැනීමේ බලයද ලබා දිය යුතුය. මෙම අධිකාරිවලට වසර 05ක සැලසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම, කර්මාන්ත, මහාමාර්ග, පශු සම්පත්, වාරිමාර්ග, වරාය, නාගරික සංවර්ධන, ප්‍රවාහන යන අමාත්‍යාංශවලට

අයත් බලතල එම පළාත්වලට අදාළ නිශ්චිත සැලසුමකට අනුව පැවරිය යුතු අතර වසර 05කට පසුව අධිකාරිය අහෝසි විය යුතු අතර වගකීම් නැවත පැවරීම සිදු විය යුතුය. ඊට අමතරව සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශවල සම්බන්ධීකරණ වගකීම් (ඒකාබද්ධ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා) පැවරිය යුතු අතර ඉඩම් පරිහරණය පිළිබඳව අදාළ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කොට අවසර ලබා ගැනීමේ බලයද ලබා දිය යුතුය.

II. උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා ඒකාබද්ධව ක්‍රියාත්මක වන සංවර්ධන ණය බැංකුවක් පිහිටුවීමේ බලතලද මෙම අධිකාරියට ලබා දිය යුතු අතර එම බැංකුව පවතින රාජ්‍ය ආයතන ව්‍යුහයක් (උදා ඃ- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව) හරහා ක්‍රියාත්මක විය යුතුය. එම ආයතනයට විශේෂ වූ ගොඩනැගිලි සඳහා හෝ ඒ සඳහා වෙන්වූ සේවක පිරිස් සඳහා පිරිවැයක් නොතිබිය යුතුය. රාජ්‍ය බැංකුවක් සහ මහ බැංකුව මඟින් මෙම සංවර්ධන බැංකුවේ (සංවර්ධන බැංකුවට පිරිවැයක් නොමැතිව) අධීක්ෂණය සිදු විය යුතුය. එම ණය මුදල් සඳහා සුවිශේෂී පොලී සහනාධාර ලබා දිය යුතු අතර ප්‍රාග්ධනය රජය මඟින් ලබා දිය යුතුය. රන් උගස් සේවාව මඟින් පොලියට ණය ලබා දීමේදී පොලිය තවදුරටත් අඩු කළ යුතුය. මෙම ණය මුදල් ලබා දීමේදී කණ්ඩායම් ඇපවීමේ ක්‍රමය භාවිතා කළ යුතු අතර ණය ලබා දිය යුත්තේ නිශ්චිත කෘෂිකාර්මික හෝ වෙනත් ස්වයං රැකියා ව්‍යාපෘතිවලට අදාළවය.

III. නැවත පදංචි කිරීමේ සමස්ත ක්‍රියාවලිය හමුදාවල සහාය ඇතිව සංවර්ධන අධිකාරී මඟින්ම සිදු කළ යුතුය. අවතැන් වූ ජනයා දිවයිනේ වෙනත් ප්‍රදේශවල තාවකාලිකව පදිංචියට ගොස් නැවත තම ගම්බිම්වල පදංචිවීමට කැමති නම්, ඔවුනට ඒ සඳහා අවශ්‍ය මූලික මූල්‍ය පහසුකම් යම් උපරිම පිරිවැය සීමාවකට යටත්ව ලබා දිය යුතුය. උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි වන ජනතාවට තම ආර්ථික ක්‍රියාවලිය ඉතාම කෙටි කලකින් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පහසුකම් සහනාධාර ලෙස සැපයීම කළ යුතු අතර යම් කාලයකට ආහාර සලාකයක් ලබා දිය යුතුය. තරුණ තරුණියන්ට නව බිම් අස්වැද්දවීම සඳහා ඉඩකඩ සලසා දිය යුතු අතර ඒ සඳහා තරුණ සමූපකාර පිහිටුවීම මඟින් පොදු අයිතියට යටත්ව සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉඩම් ලබා දිය යුතුය. සමුපකාර යටතේ පුහුණු වන තරුණ තරුණියන්ට මාස 06ක කාලයක් සඳහා විශේෂ ජීවනාධාරයක් ලබා දිය යුතුය.

IV. එමෙන්ම දැනට අභාවයට ගොස් ඇති රජයට අයත් ගොවිපොළ (උදා ඃ- තින්නවේලි, කිලිනොච්චි, සිංහපුර, කරදියන් ආරු, මුරුක්කන්, පරන්තන්, අල්ල) සංවර්ධන අධිකාරියට යටතේ සංවර්ධනය කළ යුතු අතර අතිරික්ත භූමිය තරුණ සමූපකාර සමිතිවලට ලබා දිය යුතුය. එම ගොවිපොළ ආශ්‍රිතව විශේෂයෙන්ම බීජ නිෂ්පාදනය කිරීමේ විභවය පවතින අතර එය දියුණු කළ යුතුය. භූමියෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමේදී සත්ව පාලනය දියුණු කිරීම සඳහා සහ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා න්‍යාය පත්‍රයේ ප්‍රමුඛස්ථානය හිමි විය යුතුය. උදා ඃ- කන්තලේ සීනි කර්මාන්ත ශාලාව ආශ්‍රිතව සීනි නිපදවීම, එතනෝල් නිපදවීම, සත්ව ආහාර නිපදවීම, කිරි මිලදී ගැනීම සහ කිරි සකස් කිරීමේ කර්මාන්ත ඇතුළුව කර්මාන්ත පද්ධතියක් මඟින් ප්‍රදේශයේ සුළු ගොවීන්ට විශාල අවස්ථාවක් නිර්මාණය කළ හැක. ඒ සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම සහ අවශ්‍ය වේ නම් සෘජුව විදේශ ආයෝජන සඳහා සාකච්ඡා කිරීමද සංවර්ධන අධිකාරියේ වගකීමකි. සංවර්ධන අධිකාරිය ප්‍රදේශයේ වෙළඳපොළ යාන්ත්‍රණවල කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහාද මැදිහත් විය යුතුය.

V. සංවර්ධන අධිකාරිය මඟින් සෘජුව ශ්‍රම බලකාය යොදවමින් මාර්ග සහ වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපරිම උත්සාහය දැරිය යුතුය. එහිදී වාහන සැපයීම, ශ්‍රම බලකාය

සැපයීම සහ ද්‍රව්‍ය සැපයීම සඳහා උප කොන්ත්‍රාත් ලබා දිය යුත්තේ එම ප්‍රදේශ වල වාසය කරන සුළු ව්‍යාපාරිකයන්ට මෙන්ම පළාත් පාලන ආයතන, ස්වෙච්ඡා සංවිධාන සහ රාජ්‍ය ආයතන හෝ සමූපකාරවලට පමණි. මහා පරිමාණ ව්‍යාපෘතිවලට අදාල උප කොන්ත්‍රාත් සංවර්ධන අධිකාරියේ මඟ පෙන්වීම යටතේ ප්‍රදේශයේ ස්ථිර පදංචිකරුවන්ට ලබා දීම සඳහා ප්‍රමුඛතාවය දිය යුතුය. ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍යමය සහන ලබා දීමට සංවර්ධන අධිකාරිය මැදිහත් විය යුතුය. ඊට අමතරව සියලු සංවර්ධන ව්‍යාපෘති සඳහා යුද හමුදා ශ්‍රම බලකාය උපරිම ලෙස යොදා ගත යුතුය.

VI. සංවර්ධන ව්‍යාපෘතිවලදී ප්‍රදේශයේ පළාත් පාලන ආයතන සහ ස්වෙච්ඡා සංවිධාන හැකි උපරිම ලෙස දායක කර ගැනීම සඳහා (විශේෂයෙන් උප කොන්ත්‍රාත් ලබා දීම මඟින්) කටයුතු කළ යුතු අතර ඒ සඳහා එම ආයතනවලට අවශ්‍ය තාක්ෂණික සහ පරිපාලන දැනුම ලබා දීම සඳහාද යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. සංවර්ධනය සඳහා මහජන අදහස් සහ දායකත්වය ලබා ගැනීම සිදු විය යුත්තේ මූලික වශයෙන් පළාත් පාලන ආයතන මඟිනි. ඇත්ත වශයෙන්ම මහජනයා සහ සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරන ආයතන ව්‍යුහය ලෙස සැලකිය යුත්තේ පළාත් පාලන ආයතනය.

VII. කඩිනම් සංවර්ධන මෙහෙයුමේ ප්‍රමුඛතාව හිමිවිය යුත්තේ මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනයට වඩා හැකි ඉක්මනින් පොදු ජනයා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආර්ථිකයට ඵලදායී ලෙස දායක වීමට ඉඩ කඩ සැලසීම සඳහාය. මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘතිවල සහ වෙනත් සේවා ව්‍යාපෘතිවල ප්‍රතිලාභ සැබෑ ලෙසම මහජනයාට ලැබෙන්නේ බහුතරයකට ඵලදායී ලෙස ආර්ථිකයට දායක වීමට ඉඩ ප්‍රස්ථා සැලසෙන්නේ නම් පමණි. හුදු නගර ආශ්‍රිත වෙළඳාම දියුණු කිරීම මඟින් පමණක් බහුතරයක් ජනතාවගේ ජීවන තත්වය උසස් මට්ටමට ගෙන ඒමට නොහැකි බව පිළිගනිමින් යටිතල පහසුකම්වල ප්‍රමුඛතාව තීරණය කළ යුතුය. ප්‍රදේශයේ සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් ලෙස හඳුනාගත හැක්කේ මහාමාර්ග, වාරිමාර්ග හෝ සන්නිවේදන සේවා පමණක් නොවේ. කෘෂි කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සැපයීම මඟින් කර්මාන්ත ඇරඹීම සඳහා ව්‍යවසායකයින්ට විශාල ඉඩ ප්‍රස්ථා නිර්මාණය වේ. ඒ සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය රජය, පෞද්ගලික අංශය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ කොටස් ආයෝජනය හෝ සමූපකාර හරහා ගොවීන්ගේ ආයෝජන ලෙස ලබා ගත හැක. එහිදී උදාහරණ ලෙස සහල් සහ සහල් පිටි සැකසුම් කර්මාන්ත හරහා ගොවියාට වී සඳහා ඉහළ මිලක් ලැබේ. එමෙන්ම කිරි සැකසුම් කර්මාන්ත හරහා කිරි ගොවියාට ඉහළ මිලක් ලබා ගැනීමේ අවස්ථාව උදා වේ. මේ සියල්ලේ සංකලනයක් ලෙස පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම මඟින් තවත් සුළු සේවා සැපයුම් ආයතන රාශියකට ඉඩ ප්‍රස්ථා විවර වේ. **(එම තත්වය තුළ විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලදී යටිතල පහසුකම් සංකල්පයට නව අර්ථකථනයක් සපයමින් එය කෘෂිකර්මාන්තයේ නියැලෙන බහුතරයක් ජනතාවට වැඩි ආර්ථික ඉඩ ප්‍රස්ථා ලැබෙන කෘෂි සංවර්ධනය සහ ඒ ආශ්‍රිත වෙළඳපොළ සහ කර්මාන්ත පද්ධතිය දියුණු කිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සහ දිරිගැන්වීම් ලබාදීම් ලෙස හැඳින්විය යුතුව ඇත.)** සම්ප්‍රදායානුකූල යටිතල පහසුකම් ලෙස හැඳින්වෙන මහා මාර්ග හා දුම්රිය මාර්ග ව්‍යාපෘති අතුරින් ඉහළ ප්‍රමුඛතාව හිමිවිය යුත්තේ දුම්රිය සංවර්ධන ව්‍යාපෘතියටය. යෝජිත ''උතුරු මිතුරු'' දුම්රිය සංවර්ධනයද උතුරු සහ නැගෙනහිර සංවර්ධන අධිකාරියට පැවරීම කාලෝචිත වේ. ඊට අමතරව නාගරික සංවර්ධන ව්‍යාපෘතිද, දුම්රිය සේවය පාදක කරගනිමින් සැලසුම් කළ යුතු අතර ඒ මඟින් සංවර්ධන අධිකාරියට ආදායම් ඉපයීම අරමුණු කළ යුතුය.